සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

26 වෙනි කලාපය

ශ්‍රී බු. ව. 2557ක් වූ උඳුවප් මස (ව්‍යවහාරික වර්ෂ 2013 දෙසැම්බර්)

## ද්‍රව්‍ය පදාර්ථ ඥානයට හසුවන විවිධ ශාක වර්ගවල සැඟව ගිය ඖෂධ ශක්තීන්...



රු. 20/-

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

# වටිනාකම...



වටිනා ලෙසට මිනිසුන් තැන දෙන ඒවා
හිටි හැටියේම වැනසෙයි ඇස් දෙක ගාවා
වැටි වැටි ඇවිද්දත් තව පසු පසු මේවා
හැටියකි ලොවේ පොදු දම් එක ලෙස වූවා






නෙක නෙක මිම්වලින් වටිනාකම් දීම
එක දෙක ආදි ලෙස හැඳුනුම්කම් පෑම
රැක ගෙන හිටිනමුත් තම පණ නල සේම
දැක දැක නැසෙන විට ඉවසන්නද කෝම





මුලදී තිබුණු වටිනාකම පසු කාලේ
මළ දා නොමැත පා දූවිල්ලක තාලේ
හොලවා ලොවක් ඩැහැ ගන්නට කළ ආලේ
වළකා ඇත කලෙක ලෝ දම් එන වේලේ






යමක් ඇති විටදී තමනට වැජඹෙන්න
පෙමක් හට ගනියි එය ලොකු කර ගන්න
නමක් සමග අගයක් ගෙන රඟ දෙන්න
නිමක් නැති සසරෙ මොනවද දැන ඉන්න






දිළින්දා රජින්දා ලෙස අගය නැත
කලින් කල ගිහින් අවසානයට යත
මලින් ගඳින් ගෙන හිටියත් දිරන ගත
කෙලින්නට සුදුසු නැති බව දැකිය යුත



රිසි ලෙස නැති විටදී වටිනාකමක් නැති
ඇසි පිය ගහන මොහොතකදීත් වෙනස් වෙති
කිසි කල නොදිරනා දම් නියමයක් ඇති
නිසි නැති බව හඳුනතොත් නිදහසක් එති



ටික කලකට ලැබුව සසරෙහි නවා තැනේ
මොකටද වටිනකම් මළ විට එදා දිනේ
දුක එන විටදී නැතිමුත් එය කියා අනේ
නිකමට සිහි කළත් බුදු බණ සුවේ දැනේ






පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

6 වන කොටස



එදා පදුමුත්තර බුදු පියාණන් වහන්සේ වැඩ ඉන්න කාලෙ පටාචාරා තෙරණිය මහ ධනය ඇති සිටු කුලයක උපන් කුල කුමරියක්. උන්වහන්සේ දේශනා කරපු ධර්මය අහල ඇය ඉතාමත් පැහැදීමෙන් හිටියෙ. ඒ අතරතුර උන්වහන්සේ එක්තරා භික්ෂුණින් වහන්සේ නමකට අග තනතුරක් පිරිනැමුවා. ඒ තමයි විනය අතින් අග්‍ර කියන තනතුර. එදා කුල කුමරියක් වෙලා හිටපු පටාචාරාවත් මේ සිද්ධිය නිසා ඉතාමත් පැහැදීමෙන්, මතු බුදු සසුනක ඒ තනතුර පැතුවා. එතැන් පටන් දවස් හතක් පදුමුත්තර බුදුපියාණන් වහන්සේට දන් දුන්නා, සිවුරු පිරිකර පූජා කළා. අටවැනි දිනයෙදි තමන් තුල තිබිච්ච ඒ පැතුම බුදුපියාණන් වහන්සේ ඉදිරියේ කියා සිටියා.

අපි දැන ගන්න ඕන විශේෂ දෙයක් මෙතන තියෙනවා. ඒ තමයි පැතුමක් පතන විදිහ. පැතුම යහපත් එකක් නම් ඒක ඒකාන්තයෙන්ම ඉෂ්ඨ වෙන ක්‍රමයක් ගැන, මේ කරුණ තව දුරටත් විග්‍රහ කිරීමෙන් තෝරගන්න පුළුවන්. පැතුම පතන්න කලින් ඉෂ්ඨ කරපු කාරණාව බලන්න. ලෝක සම්මතයෙන් ගත්තම ඇය ලොකු පිනක් කරගත්තෙ. බුද්ධ සාසනය වෙනුවෙන් කරපු මහා පිනක්. පිනක් කරලයි ප්‍රාර්ථනාව කළේ. අපදාන පාලිය ඇසුරින් මින් පෙර ඉදිරිපත් කරපු ලිපි සියල්ලේම මේ කාරණාව පොදුයි. පැතුමක් පැතුවා, හැබැයි ඊට කලින් මහ පිනක් කරගත්තා. වැදගත් යමක් ගන්න පුළුවන් කාරණයක් මෙතන තියෙනවා. ඒ තමයි යහපත් බලාපොරොත්තුවකින් පැතුමක් පතන්න කලින් පිනක් කරගන්න කියන උපදෙස. ඒ වගේම ඒක උතුම් මංගල කාරණයක්. ඒ කිව්වෙ මහා මංගල සූත්‍රයේ එන ''පුබ්බේ ච කත පුඤ්ඤතා'' කියන කාරණය. සරල සිංහල තේරුම තමයි ''පෙර කළ පින් ඇති බව''.

පරිවර්තනයේ කිසි වැරැද්දක් නෑ. නමුත් ''පෙර කළ පින්'' කිව්වම කෙලින්ම මනසට එන්නෙ මීට පෙර අත්බැව්වල කරපු පින් ගැන. ඉතින්, අනේ අපිට පෙර කරපු පින් නැනෙ ! අපි කොහොමද එහෙම පැතුමක් පතන්නෙ කියල මෙහෙම හිතල පසුබහිනවා. මේ කාරණය උදාහරණයකින් පැහැදිලි කර ගමු. දැන් වෙලාව දවල් 12යි. ගුවන් විදුලි යන්ත්‍රය දාගෙන ඉන්නෙ ප්‍රවෘත්ති අහන්න. දැන් පැයකට පමණ පෙර රාජ්‍ය නායකයො ලංකාවට සැපත් වුනා කියල ප්‍රවෘත්තියක් යනවා. පැයකට පමණ පෙර කියල ගත්තම වෙලාව පෙරවරු 11 යි. එතකොට ''පෙර'' කියන වචනය, දැන් වෙලාවට පැයකට කලින් වෙච්ච සිද්ධියකටත් කියනවා. ඉතින් ඒ උපමාව අනුව බැලුවම ''පෙර කළ පින් ඇති බව'' කියන කාරණය තෝරගන්න පුළුවන්. ඒකට පෙර ඇත්බැව වගේ ඈතට යන්න උවමනා නෑ. පෙර කිව්වම දැන් මොහොතකට කලින් මොහොතත් ගන්න පුළුවන්. එතකොට මේ පුරුද්ද පැරැන්නන් ළඟ තිබුණා. ඒ නිසා ඒ අය යහපත් වැඩක් කරන්න කලින් පිනක් කළා. පිළිම වහන්සේට පහනක් හරි දල්වල තමයි වැඩේ පටන් ගත්තෙ. එහෙම නැත්නම් අඩු තරමෙ බුදුන් වහන්සේ සිහි කරල නමෝ බුද්ධාය කියල තමයි වැඩක් පටන් ගත්තෙ. මේ සේරම ඒ මොහොතට කලින් කරපු පින්. ඒවත් පෙර පින්වලට අයිතියි. එහෙම **පිනක් කරල පතන පැතුමක් විපාක දෙන්න හේතු යෙදෙනවා.**

ඉතින් පටාචාරාව අර විදිහට පදුමුත්තර බුදුන් වහන්සේ ඉදිරියේ කරපු ප්‍රාර්ථනාව, අනාගතයේ සාර්ථක වෙන හැටි උන්වහන්සේගෙ අනුමෝදනාවෙන් පැහැදිලි කළා. එතැන් පටන් ලැබෙන දිව්‍ය සැප සම්පත්, මනුස්ස සැප සම්පත් අවසානයේ පටාචාරාව නමින්, බුදු සසුනක විනයට අග්‍ර ශ්‍රාවිකාව හැටියට පිදුම් ලබන හැටි මහ අනුමෝදනාවක් වශයෙන් අනාගත වාක්‍යයකින් දේශනා කළා. මේක පොදුවේ බුද්ධ සාසනයේ ශ්‍රාවක පාරමිතාවක් පුරන උතුමෙක් හෝ උත්තමාවියක් සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ නමක් විසින් සිදු කරන දේශනාවක්. ඒක කරන්නෙත් ලෝකානුකම්පාවෙන්මයි. මොකද ඒක අහන් ඉන්න අය සතුටු වුනාම ඒ අයටත් කවදහරි ගැලවීමක් ලැබෙන නිසා.

දැන් මේ කියන්න යන්නෙ පටාචාරාවගෙ අවසන් අත්බැවේ සිදු වෙච්ච, දැනටමත් මේ පින්වතුන් දන්න පොදු සිදුවීමක්. ඇය සිටු කුලයක ඉපදිලා ඒ සිටු මැදුරේම වැඩට හිටපු සේවකයෙක් එක්ක පැනල ගියා. ඇත්තටම සසර මේ තරම් බියකරුයි කියල වැටහෙන්නෙ මේ වගේ සිදුවීම් දැක්කම. පුහුදුන් මනසක් ඇති කෙනෙක් ගන්න තීරණවල හැටි, ඒ අය ක්‍රියා කරන හැටි හරි පුදුමයි. දැන් මේ පැනල ගියේ, කල්ප ලක්ෂයක් තිස්සෙ බුද්ධ සාසනයක විනයට අග්‍ර මහා ශ්‍රාවිකාවක් වෙන්න පාරමිතාවක් පුරපු කෙනෙක් නේද, මෙහෙම කාම සංකල්ප ඇති වෙන්න පුළුවන්ද කියල පුදුම හිතෙනවා. කාමය ඒ තරම්ම භයානකයි කියල හිතෙන්නෙ ඒ නිසා. ඇය මහා ☞

දුකකට පත්වෙන්න මූලික අඩිතාලම වැටුනෙ එතැන් පටන්. කාමය කියන්නෙ සුවයක් මිසක් දුකක් ගෙන දෙන දෙයක් නෙවෙයි කියල බැලූ බැල්මට පේනවා. අනේ මට මේ මනුස්සයත් එක්ක ගිහින් කොච්චර හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන්ද, මේ සිටු මැදුරෙ සැපට වඩා මගෙ රත් කඳ ළඟ ඉන්න තියෙන සැප කොච්චර වටිනවද කියල මුලාවෙන් ගත්ත තීරණයක්. ඉතින් එහෙම ගියා කියල ඇයට සැපක් ලැබුනද ? සිටු මැදුරෙ තිබුන සැප වගේ දශමයක්වත් ඇයට ලැබුනද? ඒ කිසිවක් ඇයට ලැබුනෙ නෑ. තමන්ගෙ ස්වාමියා නයෙක් දෂ්ඨ කරල මළා. ඒ දුක දරාගෙන එනකොට ලොකු දරුව ගඟට ගහගෙන ගියා. ඊට පස්සෙ අතදරුව උකුස්සෙක් අරගෙන ගියා. මොන තරම් දුක් ගොඩකට මුහුණ දෙන්න සිද්ධ වුනාද ? නමුත් පටන් ගත්ත තැන දුකක්ද ? නෑ, කිසි කතාවක් නෑ සුවයක් සැපක් බලාපොරොත්තුවෙන් මුලින් එහෙම දෙයක් ලැබුන නිසාමයි ගියේ.

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගෙ පළමු ධර්ම දේශනාවෙන්ම මේ දුකට හේතුව නුවණින් දකින හැටි පෙන්නුවා.

''ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛ සමුදයෝ අරිය සච්චං, යායං තණ්හා පෝනෝ භවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභි නන්දිනී සෙය්‍යථීදං කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා.''

(ධම්මචක්කප්පවත්තන සූත්‍රය (සංයුක්ත නිකාය 5 (2) 270 පිටුව)

මහණෙනි, මේ වූ කලී දුක්ඛ සමුදය ආර්ය සත්‍යයයි, පුනර්භවය ඇති කරන නන්දිරාගය සහගිය ඒ ඒ භවයන්හි ඇල්ම ඇති කරන යම් තෘෂ්ණාවක් වේ ද, එනම් කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හාවයි.

දැන් මේ තණ්හා 3 කෙටියෙන් හැඳින්නුවොත්, කාම තණ්හා කියන්නෙ සියලු වස්තූන් සහ ක්ලේෂයන් කෙරෙහි පවත්නා තණ්හාව. භව තණ්හා කියන්නෙ සාස්වත දෘෂ්ඨි සහගත තණ්හාව. ඒ කියන්නෙ සදාතනික මම කියල කෙනෙක් ඉන්නවා කියන අදහස. විභව තණ්හා කියන්නෙ උච්ඡේද දෘෂ්ටි සහගත තණ්හාව, භවයක් නෑ කියන කොට ඇති වන තණ්හාව. ඒ කියන්නෙ මම කියල කෙනෙක් නෑ, මළාට පස්සෙ ඔක්කොම ඉවරයි, ඒ නිසා මොන ජාතියෙ ඒව කරල හරි ආස්වාද වින්දට කමක් නෑ කියන දෘෂ්ටියක සමහරු ඉන්නවා. මොකද භවයක් තියෙනවයි කියල විශ්වාසයක් තියෙනව නම් අපායෙ යන්න වෙයි, දුක් විඳින්න වෙයි කියල පවු කරන්න බයයි. ඒ නිසා අයුතු විදියට පංචකාම ආස්වාද විඳින්න යන්නෙ නෑ. නමුත් එහෙම එකක් නෑ කියල දෘෂ්ටියකට වැටුනොත්, අපායකුත් නැත්නම්, පවුත් නැත්නම්, ඉතින් නිකං කාල බීල ඕන අසාධාරණයක් කළාට කමක් නෑ, භය නෑ කියන තැනට මානසිකත්වය එනවා. ඒ නිසා ජීවත් වෙලා ඉන්න කල් ඕන අසාධාරණයක් කරල හම්බ කරගෙන කනවා. ඕව කරන්න හොඳද, කවද ගෙවල ඉවර කරන්නද කියල යමක් දන්න කියන කෙනෙක් කිව්වොත්, මොන ගෙවිල්ලක්ද, උඹත් එකයි මාත් එකයි, මළාට පස්සෙ ඔක්කොම ඉවරයි, නැවත උපදින කෙනෙක් නෑ කියල මෙහෙමත් කියනවා. දැන් මෙහෙම මතු භවයක් නෑ කියන දෘෂ්ටියකට වැටුනම ඒ මනුස්සයට හැදෙන්න දෙයක් නෑ. එහෙනම් ඉතින් මොනව කළත් මොකද කියන අදහසක් එනවා. මේ තමයි විභව තණ්හාවෙ ස්වභාවය.

දැන් නැවතත් පටාචාරා කතාවට යොමු වුණොත්, මේ වගේ දුකට හේතුවක් තමයි ඇය තෝර ගෙන තිබුනෙ. ඒ කියන්නෙ කාමයට බැඳිල එතනටම හා වෙන්න ගත්ත තීරණයක්. ඒ කියන්නෙ කාම තණ්හා. ඒකෙ අවසාන ප්‍රතිඵලය දුක. ඒකෙන් නොවිඳිනා දුක් විඳින්න සිද්ධ වුණා. නමුත් වාසනාවකට පෙර පටන් ගෙනාපු පාරමිතා ශක්තියක් තිබුණා. සුළු සුළු අතපසුවීම් වෙන්න පුළුවන්, දුකට වැටෙන්න පුළුවන්. නමුත් මාර්ගය පැහැදිලියි, ධර්මතාවයෙන්ම අවශ්‍ය තැනට ගිහින් දමනවා. එහෙම නැති අයට කාගෙ පිහිටක්ද? දැන් පටාචාරාවගෙ ස්වාමියත් නැතිවෙලා, දරුවොත් නැතිවෙලා, ඒක දරාගන්න බැරි දුකෙන් දෙමව්පියන් ළඟට යන්න තීරණය කළා. ඒ, එතනවත් සැනසීමක් බලාපොරොත්තුවෙන්. එහෙම කැමැත්තක් තමයි තිබුනෙ. මේ පැවැත්ම තුල සැනසීමක් ලබා ගන්න හිතුවෙ, දෙමව්පියන් ඇයව සතුටින් බාරගනියි කියල හිතල. ඒ බලාපොරොත්තුවෙන් තමයි එතනට ගියේ. එහෙම යද්දි දැක්කා, මැරිච්ච අය ආදාහනය කරන මහා ගිනි ගොඩක දර්ශනයක්. ළඟට ගිහින් ඇහුව, කාවද ඒ ආදාහනය කරන්නෙ කියල. කලින් දවසෙ වැස්සට සිටු මැදුර කඩන් වැටිල ඇගේ දෙමව්පියන් සහ හිටපු එකම සොයුරා මිය පරලොව ගිහින් එකම සැයක දැවෙනවා. ලැබුන උත්තරය අනුව ඇයට උන් හිටි තැන් අමතක වුණා, සිහිය නැති වුණා. ඉබාගාතේ දුවන්න පටන් ගත්තා. ඇගේ ඇඳුමක්වත් තියෙනවද කියල නිච්චි නැතුව හැම තැනම දුවන්න ගත්තා.

හැබැයි මොනව නිච්චි නැතිව දිව්වත් පාරමිතා ශක්තිය ඊට වඩා බලවත්. කර්ම විපාකයක් තිබුන නම් ඒකත් ඇයට විඳින්න සිද්ධ වුණා. නමුත් ඇය කොච්චර ඒ මේ අත දිව්වත් අවසානයේ අවශ්‍යම තැනට ගිහින් නැවතුනා. ඒ තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ අබියස. නමුත් එතන හිටපු මිනිස්සු මේ නිර්වස්ත්‍රයෙන් ආපු කාන්තාව, පිටින් දැකල එන්න දුන්නෙ නෑ. නමුත් බුදුන් වහන්සේගෙ අනාවරණ ඥානයට කිසි දෙයක් වහන්න බෑ. උන්වහන්සේ දැක්ක, මේ ඉදිරියේ නිර්වස්ත්‍රයෙන් ඉන්නෙ දැනට කල්ප ලක්ෂයකට පෙර පටන් මේ බුද්ධ සාසනයේ විනය අතින් අග්‍රවෙන්න පාරමිතා සම්පූර්ණ කරපු මහා උත්තමාවියක් කියල. එහෙම දකල මහා කරුණා ඥානයෙන් මේ වියරු වැටිල හිටපු පටාචාරාවට කතා කළා. ''නැගණියනි, එන්න කුමක්ද ඔබේ ප්‍රශ්නය ?'' ඒ වචනවලින් ඇයට සිහි කල්පනාව ලැබුනා. එතන හිටපු කෙනෙක් ඇයට වස්ත්‍රයක් ලබා දුන්නා. තමන්ට වෙච්ච සිදුවීම් සියල්ලම ඇය බුදුපියාණන් වහන්සේ ඉදිරියේ ප්‍රකාශ කර සිටියා.

පෙර පාරමිතා ශක්තිය, බුදුවරු ඉදිරියේ දුන් දාන මානවල ශක්තිය, කාශ්‍යප බුදුන් වහන්සේගෙ කාලයේ පිය රජතුමා විසින් පැවිද්දට අවසර නොදී අවුරුදු 20,000 ක් කුමරි බඹසර රැකපු ශක්තිය මතු වුණා. මනස පැහැපත් වුණා. බණ අහන්න ලැස්ති වුණා. ඉන් පසු නැවතත් බුදුපියාණන් වහන්සේ ඇයට මේ ගාථාව කියා සිටියා.

**චතුසු සමුද්දේසු ජලං පරිත්තකං**
**තතෝ බහුං අස්සු ජලං අනප්පකං**
**දුක්ඛේන ඵුට්ඨස්ස නරස්ස සෝචනා**
**කිං කාරණා අම්ම තුවං පමජ්ජසිඩති**

ධම්මපද අට්ඨ කතාව - සහස්ස වර්ගය - පටාචාරාවත

මේ ගාථාවෙ සරල සිංහල අදහස ගත්තොත්, **මේ සසර ගමනෙදි එකම කෙනා තමන්ගෙ අම්ම වෙලා ඉඳල මැරුණ සොවින් අඬපු කඳුළු බැලුවොත්, මේ හතර මහා සාගරයටත් වඩා වැඩියි.** (හතර මහා සාගර කියන්නෙ ජම්බුද්වීපයට නිල් මුහුද, උතුරුකුරු දිවයිනට ස්වර්ණ මුහුද, පූර්ව විදේහයට කිරි මුහුද සහ අපර ගෝයානයට පබළු මුහුද වශයෙන් මේ හතර දිවයින් වටේ තියෙන සාගර 4) ඒ අනුව ඇයට කරුණු පහදල දුන්නා. මේ සසර කොතරම් දීර්ඝද, ඒ වගේම භයානකද කියල ඒ ගාථාවෙන් අපටත් යමක් තෝර ගන්න පුළුවන්. ඒ එකම කෙනා අම්ම වෙලා ඉඳල වෙන් වුන දුකට හඬා වැටුනු කඳුළු. එතකොට තාත්ත වෙලා, බිරිය වෙලා, සැමිය වෙලා, දරුවො වෙලා, සහෝදරයා, සහෝදරිය වෙලා

හඬා වැටුන කඳුළු ප්‍රමාණය කොච්චර නම් ඇත්ද ? ඒ එකම කෙනා නැතුව වෙනත් අය අම්ම වෙලා අඬපු කඳුළු කොච්චර නම් ඇත්ද ? ඉතින් සසර ගමන කොච්චර නම් දිගද කියල ඒකෙන්ම හිතා ගන්න පුළුවන්. එතකොට වැඩියෙන්ම විඳල තියෙන්නෙ දුකද සැපද කියල තෝරගන්න පුළුවන්.

දැන් මේ කාරණය ලෝ වැඩ සඟරාවෙ එන කවියකින් තව දුරටත් පැහැදිලි කර ගන්න පුළුවන්.

**එකම සතෙකු තම මවු මළ දුකටා**
**වෙනම හැඬූ කඳුළෙහි බිඳු වලටා**
**මෙහැම මුහුදු දිය පරයන කලටා**
**තවම සසර ආලය ඇයි තොපටා**

එක අත්බැවක විතරක් නෙවෙයි, සමහර වෙලාවට එක්කෙනාම අම්ම වෙලා අත්බැව් ගණනාවක් යන අවස්ථාත් අනන්තවත් තියෙනවා. ඒ වගේම දැන් අම්ම වුණා, ඊළඟ අත්බවේ සහෝදරියක් වුණා, ඊළඟට සහෝදරයෙක් වුණා, භාර්යාව වුණා... ඔහොම ගිහින් නැවතත් අත්බැවක අම්ම වෙලා උපදින අවස්ථාත් අනන්තවත් තියෙනවා. එතකොට මෙතනදි අම්ම වෙලා මළාට පස්සෙ අඬපු අවස්ථා විතරක් නෙවෙයි, අර අනෙක් අය වෙනුවෙනුත් අඬපු වාර, වගුරපු කඳුළු ගත්තොත් ඒවායෙ කෙළවරක් නෑ. ඉතින් එකම කෙනා අම්ම වෙලා හිටපු අවස්ථා ගත්තත්, ඒ හැම අවස්ථාවකදිම අම්ම මළ ශෝකයෙන් අඬපු කඳුළු මේ උපමාවෙන් පෙන්වා තියෙනවා.

නමුත් **මෙතන තියෙන අපි නොදන්න ගැඹුරු පැත්ත තමයි, කලින් අම්ම වෙච්ච කෙනාම තමයි පසු අත්බැව්වලදී දරුව වුනේ, සහෝදරිය වුනේ, භාර්යාව වුනේ කියන කාරණය.** මේ කාරණය අපි දන්නෙ නැතිව මිසක් ගැඹුරින් කල්පනා කරල බලනව නම්, මේ අම්ම වෙච්ච කෙනාටම නේද දැන් දුව කියල කතා කරන්නෙ, සහෝදරිය කියල කතා කරන්නෙ ? ඒ ඔක්කොටම වඩා ගැඹුරුයි, එදා අම්ම වෙච්ච කෙනා ඊළඟ අත්බැවක භාර්යාව වෙලා පරිහරණය කරන එක. පෙර අත්බැවක අම්ම නේද කියල නොදන්නකම ! මේ වගේ අවස්ථා මේ සසර තුළ අනන්තවත් තියෙනවා. නමුත් ඒ කාරණය මේ ලෝක සත්වයින් දන්නෙ නෑ. අවිද්‍යාවෙන් වැහුනම ඒක පේන්නෙ නෑ. ඒ නිසාම අනන්ත සංසාරෙ අම්ම වෙච්ච කාන්තාවක්ම ඊළඟට තමන්ගෙ භාර්යාව වෙලා ඉන්නවා. ඒ අර සංසාර ගනුදෙනු පියවන්න.

ඒ වගේ පෙර අත්බැව්වල අම්ම වෙලා හිටපු අයම තමයි ඊළඟ අත්බැව්වල සමහර වෙලාවට අපිට හතුරො හතුරියො වෙලා ඉන්නෙත්. ඒ එදා වෙච්ච ගනුදෙනු පියවන්න. නමුත් ඒ අවස්ථාවෙදි අපිට අර අතීතය පේන්නෙ නැති නිසාම, මේ මට කවද හරි අම්ම වෙලා හිටපු කෙනෙක් නේද ? මම ඒ අයට හිංගි හිංසා කරන්න හොඳ නැනෙ.... මේ ආදී වශයෙන් හිතෙන්නෙත් නෑ. අම්ම වෙලා හොඳින් හිටපු කාලෙක බුද්ධ ශාසනයක් තියෙන කාලයකුත් වුනා නම්, අනේ මගෙ අම්ම මතු බුදුවෙන්න කියලත් ප්‍රාර්ථනා කරනවා, මතු ජාති ජාතිත් මගේම අම්ම වෙන්න කියනවා. මෙහෙම කෙළවරක් නැති කතා එදා කියනවා. අපි මෙහෙම කියපු වාර, ප්‍රාර්ථනා කරපු වාර ගණන බැලුවොත් කොච්චර ද කියලවත් දන්නෙ නෑ. ඒක



හිතාගන්නත් බෑ. අනන්ත කාලෙක ඉඳලම මේ වගේ එනවා. නමුත් දැන් අම්ම වෙලා ඉන්න කෙනා ඊළඟ අත්බැව්වලත් දිගටම අම්ම වෙන්න හේතුත් නෑ, මනුස්සයෙක් වෙන්න හේතුත් නෑ. මොකද විවිධ අයත් එක්ක තියෙන සසර ගනුදෙනු නිසාත්, ඒ වගේම පෘතජ්ජන ස්වභාවය නිසාත් දැන් අම්ම වෙලා ඉඳල ඊළඟට බැළලියක්, බැල්ලියක්, වැස්සියක් වෙන්නත් පුළුවන්, එහෙම නැත්නම් පෙරේතියක් වෙන්නත් පුළුවන්. මේ විදියට කෙළවරක් නැති අත්බැව්වල උපදින්න පුළුවන්. ඉතින් ඔහොම යන කොට නැවතත් මනුස්සයෙක් වෙන අවස්ථාත් එනවා.

එතකොට තිරිසන් සතෙක් තමන්ගෙ තවත් සතෙක් මළයි කියල මනුස්සයො වගේ අඬා වැළපෙන්නෙ නෑ. මොකද එහෙම ඥාති සම්බන්ධයක් හිතාගන්න තරම් මානසිකත්වයක් ඒ සතුන්ට නෑ. උන්ගෙ ඇස්වලින් කඳුළු වැගිරුනත් ඇස් දැවිල්ලක්, කායික වේදනාවක් වගේ දේකට තමයි බොහෝ කොටම කඳුළු එන්නෙ. දුකට කඳුළු එනව බොහොම අඩුයි. මොකද දුක් සංඥාව බොහොම අඩුයි. වේදනා සංඥාව තමයි බොහෝ කොටම විඳින්නෙ. මේ මගේ අහවලානෙ, අනේ මගේ එකා නැති වුණානෙ ....... ආදී වශයෙන් එහෙම දුක් සංඥාවක් එන්නෙ නෑ. ඒක දුර්වලයි. නමුත් වේදනාව උපරිමයි. ඒ නිසා මව, පියා කියල මනුස්සයින්ට තියෙන ආකාරයේ සංඥාවක් සතුන්ට නෑ. විපාක වශයෙන් එන දෙයක් ඇරෙන්න ඊට එහා යන්නෙ නෑ. ඒ නිසා තමයි සත්තු ලොකු වෙලා ටික කලක් යද්දි අම්ම, තාත්ත කියල වෙනසක් නැතිව පොර කන්නෙ, මරා ගන්නෙ.

ඒ නිසා මේ විදියට අඬල වැළපිලා කඳුළු හෙලන්න, විශේෂයෙන් දැනෙන මානසිකත්වයක් තියෙන මනුස්ස වගේ අත්බැවක් තියෙන්න ඕන. එතකොට තමයි, අනේ මගෙ අම්ම මළානෙ කියල අඬන්නෙ. නමුත් තිරිසන් සතුන් විපාක ස්කන්ධයක් ගෙවනව මිසක් ඒ වගේ සියුම් මානසිකත්වයක් නෑ. එතකොට මේ **මනුස්සයො වෙලා ඉඳල හෙළපු කඳුළු විතරක් මෙච්චර ප්‍රමාණයක් කියල සීමා කරන්න බැරි නම්, මේ සංසාරෙ තියෙන භයානකත්වය එතනින්ම තේරුම් ගන්න ඕන.** එක්කෙනෙක් මේ අත් හවයෙ අම්ම වුනාට, අනිත් සතුනුත් කවද හරි තමන්ට ඒ වගේ සම්බන්ධයක් තිබිල තියෙනව කියන කාරණයත් දකින්න ඕන. එතකොට මේ වටේ ඉන්න සියලුම සත්තු කවද හරි අන්‍යොන්‍ය වශයෙන් තමන්ට අම්ම වෙලා ඉඳල තියෙනවා, වෙනත් ඥාතීන් විදියටත් ඉඳල තියෙනවා.

දැන් මේකට තවත් උපමාවක් මේ දහම තුළ තියෙනවා. මේ මහ පොළවෙ පස් දෙබර ගෙඩි තරමට ගුලි කළොත් ඒ ගුලි කොච්චර නම් ඇත්ද ? ඊටත් වඩා වැඩි වාර ගණනක් මේ එක සත්වයෙක් තවත් සතෙකුට මවු වෙලා තියෙනවා, පියා වෙලා තියෙනවා, සහෝදර සහෝදරියො වෙලා තියෙනවා, භාර්යාව වෙලා තියෙනවා, දරුව වෙලා තියෙනවා. මේ වගේ අසීමිතයි කියල පෙන්වනවා. ඊළඟට එක සතෙක් තවත් සතෙකුට කියල කිච්චම ☞

සත්තුත් අනන්තයි. එතකොට දැන් කුරා කුඹියෙක් විදියට හිටියත්, කීඩෑවෙක් විදියට හිටියත් මේ විදියට බලන කොට පෙර අම්මා, තාත්ත ආදී වශයෙන් හිටපු අයම තමයි අද මේ වගේ තත්ත්වයන්ට පත්වෙලා ඉන්නෙ. ඒ වගේම ඇමීබාවා කියන යම් ක්‍ෂුද්‍ර ජීවී අවස්ථාවකට පත් වෙලා හිටියත් ඒත් අර වගේ කෙනෙක්ම තමයි. එහෙනම් මේ අචින්ත්‍ය, අනන්ත සත්ව විෂයක් පිළිබඳව බලන කොට, මෙහෙම තමන්ට අම්මා, තාත්ත, සහෝදර, සහෝදරියො .... ආදී වශයෙන් වෙච්ච වාර ගණන බැලුවොත් ඒක අප්‍රමාණයි නම්, අන්‍යොන්‍ය සම්බන්ධයෙන් එක එක විදියෙ නෑදෑයො වෙච්ච වාර කොච්චර නම් අනන්ත කාලයක පටන් මේ ලෝක සත්වයෝ ගෙවනවද ? ඒ අය මැරිච්ච වාර ගණන කොච්චර නම් ඇත්ද ? ඒ අය මැරුණම මේ ලෝක සත්වයෝ කොච්චර නම් අඬල ඇත්ද ? කොච්චර නම් දුක් විඳල ඇත්ද ? කොච්චර නම් බලාපොරොත්තු සුන්වෙලා ඇත්ද ? කොච්චර නම් පෙළිල ඇත්ද ? කොච්චර අනන්තව පෙළුනත් මේ ලෝක සත්වයින්ට දැන් ඒ එකක්වත් මතක නෑ. මතක නැති නිසාම තවත් ඒ පස්සෙම යනවා.

හැබැයි කවද හරි දිවැසක් පහළ වෙලා, පූර්වේනිවාසානුස්සති ඥානය පහළ වුනා නම්, කවදාවත් නැවත මේ වගේ ලෝකෙ අල්ලන්න බලාපොරොත්තු වෙන්නෙ නෑ. එතනදිම චුතුපපාතය දකින කොට ආස්‍රව ක්‍ෂය වෙන්න හේතු යෙදෙනවා. ඒ නිසාම තමයි ත්‍රිවිද්‍යාවෙන් තුන් වෙනියට ආස්‍රව ක්‍ෂය වෙන්නෙ. ආස්‍රව කියන්නෙ යම්කිසි වැගිරෙන දේවල් තියෙන තැන්. කාමාස්‍රව, භවාස්‍රව, දිට්ඨාස්‍රව, අවිද්‍යාස්‍රව කියන මේ හතර පල් වූ ජලාශ හා සමානයි. කාමය, භවය, දෘෂ්ටිය, අවිද්‍යාව කියන මේවා පල් වූ ජලාශ වගෙයි. අරිෂ්ඨවලටත් ආසව කියල කියන්නෙ බෙහෙත් ද්‍රව්‍ය පල් කරල ගන්න නිසා. ආස්‍රව කියන වචනෙ සිංහල තේරුම තමයි ආසාව කියන්නෙ. ලෝක සත්ත්වයා කාමයට ආසයි, භවයට ආසයි, දෘෂ්ටියට ආසයි, අවිද්‍යාවට ආසයි. ආසව කියන ස්වභාවයෙන් පල් වෙලා ඉන්නෙ. මේ වගේ ආසා කරන දේවල්වලට තමයි ආස්‍රව කියන්නෙ. ඒ ආසා කරන දේවල් පස්සෙ තමයි මේ ලෝක සත්ත්වයෝ දුවන්නෙ. පූර්වේනිවාසානුස්සති, චුතුපපාත කියන ඥාන දෙක ලැබුවට පස්සෙ ඊළඟට පහල වෙන්නෙ ආස්‍රව ක්‍ෂය ඥානය. ඒක පහළ වුනාම නැවත ඉතිරි වෙන්න දෙයක් නෑ. ඉතින්

පූර්වේනිවාසානුස්සති ඥානය පහළ වුනා කියන්නෙ, තමන් පෙර අත්බැව්වල හිටපු හැටි, හිතපු හැටි, අපාගත වෙලා දුක් විඳපු හැටි .... මේ ආදී වශයෙන් මේ සියල්ලම දකිනවා. එතකොට එක සැපක් බලාපොරොත්තුවෙන් දුක් කීයකට නම් තමන්ට ගෝචර වෙන්න සිද්ධ වුනාද කියල දකිනවා. එතකොට තමයි මේ සැප එකක තියෙන වටිනාකම බිංදුවට බැහැල ක්‍ෂණ වෙන්නෙ. සැප එකක් කියන්නෙ මර උගුලක්නෙ, දුකට හේතුවක්නෙ කියල දකිනවා. එක සැපකට එහෙම නම්, බලාපොරොත්තු වෙච්ච අනිත් සැප කන්දරාවට කොහොම දුක් විඳල ඇත්ද ?

ඊළඟට චුතුපපාත ඥානය පහළ වෙන කොටම, මොකක් හෝ හේතුවකින් චුත වුනා, ඒ වෙලාවෙ මෙබඳු අදහසක් තිබුනා, ඒ අදහසට අනුව මෙහෙම උප්පත්තියක් ලැබුවා, ආස්වාද පස්සෙ ගිහින් පවු කර ගත්තා, ඒකට මෙච්චර කාලයක් දුක් වින්දා .... ආදී වශයෙන්



මෙහෙමත් දකින්න පටන් ගන්නවා. මේ කාරණා දකින කොට අන්‍ය සත්වයින් ගැනත්, තමන් ගැනත් දකිනවා. එතකොට ආස්‍රව ඉතිරි වෙන්නෙ නෑ. අද මේ හතුර කියන කෙනා, පෙර මට අම්මා තාත්ත වෙලත් හිටියනෙ ! එහෙම අවස්ථාත් ගෙවුනනෙ කියල ඒ කාරණය නුවණිනුත් දකිනවා, දිවැසිනුත් දකිනවා. මේ ක්‍රම දෙකටම දකින්න පටන් ගත්තම, නැවතත් ඒ ගැන හොයන්නවත් බලාපොරොත්තුවක් නැතිව යනවා. මොකටද අනේ මේ සසරෙ හැටි මෙහෙමයිනෙ කියල දැනගත්තට පස්සෙ නැවතත් ඒ දිවැසටවත් ඉඩ තියන්නෙ නෑ. ඒකත් බලල එපා වෙලා, අන්තිමට බලන්න දෙයක් නෑ කියල ගත යුතු අවසන් තීරණයත් අරගෙන, ආස්‍රව ක්‍ෂය වෙලා අර බැඳීම් සියල්ලම ගැලවිලා යනවා. ඊට පස්සෙ නැවතත් ලෝකය ගැන බලාපොරොත්තු නැතිව යනවා.

මේ නිසා රහතන් වහන්සේ නමක් තමන් දකපු දේ ප්‍රකාශ කළාට, නැවත ඒව ගැන හිත හිතා ඉන්නෙවත්, පූර්වේනිවාසානුස්සතිය පස්සෙ යන්නෙවත් නෑ. ඒව හොය හොයා ඉන්න බලාපොරොත්තුවත් එතනින් ඉවරයි. මට මෙහෙම නුවණක් තියෙනව කියල ඒකට වටිනාකමක් දෙන්න යන්නෙවත්, ඒ ගැන බලාපොරොත්තුවක්වත් උන් වහන්සේට නෑ. උන් වහන්සේ ඒ සියල්ල ඉක්මෙව්වා. එහෙම හැකියාවක් තිබුණට ඒකවත් ආවර්ජනා කරන්න බලාපොරොත්තුවක් නෑ. ආවර්ජනය කරල ගත යුතු තීරණය දැනටමත් අරගෙන ඉවරයි. අසාර ලෝකෙ තව මොනව හොයන්නද කියන කාරණය දැකල ඉවරයි.

දැන් මේ කාරණය මෙච්චර දුරට විග්‍රහ කළේ, අද වෙන කොට මේ ගැන කතා නොකරන මට්ටමට සමාජය පත් වෙලා ඒක සැඟවිච්ච කාරණයක් නිසා. මිනිස්සු මේ ගැන දන්නෙ නැති නිසාම, අනන්තවත් මේ ලෝකෙ තියෙන දේවල් පසු පස ගිහින් ඒව නැති වුනාම අඬනව වැළපෙනව ඉවරයක් නෑ. මරණයක් වුනත් එහෙමයි. ඉතින් මරණයකදි ඇඬුවත් මේ වගේ කාරණා දකින්න පුළුවන් නම්, අර තියෙන මහා දාහය, අසහනය දුරු වෙන්න හේතු වෙනවා. මේ ලෝවැඩ සඟරාවෙ කවිවලට අරන් තියෙන්නෙත්, මේ වගේ බුද්ධ ශාසනය තුළ වෙච්ච සිද්ධි තමයි. ඒව බොහොම වටිනවා.

දැන් පටාචාරා කතාවට නැවතත් යොමු වුනොත්, බුදුන් වහන්සේ තවත් ගාථා දෙකක් ඇයට දේශනා කරනවා. ඇත්තටම ඒක උන්වහන්සේ ඇයගෙන් අහපු ප්‍රශ්න දෙකක් මුල් කරගෙන කරපු දේශනාවක්. ඒකෙන් ඇගේ සිහිවිකල් බාවය නැති වුණා. ඇත්ත නේද මේ කියන්නෙ කියල හිතුණා. එතනින් සෝවාන් ඵලයට පත්වුණා.

න සන්ති පුත්තා තාණාය
න පිතා නපි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස
නත්ථි ඤාතීසු තාණතා

(ධම්ම පදය - මග්ග වර්ගය - 288 ගාථාව)

**මරහු විසින් මඩනා ලද සත්වයාට ආරක්ෂා පිණිස දූ පුත්තු නොවන්නාහ. පියාද ආරක්ෂා පිණිස නොවන්නේය. වැලි (සෙසු මල් බෑ බුහුන ආදී, එනම් සහෝදර සහෝදරියන් ආදී ...) නෑයෝ ද**

**ආරක්ෂා පිණිස නොවන්නාහ. නෑයන් කෙරෙහි ඔහුට පිහිට වන බවෙක් නැත්තේය.**

**ඒතමත්ථවසසං ඤත්වා**
**පණ්ඩිතෝ සීලසංවුතෝ**
**නිබ්බාණගමනං මග්ගං**
**ඛිප්පමේව විසෝධයේ**

(ධම්ම පදය - මග්ග වර්ගය - 289 ගාථාව)

මේ කරුණ දැන, නුවණැත්තේ සීලයෙන් රක්ෂිත ගොපිත (පෝෂණය) වූයේ, නිවනට යන මඟ වහාම පිරිසිදු කරන්නේය.

මේ ගාථා දෙකේ සරල අදහස නම්, මම කරගන්න දෙයක් මට මිසක් වෙන කෙනෙකුට උදව් කරගන්න පුළුවන්ද ? මම වහ බීල තව කෙනෙක් මැරෙනකල් බලන් ඉන්න එක හරිද? එහෙම ක්‍රමයක් තියෙනවද? මම පාපයක් කළොත් මමයි ගෙවන්න ඕන. මම පිනක් කළොත් ඒකත් මමයි විඳවන්නෙ. ඒවත් ගෙවිල වැනසිලා යන දේවල්. මාරයාගෙ කටේ ඉන්න කෙනෙකුට අම්ම උදව් කරයි, තාත්ත උදව් කරයි, අයිය උදව් කරයි, මල්ලි උදව් කරයි, නෑදෑයො උදව් කරයි කියල හිටියට, එහෙම උදව් කරන්න පුළුවන්ද ? කොහොමද ඒක තේරුම් ගන්නෙ ? ඒක තේරුම් ගන්නෙ මෙහෙමයි,

පටාචාරාවට වුනත් සැමිය ඉන්න කොට, දරුවො ඉන්න කොට, දෙමව්පියො ඉන්න කොට ඇයට කරපු උදව් උපකාර තිබුණා. කෑම ටික ළඟට ගෙනත් දුන්නා. ලෙඩක් දුකක් හැදුනම හොයල බැලුවා. යහපතක් කළා. ඒ අය මෙලොව උදව් උපකාර කළා. ඒක බොරු නෙවෙයි. දැන් ඉතින් ඒ අය එක්ක එකට ඉන්නයි කැමැත්ත. නමුත් පිනකට දහමකට හිත යොමු වුනේ නැත්නම්, තමන් මියගිය දාක පරලොව ජීවිතය ගැන කාට කියන්න පුළුවන්ද ? මේ කාරණය බුද්ධ දේශනාවෙම තියෙනවා.

ඒ ප්‍රේත ලෝකයේ සී සෑමෙක් නැත්තේය. ගව පාලනයක් එහි නැත්තේය. සම්පත් ලැබීමට හේතු වූ එබඳු වෙළෙඳාමකුත් නැත්තේය. රන් රිදියෙන් කරන ගනුදෙනුවක්ද නැත්තේය.

<u>තිරෝකුඩ්ඩ සූත්‍රය</u> - කුද්දකපත - 15 පිටුව

ඉතින් තමන් ජීවත් වෙලා ඉන්න කාලෙ එකට හිටපු කිසි කෙනෙකුට, තමන් පරලොව ගියාට පස්සෙ උදව් කරන්න පුළුවන්ද? අම්ම හිටිය කියල, අම්මට ඇවිත් තමන් පරලොව දුක් විඳින කොට තමන්ට උදව් කරන්න පුළුවන්ද ? තාත්ත හිටිය කියල තාත්තට උදව් කරන්න පුළුවන්ද ? නෑදෑයො හිටියට නෑදෑයන්ට උදව් කරන්න පුළුවන්ද ? තමන් මේ ලෝකෙ ඉන්න කොට කරපු දේවල් අනුව, ගත්ත තීරණ අනුව තමයි පරලොව ජීවිතය තීරණය වෙන්නෙ. ඉතින් මේ අය එක රොත්තෙ ඉඳල හඬල වැලපිලා කකා බිබී නට නටා හිටියට, දැන් ඒ අයට උදව් කරන්න පුළුවන් කමක් තියෙනවද ? මේ කියන්නෙ මළ ගිය අයට පින් දීමක් ගැන නෙවෙයි. පින් දෙන්න පුළුවන්. නමුත් මනුස්සයෙක් තවත් මනුස්සයෙකුට යමක් ලබා දෙනව වගේ, නොපෙනෙන ලෝකෙ ඉන්න අයට මොනව දෙන්නද ? ඒ නිසා බුදුන් වහන්සේ පටාචාරාවගෙන් මෙබඳු අදහසක් විමසුවා. ඔබ ඔවුන් මළ සොවින් හඬනවා වැලපෙනවා. දැන් මට දරු සුරතල් බලන්න විදිහක් නෑ කියල, ඒ දරු දුකින් හඬා වැලපෙනවා. සැමියගෙන් ලැබුන පිහිට ආරක්ෂාව කෝ කියල ඒ දුකින් හඬා වැලපෙනවා. අම්ම, තාත්ත, සහෝදරය-ගෙන් ලැබුන ආදරය සෙනෙහස කෝ කියල ඒ දුකින් හඬා වැලපෙනවා. ඒත් ඔබේ පරලොව ජීවිතයට, අර කිව්ව දරුවන්ගෙ හුරතල්, සැමියගෙ ආරක්ෂාව, දෙමව්පියන්ගෙ සෙනෙහස තියෙනවද ? ඒ අයට එහෙම උදව්වක් කරන්න පුළුවන්ද ? ඉතින් එහෙම පරලොවක් හිමි කෙනාට කාගෙ පිලිසරණක්ද ? එහෙම පිළිසරණක් ගත්ත කෙනෙක් ඉන්නවද? දැන් ඒ අය ගැන සොවින් අඬ අඬා හිටියට, පරලොවේදි එහෙම උදව් කරන්න බැරි ඔවුන්ගෙන් ඔබට ඇති වැඩක් තියෙනවද ? ඉතින් නුවණැත්ත කරන්නෙ මොකක්ද ? මේ අම්ම, තාත්ත, සැමිය, බිරිඳ, දරුවො ... ආදී වශයෙන් කියන අයට තමන්ගෙන් ඉටු වෙන්න තියෙන යුතුකම් ඉෂ්ට කරන ගමන්, ඒ අය කෙරෙහි තියෙන ඡන්දරාගයෙන් මිදිල නිවන් මාර්ගයට පිවිසෙනවා. මේක හිත තුල නැගිච්ච මහා ගින්නට දැම්ම සිසිල් ජලයක් වගේ වුනා. ඒ දහම් අමා ජලය වැටුන ගමන් ඇගේ දුක් ගිනි නිවුනා. සෝවාන් ඵලයට පත් වෙලා සාසනය තුල පැවිද්ද ලබා ගත්තා.

ඇයට මරණය හොඳ අත්දැකීමක් වුණා. ඒකම තමයි විදර්ශනා කළේ. එක්තරා අවස්ථාවක පාත්තරය හෝදල ඒකෙන් රැඳිච්ච වතුර අහක් කරන වෙලාවෙ ඇය දැක්ක, ඒ වියළුණු පොලවෙ වතුර, ටික දුරක් ගිහින් නවතිනවා. ඇය ඒ අවස්ථාවෙ විදර්ශනා කරන්න පටන් ගත්තා. මොකක්ද හිතුවෙ ? අත්දැකීම් තියෙන සිද්ධියක්ම ගත්තා. මේ ලෝකෙ සමහර මිනිස්සු ඉතාම තරුණ කාලෙ මියයනවා. හරියට මේ වතුර, ටික දුරක් පොළව දිගේ ගිහින් නැවතුනා වගේ. මම ඊට වඩා දුර ඇවිත් තියෙනවා. මගේ මරණයත් මොන මොහොතෙ සිද්ධ වෙයිද කියන්න බෑ. වහ වහා නිවන් පූර්ණය නොකළොත්, මටත් මේ වගේ සසරෙ තව තවත් දුක් විඳගෙන යන්න වෙන්නෙ. ඊළඟ දවසෙත් නැවත පාත්‍රය හෝදල වතුර අහක් කරන කොට, අර කලින් පොලව තෙත් වෙලා තිබුන නිසා, කලින් දවසට වඩා වතුර පාර දුර ගියා. ඇය නැවතත් විදර්ශනා කළා. මේ ලෝකෙ මිනිස්සුත් මේ වතුර පාර වගේ ටික දුරක් ගිහින් නැවතෙනවා. හරියට තරුණ කාලෙ මියයන අය වගේ. මරණය කාටත් පොදුයි, මට කියල වෙනසක් නෑ. ඇය තවත් විදර්ශනා කළා. මේ විදිහට දවස් දෙක තුනක් මේ වතුර පාර දිහා බලාගෙන මරණානුස්සතිය වැඩුවා. හිත හොඳටම වැඩිල එන මොහොතක් තිබුණා. තමන් වහන්සේගෙ ශ්‍රාවකයෙක් හෝ ශ්‍රාවිකාවක් විදර්ශනා වඩන මොහොතක, ඒ වැඩුන මොහොත බුදුපියාණන් වහන්සේගෙ මහා කරුණාවට යොමු වෙනවා. මේ විදියට පටාචාරාවත් උන්වහන්සේගෙ මහා කරුණාවට යොමු වුනා. ඒ වෙලාවෙ උන්වහන්සේ ඍද්ධියෙන් වැඩම කරල දේශනාවක් කළා. ඒක සාමුක්බංසික දේශනාවක්. මේ විදියට පෙනී හිටපු බුදුපියාණන් වහන්සේ එතුමියට මේ ගාථා ටික දේශනා කළා.

යෝ චේ වස්සසතං ජීවේ,
අපස්සං උදයව්‍යයං
ඒකාහං ජීවිතං සෙය්‍යො
පස්සතෝ උදයව්‍යයං

මේ ගාථාවෙ සරල සිංහල අදහස නම්, යම් කෙනෙක් පංච උපාදානස්ක-න්ධයේ අය වීමත්, වැය වීමත් (උදය - වැය ඥානය සම්බන්ධව, එනම් අනිච්ච ලක්ෂණය දැන ගැනීමට ඉතා දීර්ඝ සවිස්තරාත්මක විස්තරයක් පටිසම්භිදා මග්ගප්‍රකරණය - 1 උදයව්‍යය ඥාණය - 105 පිටුවේ සඳහන් වෙනවා) විදර්ශනා ප්‍රඥාවෙන් නොදැක, අවුරුදු සියයක් ජීවත් වෙනවට වඩා, පංච උපාදානස්කන්ධයේ අනිච්ච බව දකිමින් එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨයි.

මේ ගාථා අවසානයේ පටාචාරා තෙරණිය සියලු කෙලෙසුන් නසා අරිහත්වයට පත්වුනා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

***වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග අපදාන පාලිය 2- 2- පටාචාරාපදානය ඇසුරින් සකස් කළේ:***

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# ගති ගුණ, ගති හඬ සහ ගති රුව අතර සම්බන්ධය...

*(පසුගිය කලාපයෙන් - දහමේ පෙන්වන නීථාර්ථ, නෙයියාර්ථ සහ වපංගාර්ථ...)*

මේ දහම පද නිරුක්ති සහිතව විග්‍රහ කරන කොට එන තවත් වැදගත් කොටසක් තමයි යමකට හෝ යම් සත්වයෙකුට තියෙන ගති ගුණ, ගති හඬ සහ ගති රුව කියන මේ කාරණා 3. මේ 3 එකිනෙකට ඒකාබද්ධයි, වෙන් කරන්න බෑ. දැන් මේ කාරණා 3 අතර එකිනෙකට තියෙන සම්බන්ධයත්, පද නිරුක්ති සමග ඒවා සම්බන්ධ වෙන ආකාරයත් තමයි මේ විග්‍රහ කරන්නෙ.

මනංච පටිච්ච ධම්මේච උප්පජ්ජති මනෝ විඤ්ඤාණං කියන සිද්ධාන්තය අනුව, මනසට යම් කිසි ධර්මයක් ගට්ඨනය වෙලා මනෝ විඤ්ඤාණයක් හට ගන්නවා. මනසට ධර්මයක් ඝට්ටනය වුනයි කියන්නෙ යම් කිසි අරමුණක් ස්පර්ශ වුණා. ඒකෙ ප්‍රතිඵලය තමයි යම් කිසි ගති ලක්ෂණයක් පහළවීම. ඒකත් විඤ්ඤාණයක්. ඒකෙන් තමයි ගති ගුණ කියන කාරණය නැගෙන්නෙ. එතකොට යම් කිසි බාහිර ක්‍රියාකාරිත්වයක් දැක්කම කෙනෙකුට යම් කිසි ගති ගුණයක් එනවා. ගති ගුණ කිව්වම හොඳ නරක දෙකම අයිති වෙනවා. උදාහරණයක් විදියට කවුරුහරි තමන්ට පිහියෙන් අනින්න එන කොට ඒ දර්ශනය ඇහෙන් දකිනවා. ඒක තමයි බාහිර ගති රුව. ඒ බාහිර ගති රුව දැක්කම ඒක රෞද්‍ර භයානක දෙයක් කියල අඳුන ගන්නවා. දැන් ඒක දැක්ක ගමන් ඒ පුද්ගලයට ඊට අනුරූප ගති ගුණයක් නැගෙනවා. ඒ තමයි භය. එතකොට ඒ බාහිර ගති රුව අරමුණු වීමෙන් හිතේ හටගන්න ගති ගුණ නිසා තමන්ටත් ඊට අනුරූපව ගති රුවක් නිර්මාණය වෙනවා. ඒක තමයි තමන්ගෙ මුහුණින්, ඉරියව්වලින් කියන්නෙ.

දැන් ඒ භය නිසා ගති හඬක් නැගෙනවා. ඒ නිසා තමයි කෑ ගහන්නෙ. ඒක මහ භයානක හඬක්. ඒ කෑගහන කොටත් විවිධ භාෂා කතා කරන උදවියගෙ සංඥාවලට අනුව, බුදු අම්මෝ .... මයි ගෝඩ්.... (my god).... ආදී වශයෙන් විවිධ වචන පිටවෙන්න පුළුවන්. නමුත් ඒ විදියට කෑ ගහන්න ඉස්සෙල්ල ආරම්භයට නැගෙන ඇහ් ! ... හැහ් ! ... හෑ ! ... ආදී වශයෙන් එන ශබ්දය කිසිම භාෂා භේදයකින් තොරව හැමෝටම පොදුයි. ඒක තමයි ඕනම කෙනෙක් එක පාරටම භය වුනාම කෑ ගහන කොට එන ගති හඬ, ගති හඬේ පටන් ගැන්ම. ඒකට භාෂා භේදයක් නෑ. හැබැයි ඒ හඬ හිතින් නැගිල ශබ්දයක් විදියට පිට නොවෙන්නත් පුළුවන්. ඊළඟට ඒකත් එක්ක එකතු වෙලා මනුස්සයෙක්ගෙ තියෙන ගතිය, නාම රූප ඇසුරු කරගෙන ''විඤ්ඤාණ පච්චයා නාම රූපං'' කියන සිද්ධාන්තය, ''නාම රූප පච්චයාපි විඤ්ඤාණං'' කියල අනිත් අතටත් ක්‍රියාත්මක වෙනවා. එතකොට ඊට අනුකූලව තමන් ඇසුරු කරපු නාම



රූපයන්ගෙන් වචන මාලාවක් හදා ගන්නවා. ඊට පස්සෙ බුදු අම්මෝ ... අයියෝ ... අනේ දෙයියනේ ... ආදී වශයෙන් විවිධ ක්‍රමවලින් කෑ ගහනවා. ඒ කෑ ගහන හැම ශබ්දයක්ම එන්නෙ පුද්ගලයගෙ ගති ගුණයට අනුව. ගති ගුණය වෙනස් වෙන කොට ගති හඬත් වෙනස් වෙනවා.

උදාහරණ විදියට පොඩි ළමයෙක් බය වුනාම අම්මේ ... කියල කෑ ගහනවා. ඒ භයානක විදියට. ඒ වගේම තමන්ගෙ අම්ම දැක්කම, ආ .... අම්මෙ කියල කතා කරනවා. එතකොට එතනදි නිකං කොහොමද කියල විමසීමක් තමයි කරන්නෙ. ඊළඟට සමහර ළමයි, කාලයක් යද්දි කරදඬු මහත් වුනාම අම්මෙ ... කියල අම්මට යමක් සැරෙන් කියනවා. එතකොට එන්නෙ තරහ ගතියක්. ඒ වගේම අම්ම ගැන සින්දුවක් කියන කොටත් අම්මේ කියල කියනවා. ඒ තවත් විදියක්. මේ විදියට **එකම වචනයෙන් වුනත් ඒ ඒ අවස්ථාවෙ පවතින ගති ගුණයට අනුව නගන හඬත් වෙනස් වෙනවා.** ගති ගුණය යම් ආකාරද ඊට අදාල හඬ දෙවන කාරණය වෙනවා. එතකොට ඒ හැම ගතියකම තියෙන මූලික හඬ හැම වෙලේම ආ ... ඊ ... ඌ .... ඒ ... ඕ .... කියන අනුපිළිවෙලට තමයි යෙදෙන්නෙ. ආ ... කියන්නෙ යමක් දැක්ක ගමන්ම එන හඬ. ඒ කියන්නෙ ආරම්භය. කෙනෙක් දැක්ක ගමන් ආ කොහොමද කියල අහන්නෙත් ඒ නිසා. ඊළඟට ඊ ... කියන්නෙ විමර්ශනය. මොකක්ද ඒ කියල විමර්ශනය කරනවා. ඊළඟට ඌ ... කිව්වම, ආ .... මේ අහවල් කෙනා නේද කියල යම් කිසි මූල හෝඩුවාවක් එනවා. ඊළඟට ඒ .... කියන ශබ්දයෙන් අහවල් එක නේද, අහවල් කෙනා නේද කියල කලින්ට වඩා තවත් තහවුරු වෙච්ච අදහසක් එනවා. අන්තිමට ඕ ... කියල නිගමනය පූර්ණ වෙනවා. දැන් මේ ශබ්ද 5 න් කියවෙන්නෙ ගති 5 ක්. හැම දෙයක්ම අඳුන ගන්නෙ මේ විදියට තමයි. සමහර අවස්ථාවලදි මේ ක්‍රියාවලිය අධිවේගවත් නිසා මේ 5 එකිනෙකට වෙන් කරන්න බැරි වෙන්න පුළුවන්. නමුත් ඕනම දෙයක හඳුනා ගැනීමේ මූලාරම්භය වෙන්නෙ මේ විදියට. පරීක්ෂණ, නිරීක්ෂණ, නිගමන කියන මේ 3 හැදෙන්නෙත් ඔය 5 න්. (පරීක්ෂණ - ආ ..., නිරීක්ෂණ - ඊ ... ඌ ... ඒ ..., නිගමන - ඕ ...)

මේ කියන මූලික ගතිවලට හැදිච්ච වචන තමයි ඊට පස්සෙ එන අනිත් ඔක්කොම වචන. උදාහරණ විදියට ආ .... මි .... ආ .... අම්මා. ආ .. කිව්වම ආරම්භයට මොනව හරි ලැබුණා, යමක් දැක්කා. ඊළඟට මි ... කිව්වම ඒක නිරීක්ෂණය කළා. අන්තිමට නැවතත් ආ .... කිව්වම නැවත වරක් ඒ තුළින් තවත් අලුත් දෙයක් දැක්කා. මේකත් අර කලින් ආ .... ඊ .... ආදී වශයෙන් කිව්ව ක්‍රමයෙම තවත් ක්‍රමයක්. අම්මා කියන වචනය හැදුනෙ ඔය විදියට. ඒ කියන්නෙ ඉස්සෙල්ලම පරීක්ෂණ කරල දැනුවත් වීම තුළින් තමයි නිරීක්ෂණය කරල ඒ දෙකෙන් අනුන්ගෙ ආධාරයක් බලාපොරොත්තු වෙන්නෙ. හරියට ☞

දරුවෙකුට මව වගේ. ආ .... ම් ... ආ .... වශයෙන් කොච්චර හරි යමක් අඳුන ගන්නවා, නිරීක්‍ෂණය කරනවා. එක පාරටම අපිට කවුරු හරි අඳුන ගන්න බැරි වුනොත් වික්ෂිප්ත භාවයක් ඇති වෙනවා. ඒ නිසා ආ .... ම් ..... කියන ශබ්ද ක්‍ෂණයකින් එනවා. ඒ කියන්නෙ අම්මා කියන හඬින් තමයි හැම වෙලේම දැනීමට මුල පුරන්නෙ.

ඊළඟට කොච්චර හරි තහවුරු කරනවා. ත .... ත .... ත .... කියන තහවුරු කිරීමෙන් එන තාත්තා කියන ශබ්දය තමයි තහවුරු වෙන ශබ්දය. ආ ... මේ අහවල් එක්කෙනානෙ ... මේ පියානෙ ... කියල තහවුරු කරනවා. මේ තමයි අම්ම, තාත්ත කියන වචන හැදිච්ච හැටි. අම්මගෙන් තොර ලෝකයක් නෑ කියල, අද වදපු අම්ම ගැන කිව්වත් මේ කියන්නෙ වදපු අම්ම ගැන නෙවෙයි. වදපු අම්ම තාත්ත වෙනයි. ඊට අමතරව අම්ම තාත්ත කියල දෙන්නෙක් හැම කෙනෙකුටම ඉන්නවා. ඒ තමයි මේ කියන ගති ලක්‍ෂණ.

දැන් මෙතනදි අම්ම කියන වචනය භාවිතා කරන්නෙ බොහෝ කොටම තමන්ට දිරියක් නැති වෙලාවට. එතකොට අම්ම හැම වෙලේම ආධාර වෙනවා. හරියට අම්ම ආධාර කරගෙන දරුවෙක් ජීවත් වෙනව වගේ. එතකොට මෙතනදි ආ ... ම් ... ආ ... ම් ... ආදී වශයෙන් කියන කොට මුලින් එන ආ ... කියන අදහසම තමයි නැවතත් ආ ... කියල එන්නෙ. ඒ කියන්නෙ පරීක්‍ෂණ, නිරීක්‍ෂණ විතරයි. නිගමනය කරගන්න බෑ. ඒකට ශක්තියක් නෑ. ඒ නිසා තමයි දරුවෙකුට අම්ම ඕන වෙන්නෙ. නිගමනය කළා කියන්නෙ අම්ම කියන අදහසින් ඉක්ම ගියා කියන එක. නමුත් සමහර විට වැඩිහිටි කෙනෙක් වුනත් යමක් අඳුන ගෙන ම් ... ආ ... කියල නිගමනයකට එන්න පුළුවන්. හැබැයි එතන ආ ... කියල ව්‍යවහාරයේ ශබ්දය පිට වුනාට, හැඟීම එන්නෙ අර ඊ ... ඌ ... ඒ ... ඕ ... විදියට ගිහින්. ඒ නිසා නිගමනයක් දෙන කොට ඕ ... කියන ශබ්දය හැමෝගෙන්ම පිට නොවෙන්න පුළුවන්. ආ ... කියල ශබ්දය පිට වුනාට වචන කටින් පිට වෙන්නෙ නැතිව ඕ ... ශබ්දය ඇතුලු ඉතිරි ශබ්ද ටිකත් එනවා. ඒක අධිවේගවත් නිසා අහුවෙන්නෙ නෑ. පුද්ගලයෙක්ගෙ තියෙන හැඟීම්වල දුර්වල හෝ වේගවත් බව අනුව, ඉන්ද්‍රියන්ගේ දුර්වල හෝ ප්‍රබෝධමත් බව අනුව ඒ කාරණය වෙනස් වෙන්න පුළුවන්. ඒ නිසා ඕ ... ආවොත් තනියෙන් ආධාරයක් ලබාගත්ත වෙනවා. ඒ කියන්නෙ නිගමනය කළා. ඊට පස්සෙ අම්ම ඕන වෙන්නෙ නෑ. ඒ නිසා තමයි අම්මෝ (ඕ) කියන්නෙ. ඒ කියන්නෙ යමක් සිද්ධ වුනාට පස්සෙ ඒක දැකල අත්දැකීමෙන් කියන වචනයක්. අම්මෝ මෙහෙම දෙයක් ... ආදී වශයෙන් කියන්නෙ නිගමනයකට ඇවිල්ල. බය වුනාම බුදු අම්මෝ කියල කෑ ගහන්නෙත්, යමක් දැකල ඒක භයානක දෙයක් කියල නිගමනයකට ඇවිල්ල.

මේ නිසා අම්මා කියල කියන්නෙ යම්කිසි ආධාරයක් එක්ක ඉන්නවා කියන අදහස. ඒ ගති ලක්‍ෂණ තමයි පරීක්‍ෂණය කරල නිරීක්‍ෂණයට යනකල් තියෙන්නෙ. නිගමනය කළොත් එතනදි ''ඕ'' වෙනවා. ඒ නිසා නිගමනය කරපු අය කියන්නෙ ඕම් කියල. ඕ ... ම් - ඕම්. ඒ කියන්නෙ තේරුම් ගත්තට පස්සෙ හැම වෙලේම නිගමනයකට බහිනවා. ඕ... කියල නිගමනය කළා, ම්.... කියල නැවතත්



නිරීක්‍ෂණය කළා. නැවතත් ඕ... කියල නිගමනය කළා. මේ විදියට තමයි ඕ ... ම් ... ඕ ... ම් ... ආදී වශයෙන් යන්නෙ. ඒ නිසා නිගමනය කරපු අය ආ ... කියල පටන් ගන්නෙ නෑ. පරීක්‍ෂණ කරන්නෙ නෑ. මේ නිසා තමයි මන්තරවලටත් ඕම් හෙවත් බ්‍රහ්ම ගතිය සම්බන්ධ කරල තියෙන්නෙ. මොකද බ්‍රහ්මය කියන්නෙ ලෝකයේ ලෞකිකත්වය තුළ තියෙන සියලු දේවල් දන්නවා කියන එක. එතකොට ඕ... කියන එකෙන් තමයි දැනගත්තෙ. ඕ... කියන කොට මේ අහවල් එකනෙ, අහවල් එක්කෙනානෙ කියල නිගමනය කරනවා. මේ නිසා ඒ පුද්ගලයට කියල දෙන්න ඕන නෑ. ම් ... කියල නිරීක්‍ෂණය කරල, ඕ කියල නිගමනය කරනවා. පරීක්‍ෂණ කරන්නෙ ඊට මෙහා ඉන්න අය. ඒ අය ආ ... ම් ... ආ ... ම් ... කියල අම්මත් එක්ක ඉන්නවා. එතකොට ඕම් කියන එකෙන් පෙන්වන්නෙ නිගමනය කළා හෙවත් තහවුරු කළා කියන එක. ඒ තහවුරු කිරීම තමයි තාත්ත කියල කිව්වෙ. ඒ නිසා තමයි බ්‍රහ්මයට පියා කියල කියන්නෙත්. ඒ වගේම මේ වචන පාලි භාෂාවෙත් ඔය හා සමානව හඳුන්වල තියෙනවා. ඒ අනුව පාලියෙන් තාත, අම්ම කියලත් කියනවා. ඒ වගේම මාතු පීතු කියලත් කියනවා.

ඊළඟට ඊයිය කියන්නෙ ප්‍රියමනාපය සඳහා සම්බන්ධයක් නෑ කියන එක. ඒ කියන්නෙ අප්පිරියයි කියන අදහස. ආ + ඊයිය - අයියා කියන්නෙ ඊයිය නොවන අර්ථයෙන්. ''අ'' යන්න දැම්මම ප්‍රතිවිරුද්ධ අර්ථයක් එනවා. ඒ කියන්නෙ අප්‍රිය නෑ කියන අර්ථය, අප්‍රිය නැති තැනැත්තා. ඊළඟට 'ක' කියන්නෙ කහට ගතිය, පළුදු ගතිය. අක්ක කියන්නෙ අක්‍රිය වුනා කියන එක. එතකොට පළුදු නෑ, නොගැලපෙන කහට ගතිය නෑ. එහෙම නැත්නම් ඒ ගති අක්‍රිය වුනා කියන අර්ථය තමයි අක්කා කියන්නෙ. ඊළඟට නෑ කියන අර්ථයෙන් ''මා'' කියනවා. මාහෝතු ජාති ජාතිනං ... මාමේ බාල සමාගමෝ ... ආදී වශයෙන් මා කියන්නෙත් නොවේවා, නෑ කියන අර්ථයෙන්. එතකොට ''මම'' කිව්වොත් ඒක යමක් අල්ල ගත්ත අර්ථයෙන් වෙනවා, මමත්වයෙන් ගත්ත වෙනවා. ''මා'' කිව්වොත් අල්ල ගත්තු නැති අර්ථයෙන් කතා කරන්නෙ, යමක් අල්ලගත්තෙ නැති බව පෙන්වන්න. අල්ලි කියන්නෙ අල්ල ගන්නවා. මා + අල්ලි - මල්ලි කියන්නෙ තවම අල්ල ගත්තෙ නැති කෙනා, පොඩි එකා. ඒ විදියට අල්ල ගත්තු නැති ගති ලක්‍ෂණය පෙන්වන්න තමයි මල්ලි කියන්නෙ. ඊළඟට න + අංගි - නංගි. ඒ කියන්නෙ තවම අංග, අඟපසඟ හැදිච්ච නැති පොඩි එකා, අංග පේන්නෙ නැති කෙනා. ඒ ගති ලක්‍ෂණය නිසා නංගි කියනවා.

ඒ වගේම සමාජයේ යමක් කමක් තේරුම් ගත්තු උදවිය ඉන්නවා. ඒ අය යමක් කියා දෙනවා, උපදෙස් දෙනවා. ඒ නිසා ඒ අය අන්ධ නෑ. නෑ + අන්ධ කියන එක තමයි නැන්ද වෙන්නෙ. ඊළඟට අමා .. අමා ... අමා ... ආදී වශයෙන් කියන්නෙ අමෘතය, නොමැරුණු බව. ඒ කියන්නෙ දනට ජීවත් වෙලා ඉන්න කෙනා, තමන් ජීවත් කරවන කෙනා. ඒ විදියට අමා .. අමා ... කියන එක තමයි පසු කාලීනව ශබ්දය කෙටි වෙලා මාම වුණේ.

ඊළඟට විවාහයට අර ගත්තෙ නැති වුනාම කියනවා, නෑ ආන කියල. ආන කියන්නෙ අර ගත්තා. නෑ + ආන කියන්නෙ අර ගත්තෙ නෑ කියන එක. ඒක තමයි නැනා වෙන්නෙ. ඒ වගේම මා

ආශ්‍රයට ඉන්න කෙනා තමයි මා + අස්සිනා - මස්සිනා වෙන්නෙ.

ඉස්සර ගැහැණු දරුවෙක් ඉපදුනාම දෙමාපිය ඥාතීන්ගෙ හිත දූෂ්‍ය වෙනවා. ඒ කියන්නෙ ගැහැණු දරුවන්ට කැමති නෑ. පුතාලට තමයි කැමති. දුවෙක් ඇති දැඩි කරන්නෙ කැමැත්තෙන් නෙවෙයි. දූ වුනා කියන්නෙ දූෂ්‍ය වුනා කියන එක. ඒක තමයි දුව කියන්නෙ. උදාහරණයක් විදියට කොසොල් රජතුමාට ගැහැණු දරුවෙක් ලැබුනම හිත දූෂ්‍ය වුනාලු. එතකොට බුදුන් වහන්සේ තමයි, එහෙම වෙන්න එපා, දුව වුනත් රාජ්‍යයට උදව් කරනව, මෙන්න මෙහෙම අම්ම කෙනෙක් වෙනව, හොඳ දරුවෙක් උපද්දවනව .... ආදි වශයෙන් කරුණු පැහැදිලි කරල දීල රජතුමාගෙ හිත සැනසෙව්වෙ. දැන් මේ විදියට ගැහැණු දරුවෙක් ලැබුණම, වැඩක් නෑ හම්බ වුනේ දුවක් .... ආදී වශයෙන් අදත් සමහර අය කියනවා. මොකද පිරිමි දරුවෙක් වගේ නෙවෙයි ගැහැනු දරුවෙක් හදාගන්න ගියාම ඊට පස්සෙ හැම තැනම දුවන්න වෙනවා. හැම දෙයක් ගැනම බලන්න වෙනවා. පුතෙක් හදනව වගේ පහසු නෑ. මේ විදියට දුවන අර්ථයෙනුත් දුව කියනවා.

එතකොට ගැහැණු දරුවෙක් ලැබුනයි කියල ඒ කාලෙ හිටපු රජවරුන්ට පණිවිඩකරුගෙන් පණිවිඩය එනකොටම, දුවපිය කියල පන්න ගන්නවා. ඒ කියන්නෙ පණිවිඩය දුන්නටත් කැමති නෑ. මට ඔය උත්තරේ දෙන්නද තෝ ආවෙ ? දුවපිය කියනවා. ඒ අර්ථයෙනුත් දුව කියනවා. රාහු ජාතෝ බන්ධනං ජාතං, රාහුලයෙක් උපන්නා, බැම්මක් හට ගත්ත කියල රාහුල කුමරු උපන්නට පස්සෙ බෝසතාණන් වහන්සේ ප්‍රකාශ කළා. දේශනාවෙ පෙන්වන්නෙ එහෙමයි. රාහු ළයක් කියන්නෙ වැස්මක්. ඒ කියන්නෙ ලෝකෝත්තර මගට බාධකයක්, බැම්මක් හට ගත්ත කියන එක. ඒ නිසා රාහුල කියල නම දැම්ම බව දහම් පොත්වල සඳහන් වෙනවා. මේ වගේ ගැහැණු දරුවෙක් උපන්න කිව්වම පණිවිඩය දුන්න කෙනාට දුවපිය කියල පන්න ගත්තා. ඒකෙන් දුව කියල නම හැදුණා. ඒ වගේම දුහිතෘ කියලත් කියනවා. නමුත් ඒ වචනය අද භාවිතා වෙන්නෙ නෑ. දූ හිත් තර වුනා කියන එක තමයි දුහිතෘ වෙන්නෙ. ඒ කියන්නෙ ගැහැණු දරුවෙක් උපන්නම හිත දූෂ්‍ය බවින් තර වුනා කියන එක. නමුත් කොසොල් රජතුමාට බුදුන් වහන්සේ පෙන්වා දුන්න වගේ, දුවෙක් ලැබුන කියන්නෙ දූෂ්‍ය වෙන්න කාරණයක් නෙවෙයි. මේ ලෝක සම්මතයෙන් මිනිස්සු හදාගත්තු දෙයක් නිසා, ඒ වචනෙ හැදිච්ච හැටි පෙන්වන්න විතරයි මේ කාරණය හෙළි කළේ.

පූ කියන්නෙ ආහාරය. අත්‍ර කියන්නෙ අත් කරගෙන තර කරල දෙනව කියන අදහස. ඒ කියන්නෙ ආහාරයක් අත් කරල තමන්ට තර කරල දෙන නිසා පු + අත් + තර - පුත්‍ර කියල කියනවා. පිරිමි දරුවෙක් උපන්න කිව්වම පූ කියන ආහාරය තර කරල දෙන්න කෙනෙක් ලැබුන කියල සංතෝස වෙනවා. ගොවිතැන් බත් කරල හරි හම්බ කරගත්තු ධන ධාන්‍ය ආදී සියල්ලටම තමයි පූ කියන්නෙ. දැන් ඒව ඔක්කොම පාලනය කරන්න, රැක බලා ගන්න කෙනෙක් ඉන්නවයි කියන්නෙ, තමන්ගෙ පූ කියන ආහාරය අත් කරගෙන තර කරල දෙන්න කෙනෙක් ඉන්නවයි කියන එක. ඒ නිසා තමන්ගෙ අත් බැව තර වෙනවා. තමන්ගෙ පරම්පරාව ඉදිරියට ගෙනියන්න කෙනෙක් ඉන්නවා. ඒ නිසා තමයි පුත්තර හෙවත් පුත්‍ර කියන්නෙ. එහෙම නැත්නම් පුතා කියන්නෙ. එතකොට ඒක අත් කරල තර කරල දෙන එක තහවුරු කරල දෙන්නෙ තාත්තා. තා + අත් + තා - තාත්තා. මේ ගැන කලිනුත් විග්‍රහ කළා.

ඊළඟට අර්ථවත්ව කටයුතු කරන නිසා, අර්ථය කියා දෙන නිසා අත්තා කියල නම හැදුනා. ඒ වගේම ඒ අර්ථ සම්බන්ධයෙන් අත්දැකීම් තියෙන කෙනෙක් හිටියා. ඒ නිසා ඒ අර්ථ සියල්ලම අත්දැකීම් සමග මුහු කරල කියල දුන්නා. මුහු කරපු අර්ථ ඇති කෙනා මුහු + අත්තා - මුත්තා වුනා. තවත් ටිකක් යන කොට මේ අර්ථවත් දේවල් වුනත් දැකල, ඒවායෙත් අන්තිමට ගන්න දෙයක් නෑ කියල තවත් එහාට නුවණ වැඩිච්ච කෙනෙක් හිටියා. ඔහු තමයි න + අත්තා - නත්තා වුණේ. එතකොට ඒ පුද්ගලයගෙන් මුකුත් ගන්න බෑ. මේව කරල අර්ථයක් නෑ, වැඩක් නෑ කියල ඒ ඔක්කොම අත් හදා බලල, මම මේ පැත්තකට වෙලා ඉන්නව කියල ඒ තත්ත්වයට පත් වෙච්ච කෙනා.

ඊළඟට තවත් කෙනෙක් ඒ කාරණය හරි ප්‍රාණවත්ව ඊටත් වඩා හොඳට දැනගත්තා. පුන පුනා ඒක එහෙමයි කියල දැන ගත්තා. ඒ පුද්ගලය පනත්ත වුණා. ඉන් එහාට තවත් දැනගත්තු අය කීර්තිමත් වුණා. කීර්තිය ඇති කෙනා තමයි කී + අත්තා - කිත්තා වුණේ. ඒ කියන්නෙ කීර්තිමත් අත්බැවක් ඇති කියන අදහස. ඊළඟට ඊටත් වඩා එහාට ගිහින් දැනගෙන, ක්‍රියාවෙන් කීර්තිය අත් කරගත්තු කෙනා තමයි කිරි + කී + අත්ත - කිරිකිත්ත වුනේ. ඒකෙ උපරිමයටම ගියපු තවත් කෙනෙක් හිටියා. ඒ විදියට ගිහින් ක්‍රියාවෙන් කතාවෙන් ඒ දැනගත්තු දේ භුක්ති විඳල ඒකෙ අවසානෙටම දැනගත්ත කෙනා, කිරි කාපු කෙනා කිරි කෑ මුත්ත වුණා. ඒ කියන්නෙ තවත් දැන ගන්න කිසිම දෙයක් නෑ. කිරි කෑවා කියන්නෙ සම්පූර්ණයෙන්ම ලෝකෙ යථා තත්ත්වය භුක්ති විඳල පූර්ණ කරගත්ත කියන එක. ඒ තමයි රහතන් වහන්සේ. අපේ හත්මුතු පරම්පරාව හැදෙන්නෙ මේ විදියට. ඊළඟට කාන්තා පක්ෂයත් අත්තම්මා, මුත්තම්මා, නත්තම්මා, පනත්තම්මා, කිත්තම්මා, කිරිකිත්තම්මා, කිරිකෑ මුත්තම්මා කියල අර විදියටම යනවා. නමුත් ඒක භාවිතාවෙ නැති නිසා එහෙම කියවෙන්නෙ නෑ. දැන් මේ සියල්ලම, අපේ වයස පරම්පරාව ගියා වගේම ලෝකෝත්තර විදියට තවත් පැත්තකින් ගියා නම් ඒ තමයි බෞද්ධ පරම්පරාව. මේ හැම එකකම අර්ථ 2 ක් තියෙනවා. එකක් ලෝක සම්මත අර්ථය. අනෙක තමයි මේ කියපු සැඟවිච්ච අර්ථය.

දැන් මේ විදියට මුල් කාලෙ තිබ්ච්ච මූලික ගති ගුණවලින් තමයි මේ අපේ නෑදෑ වචන ඔක්කොම හැදිල තියෙන්නෙ. **තමන්ගෙ නැති කමට ඇති අය තමයි නෑයො කියන්නෙ. දැයට හෙවත් ජාතියට ඇති අය තමයි දෑයො කියන්නෙ. මේ නෑයො සහ දෑයො එකතු වුනාම තමයි නෑදෑයො හැදෙන්නෙ.** එතකොට අම්ම තාත්ත වගේම මේ හැම නෑදෑයෙක්ගෙම තියෙන ගති ලක්ෂණ අපි ළඟ තියෙනවා. නමුත් ඒව කාලයක් යද්දි විවිධාකාරයෙන් යටපත් වෙනවා. එතකොට ඒ නිරුක්තිවලින් කියවෙන්නෙ මුල් ගති ලක්ෂණ. ඒ කියන්නෙ මේව අද ඊයෙ හැදිච්ච වචන නෙවෙයි. ආදි කල්පික බ්‍රහ්ම ලෝකෙ ඉඳල එනකොට ලෝක ආරම්භ වෙච්ච කාලෙ හැදිච්ච වචන. ඒ කාලෙ අදහසක් මුල් කරගෙනමයි පදයක් හැදුවෙ. ඒ මුල් කාලෙ කතා කරන කොට අර්ථ ඇතුවමයි කතා කළේ. ළමයින්ට ඉගැන්නුවෙත් අර්ථවත් කතා. ඒ කතා ආශ්‍රයෙන් වචන කැටි කරල තමයි පද හැදුනෙ. එතකොට යමක් කියන කොට ඒකෙ අදහස වැටහෙනවා. ඒ අදහසට අනුව තමයි ශබ්ද පදයක් හැදෙන්නෙ. ඒක කෙලින්ම ගති හඬින් හැදිච්ච පදයක්. ඒ නිසා ඒ හඬෙ ගති ගුණය තියෙනවා. ඒ තමයි මූලික ගුණය.

දැන් මේ හැම වචනයක්ම කියන කොට අපි නොදන්නව වුනාට, ඒවායෙ ඔය කියන මූලික හැඟීම් තියෙනවා. අන්න ඒ හැඟීම් මනින්නෙ කම්පනයකින්. ඒ කියන්නෙ චිත්ත කම්පනයක්. ඒ ගති ලක්ෂණයට හිමි හඬ තමයි කෙනෙකුගෙ හිතට දැනෙන්නෙ. ඒක බාහිර ශබ්දයක් නැතිව හැඟීමෙන් දැනෙන්නත් පුළුවන්. අපේ ශබ්දයත් එක්ක හෝ හැඟීමත් එක්ක චිත්ත විප්පාර නාදය නැගෙන කොට ඒක තවත් කෙනෙකුට භාෂාවක් වෙනවා. එතකොට අපි කතා කරන භාෂාව

අනිත් කෙනාට ඇහෙන හෝ වැටහෙන දෙයක්. ඒ නිසා තමයි සිවුපිළිසිඹියාපත් අයට භාෂා සිය ගණනක් කතා කරන්න පුළුවන් කියන්නෙ. හැබැයි ඒ, අපි මේ කියන ලෝක සම්මත භාෂාවන් නෙවෙයි. ලෝක සම්මත භාෂාවන් ගත්තොත් එකයි කතා කරන්නෙ. නමුත් සිවුපිළිසිඹියාපත් අයගෙ චිත්ත විප්පාර නාදය බලවත් නිසා අහගෙන ඉන්න තවත් කෙනෙකුට ඒක තමන්ගෙ භාෂාවෙන් තේරුම් ගන්න පුළුවන්. ඒ වගේ ඒක අතිසියුම් නිසා වෙනත් කෙනෙක් කියපු දෙයක් අහන්නත්, තේරුම් ගන්නත් මේ සිවුපිළිසිඹියාව උපරිමයට වැඩිච්ච අයට පුළුවන්. වෙන භාෂාවකින් කතා කළත් ඒ වචන නෙවෙයි අල්ල ගන්නෙ, හැඟීම. එහෙම නැතිව භාෂාවක් ඉගෙන ගෙන කතා කරනව නෙවෙයි. අර කියපු චිත්ත විප්පාර නාදයෙන් ලෝකයේ ඕනෑම භාෂාවක් කතා කරන කෙනෙකුගෙ ඒ කතා කරන වචනවලින් එන අදහස් අල්ල ගන්න පුළුවන්. එතකොට සිවුපිළිසිඹියාපත් ඥාන උපරිමයට වැඩිච්ච මහ රහතන් වහන්සේ නමකගෙ චිත්ත විප්පාර නාදය සාමාන්‍ය අයගෙ වගේ නෙවෙයි හරි බලවත්. මේ නිසා තමයි සිවුපිළිසිඹියාවෙන් උපරිමයටම ගියපු බුදුන් වහන්සේ සුද්ධ මාගධියෙන් කතා කරන කොට, අහගෙන ඉන්න අයට තම තමන්ගෙ භාෂාවෙන් වගේ ඇහෙන්නෙ. නමුත් අහගෙන ඉන්න අය හිතන්නෙ තමන්ගෙ සම්මත භාෂාව දැනගෙන ඒකෙන් කතා කරනවයි කියල. හැබැයි කතා කරන්නෙ එක භාෂාවයි. මොකද භාෂාවෙ වචනවල ශබ්දය නෙවෙයි ඒ ඇහෙනව වගේ දැනෙන්නෙ, හැඟීම.

දැන් එතකොට අපි යමක් කතා කරන කොට ඒ වචනයක්, හැඟීමක් ගානෙ එන අනුකූල හැඟීම් හඬක් තියෙනවා. ඒක චිත්ත ශක්තියත් එක්කයි නැගෙන්නෙ. එතකොට චිත්තය ඒ අනුව කම්පනය වෙලා ගතියට අනුව කම්පන තරංගයක් නැගෙනවා. ඊළඟට ඊට අනුව යම්කිසි හඬක්, එහෙම නැත්නම් මිහිරියාවක් එනවා. උදාහරණ විදියට වයලීනයක් වාදනය කරන කොට ඒ තත් සුසර කරල දුන්නු ප්‍රමාණයන්ට අනුව ශබ්දයක් නැගෙනවා. එතකොට සරිගමපධනි කියන මේ අකුරුවලින් එකම අකුරක් ගත්තත්, ඒ අකුරට හිමි තත සුසර කරන ප්‍රමාණයන් අනුව එකම අකුරෙන් එන හඬෙත් උස් පහත් ස්වරූපයන් තියෙනවා. ඒ නිසා එකම අකුරකින් වුනත් භයානක හැඟීමක්, ශාන්ත හැඟීමක්, දුක්මුසු හැඟීමක්, රාගික හැඟීමක් ආදී වශයෙන් විවිධ හැඟීම් නගන්න පුළුවන්. සංගීතයෙදි මේ කාරණය හොඳට පැහැදිලි වෙන දෙයක්.

මෙන්න මේ වගේ අපේ හිත හැඟීම් ගන්න කොට ඒකෙන් ගතියක් හැදිල ඊට අනුව ගති හඬක් හෙවත් කම්පනයක් නිපදවෙනවා. ඒක මූලික වශයෙන් චිත්ත කම්පනයක්. චිත්ත විප්පාර නාදය කියන්නෙත් ඒකම තමයි. එතකොට චේතෝපරිය ඥානය (චිත්ත පරියාය හෙවත් පෙළ දකින නුවණ) තියෙන කෙනෙකුට ඒ චිත්ත විප්පාර නාදය අල්ල ගන්න පුළුවන්. අනෙක් කෙනා හිතන සිතිවිල්ල අල්ලනව කියන්නෙත් ඒකෙන්. ඒ වගේම ඒ ඥානයට අමතරව, සමහර අයට තමන්ගෙ අභිඥා බලයකින් ශක්තියක්



දෙන්න පුළුවන්. ඒකෙන් යම් පුද්ගලයෙක් එල්ල කරල ඒ පුද්ගලයට යම් හැඟීමක් දෙන්න පුළුවන්. ඒකට ඒ පුද්ගලය කතා කරන භාෂාව දැනගෙන ඉන්න ඕන නෑ. එතකොට ඒ ක්‍රමයට ඈතක ඉඳන් කතා කළත් ඒ අහගෙන ඉන්න පුද්ගලයට තමන්ගෙ භාෂාවෙන් ඒක දැනෙනවා. ඒක තමයි මේ චිත්ත විප්පාර නාද ක්‍රමයේ විශේෂත්වය.


උදාහරණ විදියට අපිට යමෙක් හීනෙන් කතා කරනවා. අපි කියනව අපේ භාෂාවෙන් කතා කළේ කියල. එතකොට කවුද ඒ හීන ලෝකෙ ඉඳගෙන අපේ භාෂාවෙන් කතා කළේ ? මේ වගේ අත්දැකීම් හැමෝටම තියෙනවා. ඇත්තටම මෙතනදි අපේ භාෂාවෙ වචනවලින් කතා කළා නෙවෙයි, හැඟීමක් එන්නෙ. අපේ හැඟීමක් බල ගැන්වුනාම අපි කතා කරන භාෂාවෙන් වගේ තමයි ඒක අපට දැනෙන්නෙ. මොන ජාතියෙ පුද්ගලයෙක් වුනත් ඒ හැඟීම පොදුයි. ඒ නිසා තමයි තමන්ගෙ භාෂාවෙන් කතා කළා වගේ දැනෙන්නෙ. සමහර වෙලාවට, සමහර අයට අපි කතා කරන සාමාන්‍ය භාෂාවෙන් අමනුස්ස ආදී විවිධ කොටස් කතා කරනවා. නමුත් ඇත්තටම ඒ අය අපේ භාෂාවක් කතා කරනව නෙවෙයි, ඒ හැඟීමක් තමයි දෙන්නෙ. දේවතාවො හැඟීම් දෙන්නෙත් එක්තරා මාගධී භාෂා ක්‍රමයකට. විශේෂයෙන් බ්‍රහ්මයො කතා කරන්නෙ සුද්ධ මාගධී භාෂාවෙන්. ඊට පහළ ඉන්න ගන්ධබ්බ කොටස් වුනත් තම තමන් මනුස්ස වෙලා හිටපු කාලෙ භාවිතා කරපු භාෂාවෙන් කතා කරන්න පුළුවන්. ඒ වුනත් ඒක තවත් කෙනෙකුට ඇහෙන්නෙ අර හැඟීම් භාෂාවෙන්. ඒ නිසා තමයි කියන දේ වැටහෙන්නෙ.

ඒ වගේම **යමෙකුගෙ ගති ගුණය අනුව ඊට හිමි වන වර්ණයත් වෙනස් වෙනවා.** උදාහරණ විදියට ප්‍රසාද ගතියක් තියෙන කොට කෙනෙකුගෙ ඕරා වළල්ල සුදු දීප්තිමත් පැහැයක් ගන්නවා. ගතිය රෞද්‍ර නම් වර්ණය රතුයි. මෝහ නම් අඳුරු පාටයි. යමෙකුට රාගික හැඟීමක් ඇති වෙන කොට එක්තරා මට්ටමක තරහ නොවන ඇලුම්කාරී ස්වභාවයකට තරඟකාරීත්වයක් ඇති වෙනවා. ඒක තරඟකාරී ආස්වාදජනක පෙළඹවීමක්. එතකොට එන්නෙ රෝස පාට. දැන් මේ විදියට වර්ණ ස්වභාවයෙනුත් කෙනෙකුගෙ හිතේ ස්වභාවය මොන වගේද කියල බලාගන්න පුළුවන්. ඒ වගේ **හදවතේ ලේවල පාට බලල කෙනෙකුගෙ හිත කියන්න පුළුවන් ක්‍රමයකුත් තියෙනවා.** මොකද හදවතේ වස්තු රූපය ඇසුරෙමයි හිත ක්‍රියාත්මක වෙන්නෙ. එහෙම ක්‍රියාත්මක වෙන කොට ඒක ඇසුරු කරගෙන වර්ණයක් ඇති වෙනවා. දිවැස් තියෙන කෙනෙක් ඒ වර්ණය යොමු කරල බැලුවොත් ඒ පුද්ගලයගෙ හිතේ ස්වභාවය කියන්න පුළුවන්. එතකොට චේතෝපරිය ඥානය නැති වුණාට ඒ ක්‍රමයෙන් හිතේ හැටි කියන්නත් පුළුවන්. මෙන්න රාග හිතක් පහළ වෙලා ඉන්නෙ, දැන් ද්වේශයෙන් ඉන්නෙ, මේ අභ්‍යන්තරයෙන් බොරුවක් කරන්නෙ ... මේ ආදී වශයෙන් ස්වභාවය දකින්න පුළුවන්.

ඒ වගේම **ගති රුව ගත්තොත් මුහුණෙ ඉරියව්, අංග චලනයන් පවා ඒ අවස්ථාවෙ ඒ පුද්ගලයගෙ ගති ගුණයට අනුකූලයි.** ඒ විදියට දේහ ලක්‍ෂණ, අංග චලනයන්, ඉරියව් ආදිය අල්ලගෙන ගති ගුණ කියන්නත් පුළුවන්. විශේෂයෙන් සමහර පොලිස් පරීක්‍ෂකවරු එක්තරා මට්ටමකට මේ ක්‍රමය හොඳට පුරුදු පුහුණු කරල තියෙනවා. කොච්චර පොළවෙ හැපි හැපි කිව්වත් මං මේ වැරැද්ද කළේ නෑ කියල, කෙනෙක් දිහා බලල බාහිර ඉරියව්වලින් ඒ පුද්ගලය හොරෙක්ද, මිනීමරුවෙක්ද ආදී වශයෙන් කියන්න පුළුවන්. එතකොට ඒ පුද්ගලයට ඒ ස්වභාවික ඉරියව්වලින් ඉවත් වෙන්න බෑ. පුද්ගලය යමක් වසන් කරනව නම් ඒකත් අංග චලනයෙන්, ඉරියව්වලින් කියන්න පුළුවන්. ඇත්තක් කියනව නම් ඒකත් අහු වෙනවා. මේ නියම ක්‍රමය දන්න පරීක්‍ෂකවරු කවදාවත් නිර්දෝෂී පුද්ගලයන්ට ගහන්න බනින්න යන්නෙ නෑ. ඒ පුද්ගලය කපටියෙක්ද නැද්ද, මේ බයටද කියන්නෙ ආදී වශයෙන් දකින්න පුළුවන්.

උදාහරණ විදියට කෙනෙක් හිත ඇතුලෙ කැකෑරි කැකෑරි, හිතේ තියෙන අදහස් කියන්න උත්සාහ කරන කොට කකුලෙ මහපට ඇඟිල්ලෙන් පොළවෙ අඩ රවුම් අඳිනවා. එතකොට කියා ගන්න බැරි ආස්වාද බලාපොරොත්තුවක් හිත ඇතුලෙ තියෙනවා. ඒ අවස්ථාවෙදි ඒ පුද්ගලය කතා කළොත්, ගති හඬෙත් ඒ ලක්‍ෂණ තියෙනවා. ඊළඟට හිතේ කැකෑරි කැකෑරි කියා ගන්න බැරි දුකක් කරදරයක්, නැති බැරිකමක් තියෙනව නම් මහපටැඟිල්ලෙන් පොළව හාරනවා. ඒ වගේම යම්කිසි තර්කානුකූල දෙයක් විමර්ශනය කරන කොට, එහෙම නැත්නම් ප්‍රශ්නයකට උත්තර හොයන කොට පොළවෙ ඉරි අඳිනවා. දැන් මේ කාරණය ඔප්පු වෙන තැනක් දහමෙත් සඳහන් වෙනවා. වසවර්ති මාරයා බුදුන් වහන්සේගෙ අඩුපාඩුවක් හොයාගන්න බැරිව හය අවුරුද්දක් පස්සෙන් ගිහින්, අන්තිමට බැරි වුනාම බේලුව පණ්ඩු වීණාවත් කිහිල්ලෙන් දන්නෙම නැතිව ගිලිහිලා ගියා. ඊට පස්සෙ කෝටු කැල්ලක් අරගෙන පොළවෙ ඉරි ඇඳ ඇඳ කල්පනා කළාලු. ඒ කියන්නෙ බුදුන් වහන්සේ පරාජය කරන්න තමන්ට මොකවත්ම ක්‍රමයක් නැද්ද කියන අදහසින් ඒ ප්‍රශ්නාර්ථයට විසඳුමක් තමයි කල්පනා කළේ. දැන් මේ කාරණයෙන් පැහැදිලිව පේනවා මේ ඉරි ඇඳීමේ ලක්‍ෂණය යම් ප්‍රශ්නාර්ථයකට හෝඩුවාවක්, පරීක්‍ෂණයක් කරන්න කල්පනා කරන කොට හිතේ තියෙන ඒ ගති ස්වභාවය ඉරියව්වලින් එන හැටි.

ඒ වගේම අහංකාර පුද්ගලය හැම වෙලේම විලුඹෙන් පොඩ්ඩ පොඩ්ඩ ඉස්සෙනවා. එහෙම ඉස්සි ඉස්සි කතා කරනවා. තමන්ගෙ උසස් බව, අහංකාර බව, ලොකුකම, ආඩම්බරකම පෙන්වන්න තමන් නොදැනුවත්වම අර වගේ ඉරියව් එනවා. ඒ වගේම සමහර අය කතා කරන කොට කලිසම් සාක්කුවට අත යන්නෙත් මේ වගේ ගති ලක්‍ෂණ තියෙන කොට. සමහර අය කතා කරන කොට වචනවල කිසිම ස්ථිරත්වයක්, විශ්වාසයක් නෑ. එතකොට වැනි වැනී කතා කරනවා. මොනව හරි බයාදුකමකට යමක් හංග



ගෙන වෙනත් දෙයක් කතා කරන කොට ඔලුවෙ පිටිපස්ස කහ කහ කතා කරනවා. ඊළඟට තමන්ට හෝ තමන්ගෙ පවුලේ අයට කන්න බොන්න යමක් ලබා ගන්න ක්‍රමයක් නැත්නම් ඒ වෙලාවට බඩ අත ගගා කතා කරනවා. ඒ වගේම ලෙඩක් දුකක් කරදරයක් වුනාම මිල මුදල් ආදිය නැත්නම්, කතා කරන කොට පපුව දිහාවට තමයි අත යන්නෙ. ඉතින් පපුව අත ගගා කතා කරනවා. ඊළඟට කෙනෙකුට ගරු බියක් පෙන්වන කොට දණ හිසට අත් දෙක තියාගන්නවා.

මේ විදියට තමන් නොදැනුවත්වම ශරීරයෙන් ගතිය මතු වෙනවා. ඒක බාහිරට විද්‍යමාන වෙනවා. මේ වගේ විවිධ ගතිවලට අනුව විවිධ ඉරියව් නැගෙනවා. අදහස හංගන්න හැදුවට ඒ ඉරියව් හංගන්න බෑ. කෘතීමව පාලනය කරගන්න බෑ. එහෙම පාලනය කරන්න හැදුවත් ඒවා වෙනත් විදියකින් කොහොම හරි ක්‍රියාත්මක වෙනවා. කට බොරු කිව්වත් දිව බොරු කියන්නෙ නෑ කියල කියන්නෙත් මේ වගේ අවස්ථා පෙන්වන්න. ඒ නිසා ඒ හැම ඉරියව්වකම සැඟවිච්ච ගති ලක්‍ෂණයක් තියෙනවා. දැන් මේ ගති රුව වගේම ගති හඬත් ඒ ගති ගුණයට අනුවම පිටවෙනවා. කතා කරන හඬේ ස්වභාවයෙන් ගතිය කියන්න පුළුවන්. ඒ වගේම මුහුණු ස්වරූපයෙන් (ගති රුවින්) කියන්නත් පුළුවන්.

ඊළඟට **කටින් පිට වෙන්නෙ නැති, ගති රුවින් අල්ලගන්නත් අමාරු බොහෝ සූක්‍ෂම අදහස් අල්ල ගන්න තියෙන්නෙ, හිතෙන් පිටවෙන චිත්ත විප්පාර නාදයෙන්. ඒක අර සියල්ලටම වඩා බලවත්. හරියටම එල්ල කරල කියන්න පුළුවන් අහවල් අදහස, අහවල් ගතිය කියල.** ඒ ක්‍රමය තමයි සාමාන්‍ය කෙනෙකුට අල්ලන්න අමාරු. එතකොට ඒ හැඟීම් දෙන්න හැදිල තියෙන වචනවල ස්වභාවයත් ගති ගුණයට, ගති හඬට, ගති රුවට අනුකූලව අනුලෝම ප්‍රතිලෝම වශයෙන් පුරුදු පුහුණු කළොත්, යම් ශබ්දයක් ඇහෙන කොටම ඒක මෙහෙම ගතියක එකක් කියල දැනෙන්න පටන් ගන්නවා. ඒක හුඟක් අති තීක්‍ෂණ වුනොත්, තමන් දන්නෙම නැති භාෂාවකින් කවුරු හරි කතා කළත්, ඒ කතා කළේ අහවල් දේ හඳුන්වන්නයි කියල ඒ හැඟීම දැනගන්න පුළුවන්. වචන දන්නෙ නැති වුනත් මේ වගේ අදහසක් කියල කියන්න පුළුවන්. ඒ වගේම ගති රුව බලලත් හැඟීම මොන වගේද කියල කියන්න පුළුවන්.

එතකොට යම් වචනයක නිරුක්තිය කියන්නෙ ඒ වචනයෙන් කියවෙන මූල අදහස. ඒ නිසා ඒ නිරුක්තිය ඇතුලෙ ගති ගුණ, ගති හඬ තියෙනවා. ඒ වගේම ඒ වචනයෙන් කියවෙන ද්‍රව්‍ය පදාර්ථයට හෝ සත්වයාට ඊට අදාල ගති රුවක් තියෙනවා. දැන් මේ කාරණය නවීන විද්‍යාවෙන් පවා ලෞකික වශයෙන් ඔප්පු කරල තියෙනවා. විද්‍යා විෂයන් හදාරණ, ඒ ක්ෂේත්‍රවල නියැලිලා ඉන්න පිංවතුන්ට දහම් අවබෝධය ලබාගන්න පහසුවෙන්න මේ කරුණු කාරණා බොහෝ වැදගත් වෙනවා. ඒ විදියට විද්‍යානුකූලව ඔප්පු කරපු අවස්ථා සම්බන්ධයෙන් තොරතුරු මීළඟ කලාපයෙන් බලාපොරොත්තු වෙන්න.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

**අභයරතනාලංකාරය - 26**



# දේව රැකවරණය සහ අග්‍ර සඝ්‍ය කොටසින් දන් දීම සම්බන්ධයෙන් සත්‍ය අත්දැකීම්

*(පසුගිය කලාපයෙන් - ලෝක විනාසයට බියෙන් පළා ගිය දෙව් බඹුන් සහ බුද්ධ රැකවරණය)* - **වහරක අභයරතනාලංකාර හිමි**

මේ මනුස්ස ලෝකයේ මිනිස්සු කතා බහ කරන දේවල් යම් යම් අමනුස්ස කොටස් හරහා, වෘක්ෂ දේවතාවන් හරහා එහෙම නැත්නම් චිත්ත පරිවිතර්ක අල්ලගෙන ඒ හරහා ඉහළ දේව මණ්ඩලවල ඉන්න ලෝක පාලක දෙවි දේවතාවන්ට යන ක්‍රමයක් තියෙන බව පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. ඒ වගේම යම්කිසි දේවාලයකට ගිහින් දේව පූජාවක් තියල, අදාල කාරණය අධිෂ්ඨාන කරල කියන කොටත් ඒක දෙවි දේවතාවන්ට ඇහෙනවා. අද වුනත් දේවාලවල කෙරෙන පුද පූජාවලදි එහෙම ඒවා නැතුව නෙවෙයි. නමුත් දෙවියන්ගෙන් වුනත්, ඉල්ලන්නන් වාලෙ යමක් ඉල්ලුවට ලැබෙන්නෙ නෑ. ඒකටත් ක්‍රමයක් තියෙනවා. ඒ ඉල්ලීම සාධාරණ හේතු සහිත නම්, ඒ වගේම දෙවියන්ට ඉටු කරල දෙන්න පුළුවන් දෙයක් නම්, කළ යුතු දෙයක් නම් දෙවියන් විසින් ඊට අනුකූලව කටයුතු කරනවා. එහෙම ක්‍රමයක් මේ ලෝකෙ ක්‍රියාත්මක වෙනවා.

උදාහරණ විදියට සක්‍ර දෙවියන්ගෙ සුදම් සභාව කියන දේව සභාවෙදි, ඒ දෙවියන් රැස් වෙලා පසළොස්වක, අමාවක, පුර අටවක, අව අටවක වශයෙන් කියන හතර පෝයට, අදාළ දේව දූතයන් මේ මනුස්ස ලෝකයට එවල දෙමාපියන්ට සත්කාර කරන, දැහැමින් අඹු දරුවන් පෝෂණය කරන, පංච දුශ්චරිතයෙන් වෙන් වෙලා දැහැමින් සාමයෙන් ජීවත් වෙන පිංවත් උදවිය ඉන්නව නම්, ඒ අය ගැන හොයල බලල රැකවරණය සලසන ක්‍රමයක් තියෙනවා. ඒ බව දහමෙත් පැහැදිලිව සඳහන් වෙනවා. කොහොම හරි ඒ වගේ පිංවත් පිරිස් හොයා ගන්න ක්‍රම දෙවියන්ට තියෙනවා. එහෙම හොයාගෙන දේව මණ්ඩලයට ඒ අය ගැන දැනුම් දීල ඒ අයව ආරක්ෂා කරනවා. මෙන්න මේ අහවල් ගමේ, අහවල් ස්ථානයේ, අහවල් නම තියෙන පුද්ගලයා මෙන්න මෙහෙම කෙනෙක්, වහාම ඒ පුද්ගලයට රැකවරණ සලසන්න, ඒ පුද්ගලයා අපිට ඕන කෙනෙක්, අපි කරා එන්න ඉන්න කෙනෙක්, ඒ පුද්ගලයා දුසිරිතට, කරදරයකට වැටෙන්න දෙන්න එපා, හිත දූෂ්‍ය වෙන්න දෙන්නෙ නැතිව පුළුවන් තරම් රැකවරණ සලසන්න කියල ඉහළ දේව මණ්ඩලවල උපදෙස් පරිදි ඒ අයට රැකවරණ සලසනවා. ඒකට වෙනම දේව මණ්ඩලයකුත් පත් කරල තියෙනවා. ''දේවතා රක්ඛන්ති'' කියල මේ වගේ ක්‍රමයක් තියෙනවා. (මේ සම්බන්ධ වැදගත් කරුණු කිහිපයක් 20 වන කලාපයේ පළවුනු ''සිවුවනක් පිරිසගේ ආරක්ෂාව සඳහා අනුමත වුනු ආටානාටිය'' නම් ලිපිය යටතේ ඉදිරිපත් කර ඇත.)

ඉතිං බැරි වෙලා හරි එහෙම පුද්ගලයෙක්, ''අනේ මට මෙහෙම කරදරයක් වෙලා තියෙනවා. මේ මොකක්ද මට වෙන්නෙ...'' ආදී වශයෙන් කියන කොට, තමන් පත් වෙලා ඉන්න කරදරය මොන ක්‍රමයකින් හරි දෙවියන්ට දැන ගන්න ලැබුණොත්, ඒ පුද්ගලයගෙ හිත ඒකෙන් කොයි පැත්තටද යන්නෙ කියල හොයල බලල ඒ අනුව රැකවරණ සලසනවා. මේ විදියට දැහැමි පුද්ගලයෙකුට අසාධාරණ විදියට දුක් කම්කටොලුවලට මුහුණපාන්න සිද්ධ වුනොත්, ඒක ඉවසන්න බැරිව අර වගේ ප්‍රකාශ කරනව නම්, ඒ වගේ වෙලාවට දේවතාවො ක්‍රියාත්මක වෙනවා. ඒ අයගෙ හිත උණු වෙනවා. මෙච්චර වැදගත් පුද්ගලයෙක් කාලකණ්ණි අය නිසා අසත්පුරුෂ ගතියකට වැටුණොත් එහෙම, අපි කරා එන්න ඉන්න පුද්ගලයෙක් නැවතත් දුගතියකට යන්න පුළුවන්. අපරාදෙ අපිට එන්න ඉන්න පුද්ගලයෙක්නෙ ! අපේ ගොඩේ කෙනෙක්නෙ ! ඒ නිසා කොහොම හරි රැකල අපේ පැත්තට ගමු... මේ ආදී වශයෙන් කතා කරල ඒකට රැකවරණ යොදනවා. මොකද ඒ වගේ අය මරණින් මතු දේවත්වයට යන බව ඒ අයත් දන්නවා. ඉතිං තමන්ගෙ පිරිස වැඩි කර ගන්න ඒ අයත් කැමතියි. අභයරතනාලංකාර හිමියන්ගෙ අත්දැකීම් සහිත මේ කාරණය ඔප්පු වෙන වැදගත් සිද්ධියක් තමයි දැන් මේ හෙළිදරව් කරන්නෙ.

පූගොඩ කියන ගම් ප්‍රදේශයේ මම දන්න කියන එක්තරා වැදගත් බෞද්ධ ගති ලක්ෂණ තියෙන හොඳ උපාසක මහත්තයෙක් හිටියා. ඒ මහත්තය රජයේ රස්සාවක් විදිහට කළේ කන්තෝරුවේ ලියුම් බෙදන එක. ඉතිං වැඩ රාජකාරි කරල ඉතිරි වෙන වෙලාවෙ දැහැමිව කඩයක් කරන්නත්, ගොවිතැන් බත් කරන්නත් පුරුදු වෙලා හිටියා. ඒ අතර තමන්ගෙ ගෙවත්තේ බුලත් කොටුවකුත් හැදුවා. ඒකෙ කැන්ද කොළ වගේ මහ විසාලෙට බුලත් කොළ හැදුණා. හොඳට සරුවට තිබ්බ්ච මේ බුලත් කොටුවෙන් දවසක් බුලත් කොළ කඩන්න බලනකොට, ඔක්කොම ටික කවුරුහරි කඩාගෙන ගිහින් තිබුණා. බුලත් කොළ දහස් ගණනක්. ඉතිං කඩපු කෙනෙක් හොයා ගන්නත් නෑ. දැන් හිතට හරි සංවේගයක්. මෙච්චර මේ කිසිම කෙනෙකුට කරදරයක් නැතිව දැහැමින් කටයුතු කරද්දිත්, ඇයි මේ මගේ ඒව හොරකම් කරන්නෙ ? මොකක්ද මේ වෙන්නෙ ... ? මේ ආදී වශයෙන් මේ මහත්තය බොහොම සංවේගයෙන් කතා කරන්න ගත්තා. හැබැයි බුලත් ටික කඩා ගත්තු දවසට පහුවදා ගමේ පොළ. ඒකත් ඔහු දැනගෙන හිටියා. ඒ නිසා කොහේවත් හොයන්නෙ නැතිව, ඔහු ඊට පහුවදා උදේ පාන්දරින්ම පොළට ගියා. යනකොට පාන්දරින්ම බුලත් වෙළෙන්දෙක් මිල දී ගත්ත බුලත් වගයක් තියෙනව දැක්කා. ඒ තමන්ගෙ කොරටුවේ බුලත් කියල කොළවලින් අඳුනගෙන, කවුද මේක උදෙන්ම ගෙනාවෙ කියල අර වෙළෙන්දගෙන් ඇහුවා. ඒ වෙළෙන්දත් දන්න කෙනෙක්ගෙ නමක් කියල ☞

අහවල් කෙනා ගෙනත් දුන්න කියල කිව්වා. දන් බලනකොට මේ ගමේ ගස් ගෙඩි කඩල හොරකම් කර කර නිකං ඉන්න මිනිහෙක්. ඒ මිනිහ තමයි මේ වැඩේ කරල තියෙන්නෙ.

දන් මේ මහත්තය මුකුත් නොකිය ගෙදර ඇවිත්, බුලත් කොටුව ළඟ ගොක් කොළවලින් පොඩි පහන් පැලක් හදල පහනක් පත්තු කරල ''දෙවියනේ දෙවියො බලා ගන්න මේ අසාධාරණේ ! '' කියල මෙහෙම කිව්වා. එච්චරමයි කිව්වෙ. සාප කළෙත් නෑ. වෙන මුකුත් කිව්වෙත් නෑ. තමන් දන්න ක්‍රමයකින් ඒ විදිහට දෙවියන්ට දනුම් දුන්නා. මේ විදිහට දවස් දෙක තුනක් එක දිගට පහන තිව්වා. තුන් වෙනි දවසෙ මේ මහත්තය ලියුම් බෙදන්න යනකොට ආරංචි වුණා, අර මනුස්සයට නයෙක් දෂ්ට කරල කියල. කොහෙදිද දෂ්ට කරල තියෙන්නෙ කියල බලනකොට, අර තමන්ගෙ බුලත් කොටුව තියෙන වත්ත ඇතුළෙදිමයි. මොකද ඒ වත්තෙ හොඳට පොල් හැදිච්ච පොල් ගහකුත් තිබුණා. අර මනුස්සය බුලත් හොරකං කරපු පුරුද්දට ඊට පස්සෙ දවසක මේ ගහේ පොල් ටිකත් කඩා ගන්න ඇවිත් තියෙනවා. ඉතිං පැහිච්ච පොල් වල්ල හොයා ගන්න, පොල් ගහ මුදුන බලාගෙන මේ මනුස්සය පිටිපස්සෙන් පස්සට ගිහින් තිබුණා. එහෙම පස්සට යනකොට තමයි පිටිපස්සෙ නයෙක් ඉඳල පෑගිලා දෂ්ට කරල තියෙන්නෙ. නයා දෂ්ට කළාට පස්සෙ මේ මනුස්සයගෙ ඇස් රතුවෙලා අන්තිමට සිහිමුර්ජා වුණා. දන් මේක ආරංචි වුණා විතරයි, අර මහත්තය පහන් පැල ළඟට ගිහින්, අනේ දෙයියනේ මේ මනුස්සය මරන්න එපා ! ඒ මනුස්සයගෙන් මට කරදරයක් වෙන එක විතරක් නවත්තල දෙන්න ! දෙයියො මේ මනුස්සයට සමාව දෙන්න... ආදී වශයෙන් මෙහෙම කියල නැවතත් දෙයියන්ට පහනක් තිව්වා. ඒ පාර කොහොම හරි වෙදකම් කරල මේ මනුස්සයට සිහිය ආවා. සිහිය ඇවිත් සනීප වුණාට පස්සෙ මනුස්සය ගමෙන් ගියා ගියාමයි ආයෙ ගම් පළාතටවත් ආවෙ නෑ. ගම අත්හැරල යන්න ගියා.

දන් මෙතනදි පැහැදිලිව පේනවා දේවතා රක්ඛන්ති කියන කාරණය. ඒකෙන් අර මහත්තයට කරදරයක් වෙන්න, හිත දූෂ්‍ය වෙන්න ඉඩ තිව්වෙ නෑ. වෙන කෙනෙක් නම් ''මම ඕකට ගහනව, ඕකව මරනව...'' වගේ අදහස් එන්න පුළුවන්. ''මෙච්චර දූහැමින් සාධාරණයෙන් කටයුතු කරන මට මෙහෙම දෙයක් කළානෙ, මං ගැන දෙයියොවත් බලන්නෙ නැද්ද ...'' ආදී වශයෙන් කියල මනුස්සයො වික්ෂිප්ත වෙන්න පුළුවන්. එහෙම අදහස් තමයි මේ වගේ අවස්ථාවකදි හුඟ දෙනෙකුට එන්නෙ. නමුත් අර මහත්තයගෙ වැදගත්කමක් තිබිච්ච නිසා තමයි දේවතා රැකවරණය ලැබුණෙ. ඕක මැරිල පලයං කියල සාප කරන්නෙ නැතිව, ඒ මනුස්සයටත් කරදරයක් වුණා කියල ආරංචි වෙච්ච ගමන්ම තවත් පහනක් පත්තු කරල, ඒ මනුස්සයවත් ආරක්ෂා කරල දෙන්න කියල ඉල්ලුවා. ඉතිං ඔහු ළඟ තිබිච්ච ඒ ගුණ ධර්මය ඒකෙන් හොඳට පැහැදිලි වෙනවා. එහෙම කෙනෙක් දේවත්වයට සුදුසුයි. දේවතාවොත් ඒ කාරණය දන්න නිසා රැකවරණය සැලසුවා. ඊට පස්සෙ ඒ මහත්තයගෙ ගොවිතැන් වගා කටයුතුවලට කරදරයක්, බාධකයක් ආවෙ නෑ. කවුරුවත් කඩන්න,



බිඳින්න ආවෙත් නෑ. හොඳින් ගොවිතැන් කරගෙන ගියා. අර මනුස්සයට හොරකමට දඬුවමකුත් ලැබුණා. හැබැයි මළෙත් නැතිව ජීවිතයත් බේරුණා. ඉතිං මේ වගේ සිද්ධි අපි දන්නෙ නැතිවට අදත් වෙන්න පුළුවන්.

ඒ වගේම මීට ඉහත කලාපයකින්, එක කන්නයකින් අග්‍ර සශ්‍ය දාන 9 ක් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට පිදීමෙන් මහා සශ්‍රීකත්වයක් ලබන්න පුළුවන් ක්‍රමයක් මේ බුදු සසුන තුළ තියෙන බව පැහැදිලි කරල තිබුණා. ඒකම නැතත් ඒ වගේ මම දූනුවත් වෙච්ච සිද්ධියක් තමයි දන් මේ කියන්න යන්නෙ. ඒ කාලෙ අපේ වත්තෙ කර්තකොලොම්බන් කියන අඹ ගහක් තිබුණා. ඒකෙ ගෙඩි හොඳට හැදුණත් ඉදෙන්න ඉස්සෙල්ල නරක් වෙලා වැටෙනවා. ගහේ තිබිල ඉදිල කන්න අවස්ථාවක් එන්නෙ නෑ. පණුවො විදල බිම වැටෙනවා. ඉතිං දවසක් ඔය ගහ මුලදී මම කිව්ව, මේ පාර අඹවලින් අග්‍ර සශ්‍ය කොටස වෙන් කරල බුද්ධ පූජාවක් තියනවයි කියල. හැබැයි මීට පෙර එහෙම කියල තිබුණෙ නෑ. ඔහොම කියල මාස දෙකක් විතර ගියාට පස්සෙ, දවසක් මම අඹ ගහ ළඟට ගියා. ඒ අඹ හැදීගෙන එන කාලෙ. ගහ ළඟට යනකොටම අර තිබිච්ච අඹ ගැට අතරින් අඹ ගෙඩියක් වැටුණා. බලනකොට හොඳට ඉදිච්ච, කිසිම පළුද්දක් නැති, සතෙක්වත් හොට ගහල නැති පිරිසිදු අඹ ගෙඩියක්. එතකොට අර හැදීගෙන එන අඹ පොකුරෙම ඒ ගෙඩියත් තිබිල තියෙනවා. ඒ අඹ පොකුරෙම අසාමාන්‍ය විදියට හැදිච්ච ගෙඩියක්. මෙච්චර කාලෙකට සතෙක්වත් හොට ගහල නැති එක හරි පුදුමයක්. මීට පෙර ඒ ගහේ මේ විදිහට අඹයක් ඉදිලත් නෑ. මේක සිද්ධ වුණේ මම පොල්ගහවෙල විශේෂ බෝධි පූජා පවත්වමින් සෙත් ශාන්ති කරමින් හිටපු කාලයක. ඒ නිසා ඒ වගේ පූජා අවස්ථාවකදි, මෙන්න මේ අග්‍ර සශ්‍ය අඹයත් කපල බුද්ධ පූජාවට තියමු කියල, මම ඒ පූජා කටයුතු සම්බන්ධ පිංවත් පිරිසට කිව්වා. ඉතිං ඒක කපල බලනකොට ඇතුළ තනිකරම රන්වන් රතු පාටයි. හොඳට ඉදිල එක පණු මාත්‍රයක්වත්, කළු ලපයක්වත් වැදිල නෑ. සම්පූර්ණයෙන්ම පිරිසිදු අඹ ගෙඩියක්. කොහොම හරි ඒ ගෙඩිය මටම අහු වුණු නිසා, අර වගේ බුද්ධ පූජාවට තියන්න පුළුවන් වුණා. හිතෙන් අර වගේ සිතිවිල්ලක් ඇවිත් වචන ප්‍රකාශ වෙනවත් එක්කම ඒකට අවශ්‍ය පරිසරයත් සකස් වුණා.

මේ වගේම අත්දකීමක් ඒ කාලෙ මම ගොවිතැන් කරන කොටත් සිද්ධ වුණා. වතාවක් මම කුඹුරක් කෙරුවා. ඒකෙ පැළ කළේ LD 66 කියන තුන් මාසෙ වී වර්ගයක්. හැබැයි දේශීය නෙවෙයි, කෘතිම විදිහට පරාග පෝෂණයෙන් හදපු දෙමුහුම් එකක්. ඒව හදන්න නම් අනිවාර්යෙන්ම කෘතීම බෙත් වර්ග, පොහොර වර්ග ගහන්න ඕන. එහෙම නැත්නම් හැදෙන්නෙ නෑ. මම වැඩ කරපු කුඹුරත් බෙත්, පොහොර ගහන්නෙ නැතිව හරි අස්වැන්නක් ගන්න බැරි වුණා. මේ නිසා මේකෙන්වත් වතාවක් අත්හදා බලන්න ඕන කියල මට හිතුණා. ඒ නිසා මේකෙ අග්‍ර සශ්‍ය කොටසින් බුද්ධ පූජාව සහිත සාංඝික දානයක් දෙනවයි කියල කුඹුර වපුරන කොටම මම අධිෂ්ඨාන කරල පොරොන්දුවක් වුණා. කිසිම වල් නාශකයක්, කෘමි නාශකයක්, කෘතිම පොහොරක් ගැහුවෙත් නෑ. අඩු ගානෙ අර මීට පෙර හෙළි කරපු, බනේන අග්ගිං ජලමානනාය ... ආදී වශයෙන් කියන ගාථාවෙන් වතුර සෙත් කරලවත්

ගැහුවෙ නෑ. හැබැයි කිසිම උපද්‍රවයක් ආවෙත් නෑ. මම ඒක ලාභයක් බලාපොරොත්තුවෙන් නෙවෙයි කළේ. තත්වෙ බලා ගන්නමයි කළේ. අන්තිමට කිසි කරදරයක් නැතිව හොඳට ලස්සනට ගොයම පීදිලා ආවා. හැබැයි ඉතිං පොඩි කුඹුරක්. ඒ වුණාට මට අවශ්‍ය වුණේ මේකෙ තත්වෙ කොහොමද කියල බලා ගන්න විතරයි. ඉතිං මැස්සො විදලත් නෑ. කීඩෑවො ගහලත් නෑ. අන්තිමට බලනකොට මහ විසාල අස්වැන්නක් ලැබුණා. ඒ ලැබීම විශේෂයක් වුණා. මොකද මේ හදන්න බැහැයි කියල තිබ්ච්ච කුඹුර මේ ක්‍රමයට සාර්ථක වුණා. මේ හැදිල රැකෙන්නෙ නැති එක, ශාසනය උදෙසා කියල අධිෂ්ඨානයක් කරලවත් හැදෙනවද කියල බලන්නයි මට අවශ්‍ය වුණේ. ඒ කියපු වගේම කිසි කරදරයක් නැතිව හැදිල රැකුණා.

මේ ගොයම් ගහේ කොළ පහයි එන්නෙ. ඒක බොහොම පුංචි ගොයම් ගහක්. පස්වෙනි කොළේ තමයි පීදිලා ලොකු වෙන්නෙ. ඒකත් එක්ක එන්නෙ ගොයම් මල. ඒකෙන් වැඩිකල් නොගිහින් කරල හැදෙනවා. තුන් මාසයක් යනකොට හැදිල පැහිලත් ඉවරයි. ලොකු ඇට තියෙන හාල් වර්ගයක් තමයි ඒකෙන් ලැබෙන්නෙ. හරි සාර්ථක අස්වැන්නක් තියෙන වී වර්ගයක්. හැදුණට පස්සෙ තනිකරම කරල් ගොඩ. සාර්ථකව අස්වැන්න ලැබුණට පස්සෙ කලින් වෙච්ච පොරොන්දුව අනුවම, අග්‍ර සශ්‍ය කොටස වෙන් කරල බුද්ධ පූජාව සහිත සාංඝික දානයක් දීල තමයි ප්‍රයෝජනයට ගත්තෙ.



සමහර විට වී අමුණු ගණන් තියෙන කෙනෙක් වුණත්, ශාසනය උදෙසා අග්‍ර සශ්‍ය කොටස වෙන් කරල මිසක් තමන්ගෙ පාවිච්චියට ගන්නෙ නෑ කියල, අවංකවම අධිෂ්ටාන කරල මේ විදිහට ගොවිතැන් කළොත් ඒක උපද්‍රවයක් නැතිව රැකිල හොඳ අස්වැන්නක් ලබා ගන්නත් පුළුවන්. මොකද ඒකෙන් දානයක් දුන්නයි කියල පාඩුවක් වෙන්නෙ නෑ. කිසි අමාරුවක් නැතිව මේ කන බොන හැම එකකටම හේතු ඵල දැනගෙන, අවංකව මේ වගේ අත්හදා බැලීම් කරන්න පුළුවන්. නමුත් මේ වගේ ක්‍රම දැන් දන්නෙ නැති නිසා, ඔහේ කරන්නන් වාලෙ වගා කරනවා. ඒ නිසාම තමයි අද මේ අස්වැන්න අඩුවෙලා තියෙන්නෙ. **අපේ පැරැන්නන් පවා භාවිතා කරපු, මේ වගේ දහම මුල් කරගත් ක්‍රමවලින්, මේ වගේ යහපත් වැඩ කටයුතු පටන් ගන්නව නම්, ඒ අග්‍ර සශ්‍ය කොටස් වෙන් කරල බුද්ධ පූජාව තියල සාංඝික දානයක් දෙන්න පුළුවන් නම්, එදා තිබ්ච්ච සෞභාග්‍යය, සශ්‍රීකත්වය අදත් උදා කරගන්න පුළුවන් බවට මේ වගේ අත්දැකීම් හොඳ සාක්ෂි වෙනවා.**

ඒ වගේම මෙතනදි දැන ගන්න ඕන තවත් වැදගත් කාරණයක් තියෙනවා. ඒ තමයි මේ වගේ යම් කිසි වගා කටයුතු ආදිය කරන කොට ඉස්සෙල්ලම කරන අධිෂ්ඨානය, පොරොන්දුව. මේ සම්බන්ධයෙන් මම අත්දැකපු සිද්ධියක් තියෙනවා. ඒ කාලෙ අපේ ගම් පළාතෙ හිටපු එක්තරා කාන්තාවක් කෙසෙල් ගස් හිටෙව්වම විසාල කැන් වැටෙනවා. ඇය කියන කතාවක් තමයි, බුදුන්ට කියල බුද්ධ පූජාවට විතරක් තියනව කියල ගහ හිටෙව්වොත් හොඳ එක ඇවරියක් විතරක් හැදිල අනෙක්වා පුහු වෙනව කියල. හැබැයි ඒ හැදෙන එක ඇවරියත් හොඳට සරුවට හැදෙනවලු. ළමයින්ටත් එක්ක කියල හිටෙව්වොත් මුළු කැනම හොඳට හැදෙනවලු. දැන් මේ කාන්තාව මේක අත්දැකීමෙන් කිව්ව මිසක් හේතු ඵල දැනගෙන කිව්ව නෙවෙයි. මොකද මෙතන විශේෂත්වයක් තියෙනවා. බුදුන්ට විතරක් කියල කැප කළොත් ඒක තවත් කෙනෙකුට කන්න ගැළපෙන්නෙ නෑ. මොකද බුදුන්ට කැප කරල ඉවරයි. ඒකට තවත් කෙනෙකුට හිමිකමක් නැති නිසා ඒ හැදෙන ඇවරිය හොඳට සරුවට නමුත් කෙහෙල් කැන සීමා වෙලා හැදෙනවා. ඒක නරකට වෙන දෙයක් නෙවෙයි, ස්වභාවයෙන්ම සිද්ධ වෙන දෙයක්. බුදුන්ට පූජා කරපු දෙයක් පරිහරණය කරන්න තවත් සුදුස්සෙක් ලෝකෙ නෑ කියන කාරණය පෙන්නුම් කරන්න තමයි ඒ වගේ දේවල් සිද්ධ වෙන්නෙ. මේ කතාව කිව්වෙ මොකද, එහෙම නැත්නම් සමහර විට කෙනෙක් බුද්ධ පූජාවට විතරක් තියනව කියල හිටවල, ඊළඟ පාර තමන්ටත් ප්‍රයෝජන ගන්න තරම් ඵලදාවක් හැදුනෙ නැත්නම් නොපැහැදීමක්, ගැටළුවක් වෙන්න පුළුවන්. ඒ නිසා මේ වගේ දේවල් හරියට චේතනා පිහිටුවල කරන්න ඕන. ඉතින් අග්‍ර සශ්‍ය කොටස බුද්ධ පූජාවට තියල, සාංඝික දානයක් දීල, නැති බැරි අයටත් කන්න දෙනව කියල ඒ විදියෙ පොරොන්දුවක්, අධිෂ්ඨානයක් කරල ඒ වගා කටයුතු ආදිය පටන් ගන්නව නම් වඩා හොඳයි. එතකොට කිසි ප්‍රශ්නයක් නෑ. කාටවත් පාඩු වෙන්නෙත් නෑ.

අනෙක් කාරණය තමයි, මේ වගේ බුදුන් සිහි කරල අධිෂ්ඨාන කරල ඒ විදියට පොරොන්දුවක් වෙලා, ඒ පොරොන්දුව කඩ කළාමත් තමන්ට අවැඩක් වෙන්න පුළුවන්. දැන් මේ කියන්න යන්නෙ ඒ වගේ මම දැනුවත්ව ලබපු අත්දැකීමක්. ඒ කාලෙ අපේ වත්තෙ ලොකු ගඩුගුඩා ගහක් තිබුණා. ගිහි කාලෙ අපේ දුව, ඔය ගඩුගුඩා ගහේ මල් පීදෙන කොටම, මේ සැරේ අග්‍ර සශ්‍ය කොටස බුද්ධ පූජාවට තියල දානෙකුත් දෙනව කියල කිව්වා. හැබැයි එහෙම කිව්වට දන්නෙම නැතුව ඇය අතින්ම ඒක කැවුණා. කැවට පස්සෙ මුළු ඇඟේම කුෂ්ඨ දැම්මා. ඒ නිසා නැවතත් වරද කමා කරගෙන බුද්ධ පූජාව තිව්වා. ඒකෙන් අර අමාරුව ඇර ගත්තා. එහෙම අවස්ථාත් තියෙන බව මේ වගේ කාරණාවලින් පැහැදිලි වෙනවා. නමුත් මෙහෙමත් කාරණයක් තියෙනවා. අර විදියට අවංකව අධිෂ්ඨාන කරල පොරොන්දුවක් වුනොත්, ඒ පොරොන්දුව ඉෂ්ට කරන කල්, ඒ ඵලදාව ස්වභාවයෙන් සතෙක්වත් හොට ගහන්නෙ නෑ. උපක්‍රම යොදල මනුස්සයෙකුට කන්න පුළුවන් වුනාට ඒ උපක්‍රම නැති, ක්‍රම විතරක් තියෙන සතුන් ඒකට කට ගහන්නෙ නෑ. ඒක ධර්මතාවයෙන්ම වළකිනවා. මේකත් අත් දකින්න තියෙන විශේෂත්වයක්. හැබැයි මනුස්සයො වුනත් කෑවයි කියන්නෙ ඒකත් ඒ කාපු අයට හොඳ නෑ. හරියට අර දෙයියන්ගෙ දේ කෑවයි කියල කතාවට කියනව වගේ. ඒ වගේ අවස්ථාත් මේ ධර්මතාවය තුළ ක්‍රියාත්මක වෙනවා.

දැන් මේ කියන්න යන්නෙ ඒ වගේ බුද්ධ ශාසනයට වෙච්ච පොරොන්දුවක් කඩ කිරීම සම්බන්ධයෙන් මම ලබපු තවත් අත්දැකීමක්. මේ සිද්ධිය වුනේ 1995 දි විතර. මම කලගෙඩිහේන ප්‍රදේශයේ ශාසනික කටයුතුවල නිරත වෙමින් විවිධ පිරිස්වලට වැඩ කරල දෙන කාලෙ, මාව හමුවෙන්න ගම්පහ පැත්තෙ මහත්තයෙක් පවුලෙ කට්ටියත් එක්කම ආවා. ඒ අතර විදෙස් ජාතික ළමයෙක් එක්ක විවාහ වෙන්න සම්බන්ධයක් තිබ්ච්ච ඒ අයගෙ දුවෙක් හිටියා. මේ විදෙස් ජාතික ළමයත් හොඳට ඉගෙන ගත්තු කෙනෙක් නිසා විදෙස් රැකියාවක් බලාපොරොත්තුවෙන් මගෙන් මොනව හරි ආශිර්වාදයක් ඉල්ලුවා. මම කිව්ව, මේ තුනුරුවන් බලෙන්

ආශිර්වාදයක් ලබාගන්න ඔයගොල්ලන්ට මොනවද කරන්න පුළුවන් කියල. ඒ ස්ථානයේ ඒ වෙන කොට පහන් 2500 ක වැටක් උණ ලීවලින් හදල තිබුණා. මේ පහන් වැට දිහා බලල, රස්සාව හම්බ වුනාට පස්සෙ ලැබෙන පළවෙනි පඩියෙන් මෙන්න මේ පහන් වැට යකඩෙන් හදල පහන් 2500 ක් පත්තු කරල භාරයක් ඔප්පු කරනව කියල ඒ අය කිව්වා. මම කිව්ව ඉතින් අවංකව ඒ බලාපොරොත්තුව අධිෂ්ඨාන කරල පඬුරක් ගැට ගහල යන්න කියල. ඔහොම ගිහින් සතියක් විතර ඇතුළත මේ ළමයට රු. 70,000/- ක මාසික වැටුපක් ලබන රස්සාවකට කැඳවීමක් ආවා. ඒ කාලෙ හැටියට ඒක විසාල මුදලක්. ඒ නිසා විගහට මාව නැවතත් හමුවෙන්න ඇවිත් මේ කතාව කියල, අපි මේ පහන් වැටෙන් භාගයක් හදල පත්තු කරන්න පොරොන්දු වුනානෙ කියල කිව්වා. මමත් ඉතින් ආ එහෙමද භාර වුනේ කියල අහල, එහෙම නම් හරි හරි කියල නිකං හිටියා.

නැවතත් දවස් 3 කින් විතර මේ අය ඇවිත් කියනව, හරි වැඩේනෙ අර රස්සාව අවලංගු වුණා, තවත් රස්සාවක් මාසිකව රු. 35,000/- ක වැටුපකට ආව කියල. එහෙම කියල ඊළඟ සැරේ කියනව, අපි මේ පහන් වැට පත්තු කරන්න බාරයක් වුනානෙ, ඒකටයි ආවෙ කියල. දැන් අර පහන් වැට හදල දෙන කතාව නෑ. පත්තු කරන්න විතරයි. මෙහෙම ගිහින් තවත් දවස් 2-3 ක් යන කොට ඒ දෙවනියට ලැබිච්ච රස්සාවත් අවලංගු වුණා. ඊට පස්සෙ මේ නෝනයි මහත්තයයි දෙන්නම මාව හමුවෙන්න ආවා. ඇවිත් මගෙන් අහනව, අපි මෙච්චර මේ බාර වෙද්දි මේව ඉෂ්ට වෙන්නෙ නැත්තෙ ඇයි, එහෙම වෙන්නෙ කොහොමද කියල. මම ඇහුව ඔයගොල්ලන්ට ඉඳිකටුවක් භාර වෙන්න පුළුවන්ද කියල. පුළුවන් ඇයි ඒ කියල ඇහුවා. රස්සාව හරි ගියා හෝ නැතා හෝ, හිඟාකාල හරි ඉඳිකටුවක් ගෙනත් දෙන්න පුළුවන් නම් බාර වෙච්ච එක ඔප්පු කරන්න පුළුවන් කියල මම ඒ අයට කිව්වා. දැන් ඉතින් මේ කිව්ව කතාව තේරුම් ගන්න බැරිව දෙන්නම කල්පනා කරනවා. මම ඉතින් තවත් ටිකක් කාරණය පැහැදිලි කරල කිව්වා. ඉඳිකටුවක් බාර වෙලා ගියානම් ඒක කොහොම හරි දෙන්න පුළුවන්නෙ, එහෙම වියදමක් යන එකක් නෙවෙයිනෙ, බැරි නම් හිඟා කාල හරි ඉඳිකටුවක් දෙන්න බැරිය කියල එහෙමත් කිව්වා. දැන් ඉතින් දෙන්නම කල්පනා කර කර ඔහේ ඉන්නවා. මුල ඉඳල වෙච්ච සිද්ධිය හොඳට සිහි කරල බලන්න කියල මම නැවතත් කිව්වා. එහෙම කියල එකින් එක මතක් කරල දුන්නා.

මුලින්ම ලැබෙන වැටුපෙන් යකඩ පහන් වැටක් හදල පහන් 2500 ක් පත්තු කරනව කියල ඉස්සෙල්ලම පොරොන්දුවක් වුණා. ඊළඟට රු. 70,000/- ක මාසික වැටුපකට රස්සාවක් ආවා. ඊට පස්සෙ දෙවැනි සැරේ ඇවිත් කිව්වෙ මොකක්ද, පහන් වැටෙන් බාගයක් හදල පත්තු කරනව කියල. ඊළඟට ඒ රස්සාව නැති වෙලා මාසිකව රු. 35,000/- ක වැටුපකට තවත් රස්සාවක් ආවා. ඒ කියන්නෙ අර මුලින් පොරොන්දු වෙච්ච බාරයෙන් බාගෙකට, ඒ වගේම වැටුපෙන් බාගෙක රස්සාවක් ආවා. ඊට පස්සෙ අනෙක් සැරේ අර බාගයක් හදන කතාවත් නැතුව පහන් වැට පත්තු කරන්න විතරක් කතා වුණා. අන්තිමට ඒ රස්සාවත් නැති වුණා. දැන් මතක නැද්ද මේ පොරොන්දු වෙච්ච ක්‍රමය ? ඉතින් මම ඇහුව දැන් මේ කියන එකක්වත් තේරෙනවද, මොකක්ද ඒ බලාපොරොත්තුව කියල. අන්තිමට මම කිව්ව රස්සාව හම්බ වුනා හෝ නැතා හෝ බාරය ඔප්පු කරන්න පුළුවන්නෙ, ඒකයි ඉඳිකටුවක් ගේන්න කිව්වෙ කියල. මීට පස්සෙ බැරි පොරොන්දු දෙන්න යන්නෙ නැතිව, නොකෙරෙන ඒව කරන්න යන්නෙ නැතිව, කරන්න පුළුවන් දෙයක් බාර වෙන්න කියල ඒ අනුව කටයුතු කරගන්න, මට ඔයගොල්ලන්ට වෙන කියන්න දෙයක් නෑ කිව්වා. ඊට පස්සෙ මේ දෙන්න කල්පනා කර කර ඉඳල යන්න ගියා. ඒ ගියාමයි ඊට පස්සෙ කතා කරන්නවත් ආවෙ නෑ. ඉතින් බලන්න මේ මනුස්සයින්ගෙ තියෙන ගතිවල හැටි. ශාසනයට වෙච්ච බාරයක් ඉෂ්ට කරන්නත් ඒ තරම් ලෝභයි. අවංක නැත්නම් ඒ වගේ කාරණා සාසනය හරහා ඉෂ්ට වෙන්නෙ නැති බව මේ වගේ සිදුවීම්වලින් පැහැදිලි වෙනවා.

දැන් මේකට හොඳ උපමා කතාවකුත් තියෙනවා. මාළු අල්ලන මනුස්සයෙක් දවසක් මාළු අල්ලන්න ගියාලු. ඉතින් බිලිය දාල බලන් හිටියට මාළු අහුවුනේ නැතිලු. ඊට පස්සෙ මේ මනුස්සය කිව්වලු, ඉස්සෙල්ලම අහුවෙන මාළුවා දෙවියන්ට දෙනව කියල. එතකොටම ලොකු මාළුවෙක් අහු වුනාලු. දැන් මනුස්සයට ඒක දෙන්න ලෝභ හිතිල පිටිපස්සෙ කූඩෙට දාගෙන, ඊළඟට අහුවෙන මාළුව දෙවියන්ට දෙනව කිව්වලු. කියන කොටම අර අල්ල ගත්ත මාළුවත් ආපසු පැනල ගියාලු. දැන් මේ මනුස්සය පිටි පස්ස බලල, දෙවියන්ට විහිළුවක්වත් තේරෙන්නෙ නැනෙ කියල කිව්වලු. ඉතින් මේකෙන් කියන්නෙ, ඒ වගේ වැඩ කරන්න එපා, විහිළු කොලොප්පම් නොකර හරියට අවංකව අධිෂ්ඨාන කරල, හේතුඵල දැනගෙන මේ වගේ වැඩ කරන්න කියන එක.

ඒ නිසා මේ වගේ දැහැමි ක්‍රම දැන ගෙන, මේ ජීවත් වෙලා ඉන්න කෙටි කාලයෙදි තම තමන් කරන ගොවිතැන් බත්, රැකීරක්ෂා, ව්‍යාපාර ආදි කටයුතුවලටත් මේ වගේ යහපත් ක්‍රම යොදාගෙන, හැම දෙනාම යහපත අභිවෘද්ධිය සලසා ගන්න උත්සාහ කරන්න.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්.)

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**

**සඟුනට නිගරු වන අයුරින් බොරු වාද**
**කරනව හැම විටම දොස් ගෙරවිලි නාද**
**ගිය ගිය තැනදි කරනව හැම දෙන බේද**
**නිවනට යන්න මේ අයුරින් හැකි වේද**

**පැන පැන කන ගතිය පෙර කල තිබු හන්දා**
**එම ගති මෙලෙස පස්සෙන් ආවද මන්දා**
**ඉස්සර වෙන්න යම ලොව පෝලිම හන්දා**
**මෙච්චර හදිසි වෙන්නේ කුමටද මන්දා**



පබැඳුම: **මුරුතමුරේ ධම්මින්ද හිමි**

# ද්‍රව්‍ය පදාර්ථ ඥානයට හසුවන විවිධ ශාකවල සැඟව ගිය ඖෂධ ශක්තීන්

1 වන කොටස

මේ ලෝකයේ තියෙන විවිධ ගස්වැල් වර්ග හට ගන්න හැටි මීට පෙර අවස්ථා කිහිපයකින්ම පද නිරුක්ති සහිතව පැහැදිලි කළා. එතකොට ද්‍රව්‍ය පදාර්ථ ඥානය පිහිටපු කෙනෙකුට පොත්පත්වල නැතත් ඒ ඒ ගස්වැල් වර්ගවල පිහිටන ශක්තීන් මතු කරන්න පුළුවන් බවත් පෙන්වා, ඒවා මනුස්සයින්ට ඇති වන විවිධ රෝගාබාධයන්ට ප්‍රතිකර්ම විදියට පාවිච්චි කරන්න පුළුවන් අවස්ථාත් මේ දහම් සඟරාවේ කලාප කිහිපයකින්ම ඉදිරිපත් කළා. දැන් මේ හෙළිදරව් කරන්න යන්නෙ ඒ වගේ තවත් ගස්වැල් වර්ග කිහිපයක පිහිටන ශක්තීන් ගැන. පෙර ඉදිරිපත් කළා වගේම, වහරක අභයරතනාලංකාර හිමියන්ට සමාධියට හසුවෙච්ච ඒ වගේ විවිධ ශාක වර්ගවල පිහිටන ඖෂධ ශක්තීන් තමයි මේ ලිපියෙන් ඉදිරිපත් කරන්නෙ.

ඒ වගේම සමහර ශාකවල තැන්පත් වෙච්ච යම් පොදු ගති ලක්ෂණවලට අදාල ශක්තීන් මිසක් හරියටම 100% ක්ම එල්ල කරල අහවල් ශක්තිය තමයි තියෙන්නෙ කියල කියන්න පුළුවන්කමක් නෑ. ලොවුතුරා බුදු කෙනෙකුට නම් එහෙම එල්ල කරලම කියන්න පුළුවන්. එහෙම නැත්නම් මහ ඍෂිවරුන්ටත් බොහෝ කොටම ද්‍රව්‍ය පදාර්ථ ඥානයෙන් ඒක කියන්න පුළුවන්. මොකද මහ ඍෂිවරුන් කියන්නෙ බුදු වෙන්න ප්‍රඥා පාරමිතා, නෙක්ඛම්ම පාරමිතා ආදී වශයෙන් පෙරුම් පුරන බෝසත්වරු. උන් වහන්සේලාම තමයි කවද හරි බුදු වෙන්නෙ. ඒ නිසා බුදුන් වහන්සේ නමකට හැර ද්‍රව්‍ය පදාර්ථ ඥානය බොහෝ කොටම නැගිල තියෙන්නෙ මහ බෝසතාණන් වහන්සේලාට. ඒ නිසා තමයි අරළු ගෙඩියක ගුණ 108 ක් සහ නෙල්ලි ගෙඩියක ගුණ 6 ක් තියෙනව කියල හරියටම වෙන් කරල එල්ල කරල පැරණි ඍෂිවරු කියල තියෙන්නෙ. එතකොට කාලෙන් කාලෙට ලොවුතුරා බුදු බව පතන මහ බෝසත්වරු ලෝකෙට පහළ වෙනවා. ඒ කාලෙදි උන් වහන්සේලා තමයි විශේෂයෙන්ම මේ ශාකවල තියෙන ඖෂධ ශක්තීන් ලෝකයට මේ වගේ විග්‍රහ කරල දෙන්නෙ.



නමුත් ඊට මෙහා ඉන්න අයට පිහිටල තියෙන ද්‍රව්‍ය පදාර්ථ ඥානයට ඒවායේ තියෙන පොදු ආසන්නතම ගති ලක්ෂණ තමයි අහුවෙන්නෙ. ඒ හෝඩුවාවන් ඔස්සේ මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කරල ඒවායේ අඩංගු රසායනික සංයුතියන් සොයා ගන්න මේ පිළිබඳ උනන්දුවක් දක්වන විද්‍යාඥයන්ට පුළුවන්. ඒ වගේම මේ රෝග හට ගන්නෙ, මේ මේ ගුණ වගාවන් පිරිහුණු නිසයි කියල හේතුඵල සහිතව දැනගෙන, ඒ ගුණ වගාවන් නැවත වර්ධනය කරගන්න කටයුතු කිරීමෙන් ඉදිරියේදි විශාල සශ්‍රීකත්වයක් අභි-වෘද්ධියක් ළඟා කරගන්නත් පුළුවන්. ඒ නිසා වෛද්‍ය පර්යේෂණවල නිරත වෙලා ඉන්න උගතුන්ට මේ කරුණු කාරණා ඔස්සේ බොහෝ ඵල ප්‍රයෝජන ලබාගෙන ජනතාවට යහපතක් කරන්න අවස්ථාව උදාකර ගන්න පුළුවන්. මොකද විවිධ රෝගාබාධවලට යම් යම් ආහාර පාන ඉතා යෝග්‍ය බවත්, තවත් සමහර ඒවා අපත්‍ය බවත් වෛද්‍යවරුන් විසින් ප්‍රකාශ කළත් ඒවායේ නියම හේතුඵල සම්බන්ධය හෙළිදරව් කිරීමක් සිද්ධ වෙන්නෙ නෑ. යමක තියෙන ඖෂධ ශක්තිය හට ගන්නෙ කොහොමද, ඒක ලබාගන්නෙ කොහොමද, ඇයි ඒක අහවල් ඌනතාවයට ප්‍රත්‍ය වෙන්නෙ .... ආදී කාරණා අද වෙන කොට ඉදිරිපත් කෙරෙන්නෙ නෑ. මොකද ඒක දැනගන්න නම් ද්‍රව්‍ය පදාර්ථ ඥානය යම් ප්‍රමාණයකට හරි පිහිටන්න ඕන. පෙර හිටපු ඍෂිවරුත් විවිධ ඖෂධ වර්ග ලෝකයාට දායාද කළේ ඒ අනුසාරයෙන්. ඒක මේ වෙන කොට බොහෝ කොටම වැහිල ගිහින්. ඒ නිසා ඒවා හේතුඵල සම්බන්ධය සහිතව නැවතත් මතු කරල දුන්නොත් ඉදිරියේදී විශාල ඵලප්‍රයෝජනයක් පශ්චිම ජනතාවට ලබාගන්න පුළුවන්. එහෙම යහපතක් වෙයි කියන බලාපොරොත්තුවෙන් තමයි විටින් විට මේ වගේ කරුණු කාරණා හෙළිදරව් කරන්නෙ.

දැන් මේ ශාකවල තියෙන ශක්තිය ගැන දැන ගන්න කලින් මේවා පහල වෙන්න මුල පුරපු හැටි කෙටියෙන් දැන ගැනීමත් වැදගත්. මේ පිළිබඳව විස්තර මීට පෙර ලිපිවලිනුත් යම් පමණකට ඉදිරිපත් කරල තියෙන නිසා ඉතාමත් කෙටියෙන් අවශ්‍ය කරුණු කිහිපයක් පමණයි මේ ඉදිරිපත් කරන්නෙ.

පළමුව ලෝක ආරම්භයේදී ලෝක සත්වයෝ (ආදි කල්පික මනුස්සයො) ස්වයං ප්‍රභා ආලෝකයෙන් තමයි ජීවත් වුනේ. ඒ කාලෙ ගස් වැල් කියල දෙයක් තිබුණෙ නෑ. මනුස්සයින්ගෙ තිබ්බච්ච පුණ්‍ය ඍද්ධියට, ගුණවලට මේ ලෝකෙ ජීවත් වෙන්න අවශ්‍ය සියල්ලම ලැබුණා. මුල් කාලයේ මේ මනුස්ස ලෝකයට ආවට පස්සෙ තමයි ලස්සන, අවලස්සන කියල භේදයක් ඉස්සෙල්ලම හට ගත්තෙ. ලස්සන පිරිස් එකතු වෙලා එක ගොඩක් වුණා. එහෙම එකතු වෙලා අවලස්සන පිරිස් මඩවන්න පටන් ☞

ගත්තා. ඒකෙ හේතු ඵලයක් වශයෙන් ගොඩ මඩ කියල දෙකක් හැදුණා. ගොඩ මඩ දෙක හැදුනෙ ඒ විදියට. ගොඩක් වෙලා ලස්සනට හිටපු අය හැම වෙලේම මහන්තත්වයෙන් හිටපු නිසා, කලින් තිබිච්ච හොඳ ශක්තිය පිට වෙලා ගිහින් මහ වී ඇති වුණා. ඒ ශක්තිය ආපසු ගන්න තමයි මහ වී කියන ශාකයක පිහිටියේ. එතකොට මැඩවිච්ච අය සැලෙන්න පටන් ගත්තා. ඒකෙන් හැල් වී කියල දෙයක් ඇති වුණා. මුල් කාලෙ හැල් වී, මා වී කියන දෙක ලෝකයට බිහිවුනේ ඔය විදියට. ස්වයං ජාත සහල් හට ගන්න කොට ඉස්සෙල්ලම හට ගත්තෙ මේ දෙක තමයි. ගොඩේ වී, මඩේ වී කියල දෙකක් හැදුනෙත් මේ දෙකෙන්.

දැන් ඉතින් මේක එක්කෙනෙක් දෙන්නෙක්ගෙ අතින් සිද්ධ වෙච්ච දෙයක් නෙවෙයි. කාලයක් තිස්සෙ ක්‍රමයෙන් මනුස්සයින් ළඟ තියෙන ගුණ ධර්ම පිරිහිලා පොදුවේ මුළු මහත් සමාජයම පිරිහෙන කොට සිද්ධ වෙච්ච දෙයක්. එහෙම පිරිහෙන කොට පිට වෙච්ච ශක්ති විශේෂ තමයි අද මේ හොඳ නරක කියන දෙවිදියටම ගස් වැල්වල තැන්පත් වෙලා තියෙන්නෙ. එතකොට මේ ශක්තිය ඔක්කොම පිට වෙන්නෙ මනුස්සත්වයේ ඉන්න අයගෙන්මයි. එහෙම ශක්තිය පිට වෙලා ගිහින් මනුස්සයො තිරිසන් වුනාට පස්සෙ, ඔවුන් ඊළඟට ඒක විඳවන්න විපාක ලෝකයට යනවා. විපාක ලෝකයේ ඉන්න සත්වයින්ට, මනුස්සයින්ට වගේ යමක් පහළ කරන්න බෑ. තියෙන එක කකා බිබී භුක්ති විඳිනවා මිසක් තිරිසන් සතුන්ගෙන් අලුතින් යමක් හට ගන්න ශක්තියක් පිට වෙන්නෙ නෑ. **මේ මනුස්සයො වෙලා පිරිහෙන වෙලාවෙමයි මේව ගොඩ නැගෙන්න හේතු යෙදෙන්නෙ. එතකොට මේ දැන් ඉන්න හැම සත්වයෙක්ම මුලින්ම මනුස්සයො වශයෙන් තමයි හිටියෙ. මනුස්ස ගති ගුණ පිරිහුනාම ඒ පිරිහිච්ච ගතිගුණවලට අදාල ශක්තිය ඔක්කොම විහිදිලා ගිහින් ශාකවල පිහිටියා.** ඒකට සෑහෙන කාලයක් ගත වෙනවා. ඒ විදියට තමන්ගෙන් ක්ෂය වෙච්ච ශක්තියෙන් තමයි ස්ව + ක - ශාක කියල දෙයක් හට ගත්තෙ. අද හැම තැනම තියෙන්නෙ ඒ විදියට හට ගත්ත ශාක. ගස් වැල්වලට පොදුවේ ශාක කියල කියනවා. පිට වුනේ දැඩි ගතියක් නම් ඒකෙන් ගස් හැදුනා. මෘදු ගතියක් නම් වැල් හැදුනා. ඒ දෙකටම නැති, ඒ අතර ගතියක් නම් ගස්වලටත් නැති, වැල්වලටත් නැති පඳුරු විදියට හැදුනා. දැඩි සහ මෘදු ගති කිව්වම හොඳ නරක දෙකටම මේ ගති දෙක තියෙනවා.

එතකොට තමන් හෙවත් ස්ව තුළ මුලින්ම සියල්ල පූර්ණ වෙලා තිබුණෙ. මොකකින්වත් මහන්සියෙන් අරගෙන හදාගෙන කන්න බොන්න දෙයක් තිබුණෙ නෑ. කාගෙන්වත් ඉල්ලන්න අවශ්‍යතාවයක් තිබුණෙ නෑ. ඒ තමයි බ්‍රහ්ම කල්පික මනුස්ස අවස්ථාව. එතකොට ස්ව පූර්ණයි. ඒ නිසා ඒ කාලෙ ගස්වැල් තිබුණෙ නෑ. කාලයක් යද්දි ටික ටික පොදුවේ මනුස්සයින් පිරිහිලා තමයි ඒ ශක්තිය දුරට අස් වෙලා (දුරස් වෙලා) ගිහින් ගස්වැල් විදියට හට ගත්තෙ. දුරස් වෙච්ච තරමට ඒව හොයාගන්නත් අමාරුයි. ඒ නිසා තමයි සමහර බෙහෙත් ශාක වර්ග අද වෙන කොට හොයාගන්න අමාරු තරමට දුර්ලභ



වෙලා තියෙන්නෙ. ඒ කියන්නෙ ඒවා හුඟක් දුරස් වෙලා.

දැන් මේ ශාකවල තියෙන්නෙත් ජීව ශක්තියක්. ඒක හට ගන්නෙ මෙහෙමයි. මනුස්සයින් තුල තියෙන ගුණ හීන වෙනකොට ජීව ශක්තියෙන් කොටසක් අනුශක්තියක් විදියට පිටවෙනවා. ඒක තමයි ජීව ශක්තියේ දෙවැන්න. ඒක තමයි ගස් කොළංවල තැන්පත් වෙලා, ජීවීන් හා සමාන ශක්තියක් ඒවාටත් පිහිටන්න හේතු වෙන්නෙ. එතකොට ගස් කොළංවලත්, ජීවත් වන දෙයක් හා සමානව ශක්තියක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා තමයි මල්, දළු, ගෙඩි ආදිය හට ගන්නෙ. ඒ තියෙන්නෙ මනුස්සයින්ගෙ තිබිච්ච ජීව ශක්තියේ කොටසක්. අනු ජීවයක් කිව්වෙ ඒකයි. ගස් වැල්වලට පණ තියෙනවයි කියල කියන්න හේතුවත් ඒකයි. එතකොට ඒ පණ මුලින්ම තිබුණෙ මනුස්සයින් ළඟ. එහෙම තිබිල ඈත් වෙච්ච කොටසක් තමයි ඒ. හැබැයි ඒ ප්‍රධාන ජීවීන් නෙවෙයි. නමුත් ජීවීන්ගෙන් හටගන්නා යම්කිසි කොටසක් නිසා ඒකටත් ඒ විදියෙ ස්වභාවයක් තියෙනවා.

උදාහරණයකින් පැහැදිලි කළොත්, පිච්චෙන දර කෑලිවල ගින්දර තියෙනවා. අපි ඔකට යකඩ කෑල්ලක් දැම්මොත්, ටික වෙලාවක් යන කොට යකඩයත් ගිනි පෙනෙල්ලක් වගේ රත් වෙලා ගිනියම් වෙනවා. හැබැයි යකඩෙ ගින්දර තිබුණට, ගිනියම් වුණේ ගින්දරවල රස්නය ඇදගෙන ඒකෙ තියෙන ශක්තියෙන්. ඒ වගේ අපේ තියෙන ජීව ශක්තිය හිතත් එක්ක ගොඩ නැගිච්ච එකක්. ඒක තමයි ශරීරයේ තියෙන්නෙ. ඒකෙන් කොටසක් පිටවෙලා ගිහින් උරාගත්තු අනුශක්තිය තමයි ශාකවල තියෙන්නෙ. ඒක කාලයක් යන කොට සිද්ධ වෙන දෙයක්. එහෙම හැදෙන කොට ඒකට අවශ්‍ය අනෙකුත් රසායනයන් භෞතික ලෝකයේ සකස් වෙනවා. ඒ රසායනයන් සමග මේ පිට වෙන ශක්තිය ගිහින් භ්‍රමණ චක්‍ර හදනවා. එතකොට ඒකෙ ස්වභාවය තමයි ස්වයං ජාතයක් බිහි වීම. ඒක කවදත් ඔය විදියටමයි සිද්ධ වෙන්නෙ. කොච්චර කාලයක් ගියත් මේ සියලුම ශාක වර්ග ඔය විදියට තමයි හටගන්නෙ. කොයි සක්වලක ගිහින් බැලුවත් ඒකෙ සත්වයො ඉන්නව නම්, ඒ ලෝකෙට ගැලපෙන විදියට මේ ක්‍රමයටමයි ශාක හටගන්නෙ. ඒවායේ තියෙන්නෙත් මේ ශක්තිමයි. මොකද මේ ඔක්කොම මනුස්සයින්ගෙ තිබිච්ච ගතිගුණ-යන්ට අනුව විහිදිච්ච ශක්තිය.

ඉස්සෙල්ලම මිනිස්සුන්-ගෙන් පිට වෙන්නෙ මෘදු රස ශක්තිය. ඊට පස්සෙ ක්‍රමයෙන් රළු ශක්තිය පිට වෙන්න පටන් ගන්නවා. ඊළඟට රළු බව තවත් කටුක බවට පත් වෙනවා. ඊළඟට කටුක බවින් නතර නොවී මාරාන්තික තත්ත්වයට පත් වෙනවා. මෙහෙම ගිහින් අන්තිමට මනුස්සය මරණයට යනකල්ම ශක්ති එකින් එක පිටවෙනවා, පිරිහෙනවා. පිරිහෙනවයි කියන්නෙ මනුස්සය ළඟ තිබුණ ඒ ශක්ති විශ්වයට විහිදිලා යනවයි කියන එක. මාරාන්තික වෙලා මරණයට යන කල් ගොඩ නැගිල තිබිච්ච ශක්ති විශේෂ තමයි අන්තිමට විශ්වයට පිට වෙන්නෙ. ඒවායින් මාරාන්තික වෙනකොට පිටවෙච්ච ශක්තිය තමයි විවිධ විස සහිත ගස් වැල් විදියට පිහිටන්නෙ. කටුක ශක්තිය කටු සහිතයි. වස විස වගේ ශක්තිය මිනිස්සු මරලම දානවා. එතකොට ඒවා වස විස වශයෙන් පිහිටනවා. **අන්තිමට**

**මාරාන්තික වස තමයි අද සයනයිඩ් කියල කියන්නෙ. ඒ කියන්නෙ උග්‍ර විස.** සයනය කරනවයි කියන්නෙ නිදා ගන්නවා. අපේ වචනවලින් කියනව නම් අන්තිම නින්ද. අන්තිම නින්ද හෙවත් මරණයට ඇද දාන ශක්තියෙන් හට ගන්නෙ උග්‍ර විස. ලෝකෙට සයනයිඩ් ආවෙ එහෙමයි. වචනෙ කවුරු කොහොම දැම්මත් පද නිරුක්තියෙන් ඒක හැදිච්ච හැටි කියවෙනවා. ලෝක සත්වයා තවත් කෙනෙක් මරා දමන තත්ත්වයට පත් වෙච්ච නිසා ඒකෙන් හට ගත්ත සාපයෙන් තමයි මේ විස හට ගත්තෙ. ඒකෙ හේතු ඵල විදියට ඒ විස ගැව්ච්ච තැන විනාස වෙන්නම ප්‍රතික්‍රියා කරනවා.

එතකොට මුලින්ම ස්වයං ප්‍රභා ආලෝකය තියෙන කොට භූමි පටක කියන ආහාරය තමයි පොදුවේ තිබුණෙ. පටයක් වගේ භූමියට බැදිච්ච නිසා තමයි භූමි පටක කිව්වෙ. ඊළඟට මිනිස්සු ඒව ටිකෙන් ටික කන්න පටන් ගත්තා. එතකොට ස්ත්‍රී ගති ලක්ෂණ තිබිච්ච අයගෙ ශරීර ස්ත්‍රී විදියටත්, පුරුෂ ගති ලක්ෂණ තිබිච්ච අයගෙ ශරීර පුරුෂ විදියටත් පරිවර්තනය වෙලා සනීභවන වුණා. ඊළඟට පුරුෂයන්ට ස්ත්‍රීන්, ස්ත්‍රීන්ට පුරුෂයන් වශයෙන් එකිනෙකා පේන්න පටන් ගත්තා. ඊළඟට පුරුෂයන් ස්ත්‍රීන්ව බදාගන්න කොට, ස්ත්‍රීන් වැල් වගේ ඒකට අනුකූලව වෙළෙන්න ගත්තා. ඒ වෙලෙන ගති ලක්ෂණය තමයි ලතා කිව්වෙ. මේ විදියට බදාගන්න, වෙළෙන මානසිකත්වයෙන් පස්සෙ අර කලින් තිබිච්ච තීක්ෂණ මානසිකත්වය බහින්න පටන් ගත්තා. එතකොට බදාලතා කියන්නෙත් දෙගොල්ලො බදාගෙන වැළඳගත්ත එක. ඒ හේතුවෙන් ශරීරවලට තදබල දෙයක් අවශ්‍ය නැතිව පෝෂණය වෙන්න තිබිච්ච ශක්තිය, මේ විදියට කාමයන්ගෙන් බරිත වෙන කොට විශ්වයට පිට වෙලා ගියා. ඒ ශක්තියෙන් තමයි බදාලතා හැදුනෙ. ඒක තමයි කෙටි වෙලා අද බතල කියන්නෙ. අදත් බතලවල ඒ පෝෂ්‍ය ගුණය තියෙනවා. කෑවම ලේසියෙන් බඩගිනි වෙන්නෙ නෑ. රසයත් එහෙමයි.

මේ විදියට මුලින්ම ආහාර විදියට තිබුනෙ එකයි දෙකයි. හැබැයි ඒව උපරිම පෝෂණ ගුණයෙන් යුක්ත වුණා. ඒවට අමතරව කන බොන වෙන මුකුත් ලෝකයේ තිබුණෙ නෑ. මොකද එහෙම අවශ්‍යතාවයක් තිබුණෙ නෑ. ඊට පස්සෙ තමයි මනුස්සයො පිරිහෙන කොට ක්‍රමයෙන් ගොඩ මඩ ඇති වෙලා, විවිධ ගස්වැල් වර්ග හට ගෙන අද මේ තියෙන පරිසර තත්ත්ව උදා වුණේ.

දැන් මේ විදියට හට ගත්තු ශාක කිහිපයක් ගැන බැලුවොත් එකක් තමයි මුකුණුවැන්න. ගුණමකු කියල වචනයක් සමාජයේ තියෙනවා. ඒ කියන්නෙ කෙනෙක්ගෙ තියෙන ගුණයක් මැකිල ගියාම ඒ පුද්ගලය ගුණ මකුවෙක් කියල කියනවා. ඒ තත්ත්වයට පත්වුණාම ඒ ශක්තිය පිට වෙලා ගිහින් මකු වුණා වැන්න - මුකුණුවැන්න කියල ශාකයක් හැදිල ඒකෙ තැන්පත් වෙනවා. දැන් මෙතනදි ගුණ මකා දමනවා කියන්නෙ කෙනෙක්ගෙ තියෙන යහපත් ගුණ කියන්නෙ නැතිව





ඉන්නවා, නොතක ඉන්නවා කියන එක. නමුත් ඉස්සර නම්, මට මෙහෙම උපකාරයක් කළා, අහවලාගෙ මෙහෙම ගුණයක් තියෙනව කියල ගුණවතුන්ගෙ ගුණ නිතර කියන පුරුද්දක් තිබුණා. නමුත් කාලයක් යද්දි ඒ ගුණ කියන්නෙ නැතිව ගියා. මොකද ඒ ගුණවතුන් උසස් වෙයි කියල කියන්න ලැජ්ජයි, බයයි. එතකොට අනුන් පහත් කරන ගති ලක්ෂණයෙන් තමයි ඒ ගුණවතුන්ගෙ ගුණ මකා දැම්මෙ. ඒ වගේම සලකන්න ඕන දෙමවුපිය, ගුරුවරු, පිදිය යුතු උතුමන් වගේ අයට නොසලකා හැරියා. තමන්ට උදව් උපකාර කරපු ඒ වගේ අය ගැන හොයල බලන්නෙ නැතිව ගියා. ඒ වෙලාවට කියනව දැන් මකු වුණා කියල.

මෙතනදි මකුණ කියන සත්ව අවස්ථාව වෙන එකක්. ඒ කියන්නෙ අර ගුණ මකා දැමීමේ නරක සංඛාරයේ හේතුඵලය වශයෙන් එන ජීව ප්‍රතිඵලය තමයි මකුණ කියන සත්ව අවස්ථාව. ඊට කලින් තිබිච්ච, අර හොඳ ගති ලක්ෂණයට අදාල ශක්තිය පිටවෙලා ගිහින් විශ්වයේ තැන්පත් වෙච්ච ස්ථානය තමයි මුකුණුවැන්න ශාකය කියන්නෙ. එතකොට **ගුණවතුන්ගෙ ගුණ කීම කියන්නෙත් පෙර තිබිච්ච හොඳ ගුණයක්.** ඒක බොහොම වැදගත්. මොකද ගුණවතුන්ගෙ ගුණ කියනව නම් ඒක නැණැස පාදන්න හේතු වෙනවා. විශේෂයෙන් ඥානය ඇති කරනවා. ඒ තමයි හේතුඵලය. ඒ ගුණය මනුස්සයින් අතරින් තුරන් වුනාම, ඒකට අදාල ශක්තිය පිට වෙලා ගිහින් දුරස් වෙලා මුකුණුවැන්නවල තැන්පත් වුණා. මේ ගුණ මැකෙන කොට කර්ම විපාක ඇවිත් පසු කාලීනව ඇස් පෙනීමේ දුර්වලතා වගේ රෝගාබාධ හට ගන්නත් හේතු වුණා. මොකද ගුණ මැකෙන කොට පේන්නෙ නෑ. එතකොට ගුණ නැති අයට යම්කිසි මානසික තැවීමක් ඇති වෙන විදියට රෝග ලක්ෂණ එන්න පුළුවන්. මුකුණුවැන්න ඒකට හොඳ ප්‍රත්‍යක්ෂ ඖෂධයක්. අදත් මේ හේතුව දන්නෙ නැතුව නමුත්, **ඇස්වල හට ගන්න පෙනීමේ දුර්වලතාවයන්ට, ඇස් පෙනීම වර්ධනය කරන්න, ඥාන ශක්තිය වර්ධනය කරන්න මුකුණුවැන්න ඖෂධයක් විදියට භාවිතා කරනවා.**


ඒ වගේම අඟල් 6 - 8 ක් විතර උසට වැවෙන ගොඩ හිටවන මුකුණුවැන්න වර්ගයක් තියෙනවා. ඒ කියන්නෙ නියරවල්වල වැවෙන වැල් මුකුණුවැන්න නෙවෙයි. විශේෂයෙන් මල් පාත්තිවල කොළ පාට ගස් විදියට වැවෙන මුකුණුවැන්න වර්ගයක්. අන්න ඒ මුකුණුවැන්න ගස් මුල් පිටින්ම ගලවල, හෝදල සුද්ද කරල, වේලල පුංචි කෑලිවලට කපල කුඩු කර ගත්තම, ඒක තේ බොන්න වගේ පාවිච්චි කරන්න ගන්න පුළුවන්. විශේෂයෙන් මේ ඖෂධීය පානයෙන් ඇස් පෙනීම වගේම ශරීරයේ තියෙන ඕරා වළල්ලත් දීප්තිමත් වෙනවා. ඒ කියන්නෙ ඇස්ට්‍රල් බොඩි හෙවත් සූක්ෂම කයේ තියෙන අඳුරු ගති දුරු වෙනවා. ඒ විදියට පාවිච්චි කළාම ශාරීරික රෝග බොහෝ දුරට දුරු කරගන්න මේක හොඳ ප්‍රත්‍යක්ෂ ඖෂධයක් වෙනවා.

ඊළඟට මේ මුකුණුවැන්න ගත්තමත් කොළ පාට, රතු පාට ආදී ☞

වශයෙන් එකිනෙකට වෙනස් වර්ග තියෙනවා. යම් කිසි විදියකට මනුස්සයො වශයෙන් යහපත කරපු දේවල් තිබුණ නම්, ඒ කරපු දේවල් දුරස් වෙලා ගිහින් කොළ මුකුණුවැන්නවල පිහිටනවා. ඒ වගේම කෙනෙක්ගෙ ගුණයක් දැකල ඒ ගුණ වසන් කරන්න හිතෙන්නෙ නැති ගති ලක්ෂණයක් මුල් කාලෙ තිබුණා. ඒ කියන්නෙ ඒ ගුණ නොකිය ඉන්න හිතෙන්නෙ නෑ. එහෙම හිටියොත් නිකං රත් වෙන ගතියක් ඇඟට දැනෙනවා. ඒකත් ගුණයක්. දයානුකම්පාවෙම ස්වභාවයක් නිසා තමයි එහෙම ගුණ කියන්න හිතෙන්නෙත්. නොකිය හංගගෙන ඉන්න කොට ඇඟ රත් වෙලා යනවා. අදත් මේ වගේ අවස්ථාවලදි, හිතට මොකක්ද වගෙයි කියල මිනිස්සු අතර කතා වෙනවා. හංගගෙන ඉන්න කොට ඇඟ රත්වෙලා යන ගතියක් හරි තියෙනව නම් ඒකත් ගුණයක්. නමුත් කාලයක් යද්දි ඒ ගුණ නොකිය ඉන්න හිතෙන කොට අර රත් ගතිය නැති වෙලා ගිහින්, එතකොට පිට වෙච්ච ශක්තියෙන් තමයි රතු මුකුණුවැන්න ඇති වුණේ. ඒ ගති ලක්ෂණ නිසා යම්කිසි ඌනතාවයේ රෝගයක් හට ගත්ත නම් ඒකට අදාල ප්‍රත්‍ය ශක්තිය මේ මුකුණුවැන්න ශාකයේ තියෙනවා. **විශේෂයෙන් රක්ත හීනතාවයට ගැළපෙන්නෙ රතු මුකුණුවැන්න.** ඒ කාරණයට මුල් වෙච්ච කෙනාට මුකුණුවැන්නවල මුල් ගන්න ඕන.








උදාහරණ විදියට ගුණ මකු කරන්න මුල් වෙච්ච කට්ටිය හිටිය නම්, ඒකට හේතුඵලයක් වශයෙන් කවද හරි ඒ අයටත් විපාකයක් එන්න හේතු වෙනවා. ඊළඟට ඒකෙන් රෝගයක් හට ගන්නවා. එතකොට ඒකට මුකුණුවැන්න ශාකයේ මුල් ගන්න වෙනවා. ඒ වගේම යම් කිසි විදියකින් ගුණ හීනතාවයට කටයුතු කරන පිරිස් සමාජයේ ඉන්නවා. ඒ කියන්නෙ අනුන්ගෙ ගුණ මකාදාන්න ක්‍රියාත්මක වෙච්ච පිරිස්. ඒකත් පාපයක්. ඒකෙ හේතුඵලයක් වශයෙන් පසු කාලයක රෝගාබාධ එන්න පුළුවන්. එතකොට එහෙම ක්‍රියාත්මක කරන කොට (කරපු ඒවා) ගිලිහිච්ච ශක්තිය තමයි මුකුණුවැන්න කොළවල පිහිටන්නෙ. කළ ඒවා කොළවල පිහිටනවා. ඒකට දළ වශයෙන් එහෙම නැත්නම් බොහොම ලාවට සම්බන්ධ වෙච්ච ගතිය නිසා ගිලිහිච්ච ශක්තිය තමයි දළුවල පිහිටන්නෙ. එතකොට ඒකෙන් ඇති වෙච්ච ලෙඩ රෝගවලට මුකුණුවැන්න දළු ගන්න ඕන. ඊළඟට ගුණ මකා දමන්න, යම් කිසි ආකාරයකින් කෙනෙකුට දඬුවම් කරන තත්ත්වයට පත් වුනොත්, ඒකෙන් පිට වෙන ශක්තිය මුකුණුවැන්න දඬුවල තැන්පත් වෙනවා. එතකොට ඒකට විපාක විදියට අත පය දරදඬු වෙලා හන්දිපත් රුදා වගේ රෝග හැදෙන්න පුළුවන්. ඒ කියන්නෙ ගුණමකු කරන්න දරදඬු වුණා. එතකොට දරදඬු වෙච්ච කෙනාට මුකුණුවැන්න දඬු ගන්න ඕන. ඇඟ පත උස් මහත් වෙලා කරදඬු මහත් වෙලා තියෙනව කියල අදත් කතාවට කියන්නෙ, ඇගේ පතේ හයිහත්තිය තියෙන කොට. ඒ වගේ ඇඟ පතේ (කරදඬුවල) හයිහත්තිය තමයි දඬුවම් දෙන්න පාවිච්චි කළේ. ඒකෙ විපාක වශයෙන් හන්දිපත්වල කැක්කුම්, අතපය හිරිවැටීම් ආදිය එන්න පුළුවන්. එතකොට මුකුණුවැන්න දඬුවල ඒකට අවශ්‍ය ගුණය තියෙනවා. ඊළඟට මේ හැම දේකටම සම්බන්ධ වුනොත් මුළු මුකුණුවැන්න ශාකයම ගන්න වෙනවා. මේ විදියට කොහොම හරි අන්තිමට බැලුවම මුකුණුවැන්න ගහ පුරාම තියෙන්නෙ, පෙර තිබිච්ච ගුණ දුරස් වෙලා ගිහින් තැන්පත් වෙච්ච ශක්තිය. මුකුණුවැන්නවල විතරක් නෙවෙයි අනෙක් හැම ශාකයකමත් මුල්, පොතු, කොළ, දඬු, දළු, මල් ආදී වශයෙන් ඒ ඒ ගුණයන්ට අදාලව පිට වෙච්ච ශක්ති විශේෂයන් පිහිටනවා.


ඊළඟට ඉස්සර හිටපු මිනිස්සු ළඟ පහත් දේවල්වලට බහින්නෙ නැති හොඳ ගති ලක්ෂණයක් තිබුණා. බට කියන්නෙ බැස්සා කියන එක. නමුත් පසු කාලයකදි මිනිස්සු තමන්ගෙ පැවැත්මට නොයෙක් නරක දේවල්වලට බහින්න පටන් ගත්තම, අර කලින් තිබිච්ච හොඳ ගතිගුණයන්ට අදාල ශක්තිය පිටවෙලා ගිහින් බටු කියන ශාකයක් හට ගෙන ඒකෙ තැන්පත් වුණා. ඒ කියන්නෙ පෙර තිබිච්ච, නරකට බහින්නෙ නැති ගති ලක්ෂණය නැති වෙලා ගිහින් නරක වැඩවලට බැස්සා. ඒ වගේම ඒ නරක වැඩවලට බහින කොට නිකම්ම බැස්සෙත් නෑ. මිනිස්සු ඒවට විවිධාකාරයෙන් කටුක විදියට වෙළෙන්න පටන් ගත්තා. එහෙම වෙළිල තමයි පහත් වැඩවලට බැස්සෙ. කටුවැල් හා සමානව ඒ වගේ වැඩවලට බහින්න පටන් ගත්තම කටුවැල් බටු කියන ශාකය ඇති වුණා. කටු වැලක් වගේ ගුණ බහින වැඩ කළානම් ඒකෙ දුක් විපාක පසු කාලයක එනවා. එතකොට ඒකෙන් හට ගන්න රෝගාබාධ තියෙනව නම් අදත් කටුවැල් බටු ඒකට ප්‍රත්‍ය වෙනවා. විශේෂයෙන් කටු වැලක් වගේ එතිල, ගුණයෙන් පහලට බහින ගති ලක්ෂණ එන කොට හිසේ කැක්කුම්, සෙම් අමාරු ආදිය හට ගන්නවා. නාහෙන් කටුවැල් වගේ සෙම් සොටුවැල් එතිල එනවා. අඬ අඬා හැපී හැපී කොච්චරවත් අඳෝනා කියන පහත් ගති ලක්ෂණවලට බහින කොට, ඒකෙන් එන රෝගවලට අර පිටවෙච්ච ශක්තිය නැවත දීල යථා තත්ත්වයට පත් කරන්න කටුවැල් බටු ඖෂධයක් වෙනවා. අදත් උණ, හෙම්බිරිස්සාව වගේ අමාරුකම්වලට කටුවැල් බටු ප්‍රත්‍ය වෙන්නෙ ඒ තියෙන ගුණය නිසා.

ඊළඟට සමාජයේ එළ ගතිය හෙවත් සුද්ධ ගතිය කියල දෙයක් තිබුණා. ඒ කියන්නෙ ගුණ ධර්ම, සද්ධර්ම ආදී හොඳම කොටස්. කාලයක් යන කොට මනුස්සයින් ඒ ගුණධර්මවලිනුත් පහතට බැහල යන්න පටන් ගත්තා. එතකොට මනුස්සයින් ළඟ තිබිච්ච ඒ සුද්ධ කොටස් ඉවත් වෙලා ඒක එළබටු කියන ශාකයේ තැන්පත් වුණා. ඒකෙ ස්වභාවයත් කටුකයි. ඒ නිසා ඒ ශාකයත් කටු සහිතයි.

ඒ වගේම තිත් කියන්නෙ යම්කිසි තැනක පිහිටනවා කියන අදහස. යමක් ගිහින් යම් තැනක පිහිටනවා. එතකොට කෙනෙක් නරකක් කරන්න බැස්සොත්, හදවතේ ඒ නරක පිහිටල කලින් තිබිච්ච හොඳ ගති ලක්ෂණය පිටවෙලා යනවා. ඒකෙන් තමයි තිත්බටු කියන ශාකය හට ගත්තෙ.

ඊළඟට වම කියන වචනය ☞

ගත්තම ඒකෙන් කියවෙන්නෙ යම්කිසි නරක පැත්තක්. වමනෙ කියන්නෙත් හොඳ දෙයක් නෙවෙයි, කුණක්. ගමනක් පිටත් වෙන කොටත් ඉස්සෙල්ලම දකුණු කකුල ඉස්සරහට තියල යනව මිසක් වම තියන්නෙ නෑ. කෙනෙකුට අතට අත දෙන කොටත් වම් අත දෙන්නෙ නෑ. මේ ආදී වශයෙන් වම් පැත්තෙන් පෙන්වන්නෙ යම් කිසි නරක පැත්තක්. එතකොට යමෙක් යහපත් පැත්තට බහින්නෙ නැතිව, වමට හෙවත් වැරදි පැත්තට බැස්සම හොඳ ගුණයක් පිට වෙලා යනවා. ඒ ශක්තිය තමයි වම් බටු කියල ශාකයක තැන්පත් වෙන්නෙ. එතකොට කලින් තිබිච්ච ගුණය වම්බටුවල තියෙනවා. බටු වර්ග වුනත් මේ වගේ විවිධ ගුණයන්ගෙන්, ශක්තීන්ගෙන් පිහිටනවා.

අඹ කියන්නෙ හිතවත් බව. අඹ යාළුවා, අඹුව ආදී වශයෙන් කියන්නෙ ඒ හිතවත් බව පෙන්වන්න. තු කියන්නෙ තුච්ච කරල ඉවත් කරල දානවා, විසි කරල දානවා කියන අදහස. තු + අඹ - තුඹ කියන්නෙ හිතවත්කම් පහත් කරල හොඳ හිත නැති කරනවා කියන එක. එතකොට කලින් තිබිච්ච හිතවත්කමේ ගති ලක්ෂණයට අදාල ශක්තිය පිටවෙලා ගිහින් තුඹ කියන ශාකයක් හැදිල ඒකෙ තැන්පත් වුණා. ඒකත් හොඳ ඖෂධයක්. ඒ වගේම තු කරන කොට ඒකට තිත්ත කරනව කියලත් කියනවා. ඒ කියන්නෙ එපා කරවනවා. මේ නිසා තුඹවලටත් තිත්ත රසක් තමයි තියෙන්නෙ. ඒ ඒ ගති ලක්ෂණයට අනුව තමයි රසය කියන එක පිහිටන්නෙත්. තිත්ත කිච්චමත් විවිධ ස්වභාවයේ තිත්ත රස තියෙනවා.







ඊළඟට මනුස්සයින්ගෙ ළය / හිත කෲර බවට පත්වුනාම කර වෙලා ගිහින්, කරවිල කියන ශාකයක් හැදිල ඒකෙ තැන්පත් වුණා. හිත කෲර වුනාම ඒකත් කර්කෂයි, තිත්තයි. යම් කිසි කෙනෙකුට තු උඹ කියල කෲර හිතකින් සැලකුවම, ඒක තමයි තුඹ කරවිල වෙන්නෙ.

ඒ වගේම ලෝකයේ තියෙන මිහිරියාව අස් කරන්න කටයුතු කළාම, ඒකට අදාල ශක්තිය පිටවෙලා ගිහින් මිරි + අස් - මිරිස් කියල ශාකයක තැන්පත් වුනා. ඊළඟට තවත් පැත්තකින් ග්‍රාම්‍ය හෙවත් පහත් බවට පත් වෙලා මිහිරියාව අස් කරන්න කටයුතු කළාම, එතකොටත් කලින් තිබිච්ච හොඳ ගතියකට අදාල ශක්තියක් තමයි අස් වුනේ. ඒක තමයි ගම්මිරිස් කියල තැන්පත් වුනේ. ඒක මිරිස්වලටත් වඩා සැරයි. මේ විදියට එකින් එකට ඒවායේ ශක්ති විශේෂත් වෙනස් අන්දමින් පිහිටනවා.

ඒ වගේම එදා සමාජයේ යහපත් දේවල්වලට ආලය කරන, ඇලුම් කරන ගති ලක්ෂණයක් තිබුණා. ඒ වගේ යහපත් දේවල්වලට ආලය කරනව නම් තමයි පෝෂණය එකිනෙකා ළඟ තියෙන්නෙ. එතකොට අනෙකාට පෝෂණයට අවශ්‍ය මොනව හරි ගෙනිහින් දෙනවා. නමුත් කාලයක් යද්දි ඒ ආලය කරන ගති ලක්ෂණයත් අත් හැරිල ගියාම පෝෂණය අඩු වෙන්න පටන් ගත්තා. ඒ ශක්තිය තමයි අලවල තැන්පත් වුනේ. ආහාරයට ගන්න හැම අල වර්ගයකම ඒ ශක්තිය විවිධාකාරයෙන් පිහිටනවා. සමාජයේ සමගිය සමාදානයට තියෙන ආලය අඩු වුනාම ශරීර විශාල වශයෙන් පෝෂණයෙන් බහිනවා. එතකොට අර ඉවත් වෙච්ච ගති ලක්ෂණයේ ශක්තිය නැවත ගන්න අල වර්ග ආහාරයට ගන්න වෙනවා.

ඊළඟට මනුස්සයින්ගෙ ළය වණ වෙච්ච ලක්ෂණය නිසා තමයි ලවණ හෙවත් ලුණු ඇතිවුණේ. ළය වන වෙනවයි කියන්නෙ දයානුකම්පාවෙන් ළයෙහි වූ උණුවීම නැති වෙලා යන එක. ඒ කියන්නෙ කාට හරි දුකක් කරදරයක් වුනාම, අනේ අපොයි මෙහෙම දෙයක් මේ මනුස්සයට සිද්ධ වුනානෙ ආදී වශයෙන්, හදවතින්ම හිතලම කම්පා වෙන ගති ලක්ෂණය ගිලිහිලා ගියා. තවත් කාලයක් යද්දි ඒ ශුද්ධ ගති ලක්ෂණය තිබිල පිරිහිලා ගිහින්, උන්ට හෙණගැහිල ගියත් කමක් නෑ කියල ළයෙහි වූ උණුවීම නැත්තටම නැති වෙලා ගියා. ඒකෙන් තිබිච්ච සුද්ධ ගතිය පිටවෙලා ගියාම ළයෙහි වූ උණු - ළූණු කියල හැදිල තැන්පත් වුණා. ඒ විදියට සුද්ධ වූ ළයෙහි උණුවීම කියන ලක්ෂණය පිට වුනාම සුදු ළූණු හැදුණා. ඒ නිසා සුදු ළූණු අනෙක් ළූණුවලට වඩා සැරයි. එතකොට **දයානුකම්පාව මුල් වෙලා තිබිච්ච ගති ලක්ෂණය නැති වෙලා ගියාම හට ගන්න රෝගවලට සුදු ළූණු බේතක් වෙනවා. ඒ නිසා තමයි පපුවෙ කැක්කුමට සුදු ළූණු විශේෂ වෙන්නෙ.**

ඒ වගේම සහලේ ගතිය කියන්නෙ මනුස්සයින් අතර තියෙන හිතවත්කම, නෑදෑකම, අපේ පිරිස කියන ළයාන්විත හැඟීම. මුලින්ම තිබිච්ච ඒ යහපත් ගති ලක්ෂණය කාලයක් ගියාම පිරිහිලා ඒක උල් කරල දාන තත්ත්වයක් ආවා. ඒ ගති ලක්ෂණයට අනින්න, තමන්ගෙ අයට බනින්න දොස් කියන්න පටන් ගත්තා. එතකොට ඒ ගුණ ධර්මත් කලින් වගේම පිට වෙලා ගිහින් ළය උල් වෙන්න පටන් ගත්තා. ඒ විදියට සහලේ අයට උල් වුනාම තමයි ඒ ශක්තිය පිටවෙලා ගිහින් උළුහාල් හටගන්න හේතු වුණේ. එතකොට උළුහාල්, සුදු ළූණු කියන්නෙ එකට ගැලපෙන ඖෂධ ශක්තිය තියෙන වර්ග දෙකක්. ඒ ගති ලක්ෂණ පිටවෙලා ගියාම ඒ හේතුවේ ඵලයක් විදියට විපාකයක් හට ගන්නවා. ප්‍රවෘත්ති විපාක වශයෙන් ලෙඩරෝග එනවා. ඒ ලෙඩ රෝගවලට ප්‍රත්‍යය උළුහාල්, සුදු ළූණුවල තියෙනවා.

ඊළඟට කලු කියන්නෙ කලු පාටට විතරක් නෙවෙයි. කාන්තිමත් බවටත් කළු කියල කියනවා. දකුම්කළු, කන්කළු ආදී වශයෙන් කියන්නෙත් ඒ නිසා. හඳේ කළුවර කියන්නෙත් හඳ එළියට.

පායන්නේ හඳේ කළුවර වැඩිවෙන්න ... ආදී වශයෙන් කවිත් තියෙනවා. කාන්තිමත් ගතිය තමයි ඒ හැම එකකින්ම කියවෙන්නෙ. එතකොට මුල් කාලෙ මනුස්සයින්ගෙ හදවත්වලත් මේ කාන්තිමත් ගති ලක්ෂණය තිබුණා. නමුත් පසු කාලෙක ඒ ගති ලක්ෂණයත් දුරුවෙලා ගියා. ඒ පිටවෙච්ච ශක්තියෙන් කළුදුරු හැදුණා. ඊළඟට සුළු වශයෙන් හරි තිබ්ච්ච කාන්තියක් තිබුණ නම් පසු කාලෙක ඒකත් දුරු වෙලා ගියා. ඒක සුදුරු වුණා. සුළුදුරු තමයි සුදුරු වුනේ. ඊළඟට ගුණයෙන් තියෙන මහත් ගතිය දුරු වෙලා ඒ ශක්තිය ගිහින් මහදුරුවල තැන්පත් වුණා. මේ විදියට හොඳ ගති ලක්ෂණම තිබිල දුරු වෙච්ච නිසා තමයි ඒ ශක්තිවලින් මේ විදියට විවිධ දුරු වර්ග හැදුනෙ. එතකොට ඒකට හේතුඵල වශයෙන් එන කර්ම විපාකවලින් ඇතිවන රෝගාබාධවලට මේ දුරු වර්ග බෙත් වෙනවා.

හීන් ගුරු කියන්නෙ පුංචි පුංචි ගුරුකම්වලට. ඒව සමාජයේ පැතිරිලා හැම කෙනෙක්ම වගේ දැන ගෙන හිටපු ගුරුකම්. විශේෂයෙන් වැඩිහිටි අය ඒව දැනගෙන හිටියා. ඒවට මහ විශේෂ ගුරුවරු ඕන වුනේ නෑ. සාමාන්‍ය අයටත් ඒ ගුරුහරුකම් දෙන්න පුළුවන් වුණා. හීන් ගුරු කියන ඒ ගති ලක්ෂණයත් පිරිහිලා ගියාම, ඒ ශක්තියත් පිටවෙලා ඉඟුරු විදියට පිහිටියා. ඒ කියන්නෙ ගුරුහරුකම් දෙන්නෙ නැතිව ගුරුමුෂ්ටී වශයෙන් හංග ගත්තා. පොඩි දෙයක්වත් දෙන්නෙ නැතිව හිටියා. ඒක තමයි ඉඟුරු කියල ශාකයක් හට ගන්න මුල් වුනේ.

ඒ වගේම සමාජයක තියෙන යහපත් දේවල්වලට, සුද්ධ දේවල්වලට සා කියල කියනවා. සාදු කියල කියන්නෙත් යහපතක් වෙන්න කියන එක. එතකොට මේ යහපත් සුද්ධ දේවල් ක්ෂය කරල දැම්මම ඒක තමයි ක + සා - කසා කියන්නෙ. ඒ ගුණයෙන් පිට වෙච්ච ශක්තියෙන් තමයි කහ ශාකය හට ගත්තෙ. පාටත් ඊට අනුකූලයි. එතකොට යම්කිසි තැනක අපිරිසිදු බව ඉවත් කරල, නැවත පිරිසිදු කරන්න කහ පාවිච්චි කරනවා. ඒකෙ තියෙන විෂබීජ නාශක ශක්තිය නිසා තමයි මැස්සන් ආදී සතුන් එන කොට අදත් බිමට කහ දියර ඉසින්නෙ.

ඊළඟට මුල් කාලවල හිටපු මිනිස්සු ලයාන්විත බව කියන ගුණය භුක්ති වින්දා. නමුත් පසු කාලෙක ඒ ලයාන්විත බව භුක්ති විඳින්නෙ නැතිව ගියා. එතකොට ඒකට අදාල ශක්තිය පිටවෙලා ගිහින් ලබු කියන ශාකයේ තැන්පත් වුණා. මේ කියන ලයාන්විත බව තමයි මෘදු බවට හේතු වෙන්නෙ. ඒ නිසා මෘදු බව නැති රෝගවලට අදත් ලබු ඖෂධයක් විදියට ගන්නවා. විශේෂයෙන් ලබුවලින් මේ විදියට බෙතක් හදාගන්න පුළුවන්. **ඉඟිනි ඇට අරගෙන කුඩු කරල ඒක ලබු ඉස්මෙන් අඹරගෙන, එළඟි තෙල් ටිකක් එකතු කරල මිශ්‍ර කරගෙන, පොඩ්ඩක් රත් කරගත්තම, හන්දිපත් අමාරුවලට හොඳ ඖෂධයක් වෙනවා. නමන්න බැරි හන්දිපත් අමාරුකම්, හිරවෙලා තියෙන හන්දිපත්, කකුල් දරදඬු වෙලා හිරවෙලා තියෙන අවස්ථා, නවන්න දිග හරින්න බැරිව**



**තියෙන අත් පා, හන්දිපත්වල පුරුක් හිරවෙලා තියෙන අවස්ථා, දණිස් හිරවෙලා නවන්න බැරි අවස්ථා.. ආදී රෝගවලදී ඒ හන්දිපත්වල ගාන්න මේ ඖෂධය ඉතා හොඳයි.** හැබැයි පරිස්සමින් ගාන්න ඕන, වැඩිය ගාන්න හොඳ නෑ. මොකද වැඩිය ගෑවොත් හන්දිපත්වල අස්ථීත් එක්කම මෙලෙක් වෙන්න පුළුවන්. ඒ නිසා දිනකට එක් වතාවක් බැගින් උදේ වරුවෙ, දින 4 - 5 ක් පමණ ගෑවම ප්‍රමාණවත්. ඒ විදියට ආලේප කිරීමෙන් හිරවෙලා නමන්න බැරිව තියෙන හන්දි, දිග ඇරිල නැවෙන්න පටන් ගන්නවා. ඒවායේ තියෙන වේදනා කැක්කුම් සමනය වෙනවා.

ඒ වගේම මුල් කාලෙ සමාජයේ හිටපු මිනිස්සුන්ට හොඳ ලයක් තිබුණා. ඊට පස්සෙ ඒ ලය පුහු වෙලා ගියා. ඒ ශක්තිය පිට වෙලා ගිහින් තමයි පුහු + ලය - පුහුලය කියල පිහිටියේ. අදත් ලේ අසුද්ධ වුනාම පිරිසිදු කරන්න, සීතල කරන්න පුහුල් ගන්නවා. සිසිල් කරන ශක්තියක් ඒකෙ තියෙනවා.

වට්ට කියන්නෙ සැරිසරනවා කියන එක. අක්ක කියන්නෙ අක්‍රීය කරනවා කියන එක. යහපතට සැරි සැරීම හෙවත් සුගතියේ සැරිසැරීම මුල් කාලයේ තිබ්ච්ච ගති ලක්ෂණයක්. ඒ ගති ලක්ෂණ අක්‍රිය වුනාම ඒකෙන් තමයි වට්ටක්ක හැදුනෙ. ඒ වගේම සැරිසරනවයි කියල ලෝකය වැළඳ ගන්න එක තමයි කළේ. ඒ නිසා වට්ටක්ක වැළකට සම්බන්ධ වුණා.

දෑ / දේ කියන වචනවලින් පෙන්වන්නෙ තමන්ගෙ දෑය / දේශය කියන අදහස. පෙර හිටපු මනුස්සයො තමන්ගෙ දේශීය දේවල් අල්ලගෙන තමයි වැඩ කෙරුවෙ. නමුත් කාලයක් යද්දි තමන්ගෙ දෑයේ තියෙන දේශීය දේවල් අහක දාල පිට දේශවල ඒව ගන්න ගියාම දේ + අල් කියන ගති ලක්ෂණය විසි වෙලා ගිහින් දෙල් කියන ශාකයක් හට ගත්තා. අදත් යම් කටයුත්තක් කරන්න ගිහින් හරියට කෙරුනෙ නැතිවුනාම වැඩේ දෙල් වෙලයි කියල කතාවටත් කියනවා.

ඉස්සර හිටපු මිනිස්සු ළඟ නැති බැරි කමට කෙනෙක්ගෙන් යමක් ඉල්ලන කොට, ඒකට ළය පාත්‍ර වෙන ගතියක් තිබුණා. ඒ කියන්නෙ තමන්ගෙ නැති බැරිකම අවංකව කියල තමන්ට යමක් දෙන පුද්ගලය වෙතට නැමිල තමයි ඒක භාර ගත්තෙ. නමුත් පසු කාලයක ඒ විදියට ළය පාත්‍ර වෙච්ච ගතිය, නැමෙන ගතිය නැති වෙලා ගිහින්, කපටිකමින් වංචාවෙන් ඉල්ලන්න පටන් ගත්තම ඊට අදාල ශක්තිය පිට වෙලා ගියා. ඒ ශක්තියෙන් තමයි පාත්‍ර වූ ළය හෙවත් පත වූ ළය - පතෝල කියල හට ගත්තෙ. එතකොට ඒකෙ ස්වභාවයත් නැමෙන සුළුයි. ගුණයත් ඒ වගේමයි. නිවිච්ච ස්වභාවයක් ඇති කරනවා. ඒ නිසා ලෙඩ්ඩුන්ට දෙනවා.

ඊළඟට වැටකොළු ගත්තමත් මේ හා සමාන ලක්ෂණ තියෙනවා. පත වූ ළයෙන් පස්සෙ ඇති වුනේ දෙපැත්තට වැනෙන ගති ලක්ෂණයක්. ඒ කියන්නෙ තමන්ට යම් උදව්වක් ගන්න ඕන වෙන කොට, ළය පාත්‍ර වූ ගතියෙන් ගන්නවද නැද්ද කියල තරමක් රළු වෙලා වැට උඩ ඉන්න ආකාරයේ ළයක් තමයි ඇති වුණේ. මේ දෙපැත්තටම හැරෙන්න ඔන්න මෙන්න කියන තත්ත්වයට පත් වුණා. ඒකත් එක මට්ටමකින් නරක නෑ. එතකොට වැටක වූ ළය කියන ගති ලක්ෂණයක් මුල් කාලෙ මිනිස්සුන්ට තිබුණා. නමුත් පසු කාලයක ඒකත් ☞

විහිදිලා ගිහින් වැටකොළු විදියට පිහිටියා. ගති ලක්ෂණය නිසා ඒක පතෝලවලට වඩා රළුයි. ඒ නිසා තමයි රළුවට දාර හිටින්නෙත්. වැටක ස්වභාවය ඒකෙ තියෙනවා. ඒ කියන්නෙ පතෝලවල තැන්පත් වුනේ සම්පූර්ණයෙන්ම ළය පාත්‍ර වෙන ගතිය. වැටකොළුවල ඊට වඩා රළු ගතියක් එහෙම නැත්නම් ඒ ගතියෙන් කොටසක් තමයි පිහිටියෙ. ඒ නිසා තමයි පතෝලවලට වඩා වැටකොළු රළු වෙන්නෙ. කලින් තිබිච්ච ගුණයට අනුවමයි ශාකයේ ස්වභාවය එන්නෙ. එතකොට පාත්‍ර වූ ළයක ස්වභාවයයි, ළය දෙපැත්තට වැනෙන ස්වභාවයයි කියන්නෙ එක්තරා ආකාරයක වැළඳ ගැනීමක්, නැමීමක් හා සමානයි. ඒ නිසා තමයි ඒව වැල් විදියට පිහිටියේ.

ඊළඟට බන්ඩිය කියල කියන්නෙ බඩට කියන තවත් වචනයක්. අක්ක කියන්නෙ අක්‍රිය කරනවා. බණ්ඩිය අක්‍රිය කරනව කියන්නෙ ආහාර දිරවන්නෙ නැතිව බඩ වේලුම් කරනව කියන එක. ඉස්සර හිටපු මිනිස්සු ළඟ තවත් කෙනෙක් ඩබගින්නෙ ඉන්නව දැක්කම, කතා කරල මොනව හරි කන්න බොන්න දෙන ගති ලක්ෂණයක් තිබුණා. නමුත් පසු කාලෙක කන්න බොන්න තිබුණත් එහෙම දෙන්නෙ නැතිව හිටියා. එතකොට බඩ වේලෙන්න පටන් ගත්තා. බඩ ගින්නෙ ඉන්න කොට බඩ අක්‍රිය වෙන්න පටන් ගත්තා. කලින් තිබුණ ගති ලක්ෂණයට අදාල ඒ ශක්තිය පිට වෙලා ගිහින් බණ්ඩ + අක්ක - බණ්ඩක්ක විදියට ශාකයක පිහිටියා. අදත් බඩ වේලෙනවට බණ්ඩක්කවල ඖෂධ ශක්තියක් තියෙනවා. හරියට පර්යේෂණ කරල ගත්තොත් සමහර විට ඒ වගේ රෝගවලට බණ්ඩක්කවලින් බේත් නිෂ්පාදනය කරන්නත් පුළුවන්. ඒ තමයි බණ්ඩක්කවල තියෙන ද්‍රව්‍ය පදාර්ථවලට හිමි ලක්ෂණය.

ඒ වගේම කෙනෙකුට බඩගිනි එනව නම් ඒක දැනෙනවා. ඒක තමයි පාසය කියන්නෙ. පා, පි ආදී වචනවලින් පෙන්වන්නෙ කන බොන දේවල්. පානය, පිපාසය කියන කොටත් ඒ බව හැඟෙනවා. එතකොට කෙනෙක්ගෙ බඩ ගින්න හඳුනන ගතිය තමයි ඥ කිව්වෙ. ඥාණය කියන්නෙත් එහෙම යමක් හඳුන ගන්න පුළුවන් ශක්තියක්. ''උඹ ඉන්නෙ බඩ ගින්නෙ නේද ? කෑවෙ නෑ නේද ? මට පේන්නෙ කාල නෑ වගේ. මොනව හරි කමු.'' මේ ආදී වශයෙන් අහන සිරිතක් මුල් කාලෙ මිනිස්සු ළඟ තිබුණා. යම් කිසි කෙනෙක්ගෙ බඩගින්න, පිපාසය දකින මේ ගුණය කාලයක් යන කොට පිරිහිලා ගියා. එතකොට පිට වෙච්ච ශක්තිය ගිහින් පි + පි + ඥ - පිපිඤ්ඥා කියල ශාකයක තැන්පත් වුණා.

ඒ වගේම හොඳ ගුණවතුන්ගෙ සිරිතක් තමයි නොකා නොබී හිටියත්, කවුරුවත් ඇහුවම කාල බීලද ඉන්නෙ කියල, ප්‍රශ්නයක් නෑ කාල ඉන්නෙ කියන සිරිත. ඒ කියන්නෙ බඩගිනියි කියල කෑ ගහගෙන ඉල්ලගෙන කන්නෙ නෑ. අනික් කෙනෙකුට කරදරයක් නොවෙන්න, එහෙම ඉන්න ගතියත් හොඳ ගති ගුණයක්. ඒ විදියට නොකා නොබී හිටියත් කෑව කියන ඉරියව් (කෑ කී ඉරියව්) තමයි කෑ කිරි කියන්නෙ. නමුත් පස්සෙ කාලෙක මිනිස්සු







කන්න දෙනකල් හුල්ල හුල්ල බලාගෙන ඉන්න පටන් ගත්තා. අර වගේ කෑවයි කියන්නෙ නැතිව හිටියා. ''ගිය තැනකින් කන්නවත් දුන්නෙ නැනෙ.'' මෙහෙම බලාපොරොත්තුවෙන් මොනව හරි කාල බීල එන්නම කොහේ හරි යනවා. ඒ ගතිය ආවට පස්සෙ අර කලින් තිබිච්ච ගුණය පිරිහිලා ගියා. ඊට පස්සෙ ඉල්ලගෙන කන තත්ත්වයට පත්වුණා. ඒ විදියට කලින් තිබිච්ච කෑවයි කියන ඉරියව් නැති වෙලා ගිහින් ඒකට අදාල ශක්තිය කැකිරි විදියට ශාකයක තැන්පත් වුණා.

ඊළඟට යම් කිසි විදියකින් තැනට ඔබින විදියට කරන කියන කටයුතුවලට තත් කාලීන කටයුතු කියල කියනවා. ඒ කියන්නෙ ඒ ඒ තත්ත්වයන්ට අනුකූලව තමන් විසින් කළ යුතු දේවල්. ඒ වගේම තමාගෙ තත්ත්වය මෙහෙමයි කියල දැනගෙන කටයුතු කිරීම. ඒ ඒ තත්ත්වයන්ට අනුව කාලීනව කටයුතු කරන ගති ලක්ෂණය නැති වුනාම, මනුස්සයො අන්තිමට පහත් තත්ත්වයට වැටිල නැති ගුණයක් පෙන්න ගෙන වැඩ කරන්න පටන් ගත්තා. ඒ කියන්නෙ තත්කාලීන වැඩවලින් ඈත් වුණා. එතකොට පිට වෙච්ච ශක්තිය තමයි ගිහින් තක්කාලි විදියට තැන්පත් වුණේ. කෙනෙකුට යම් කිසි විදියකින් තමන්ගෙ තත්ත්වය නොදන්න මට්ටමට එනවයි කියන එක එක්තරා විදියක වික්ෂිප්ත තාවයක් ඇති කරන්න හේතු වෙනවා. ඒකටත් ගැලපෙන රසයක් තක්කාලිවල තියෙනවා.

දැන් මේ විදියට මේ හැම ශාකයකටම මොකක් හරි ගුණයක් තියෙනවා. ඒ තමයි මුල් කාලවල හිටපු මනුස්සයින්ට තිබිච්ච ගුණ ධර්ම පිරිහිලා ගිහින් ඊට අනුකූලව තැන්පත් වෙච්ච ශක්තියෙන් එන ගුණය. ඒ ගුණය මොකක්ද කියල අපි දන්නෙ නැතිවට, ඒ ඒ ශාක ආහාර විදියට ගත්තම ඒක ඇඟට ඇතුල් වෙනවා. ඒ තමයි ද්‍රව්‍ය පදාර්ථවල පිහිටපු ශක්තිය. මනුස්සයො ඕක නොදැන ඉන්න එක තමයි අද තියෙන ප්‍රශ්නය. නොදැන ගත්තත්, අපෙන් ගිලිහිලා ගියපු ඒ ශක්තිය මේ ශාකවලින් නැවත ලැබෙනවා. එතකොට ඒවට අදාල ගුණත් විවිධාකාරයි. ඒ නිසා තමයි විවිධාකාර ශාක හැදිල ඒවායේ විවිධ ඵල හට ගෙන විවිධ රසයන්, ගුණයන් ඇති වෙන්නෙ. අදාල ගති ලක්ෂණවලට අනුකූලවම තමයි රසයක් වුනත් ඇති වෙන්නෙ. එහෙම නැතිව නිකං හැදෙන ක්‍රමයක් නෑ. සියල්ලම හේතු ඵලයි. මේ හැම ශාකයකම තියෙන රසය බැලුවොත්, ඒ කියපු ගති ලක්ෂණවලට අනුකූල දෙයක්ම තමයි ඒ හැම එකකම තියෙන්නෙ. අපි ළඟ තිබිච්ච ගති ගුණ පිරිහිලා ගියාම, ඊට අදාල ශක්තිය පිටවෙලා ගියාම ශරීර පෝෂණය වෙන්න නම් නැවත ඒවා ගන්න වෙනවා. ඒක තමයි මේ ස්ව + ක - ශාකවල තැන්පත් වෙන්නෙ. ක්ෂය වෙච්ච දේ ආපහු ගත්තම ඒ ගුණ නැවතත් ලැබෙනවා. ස්ව හැදෙනවා කියන්නෙ මම කියන කෙනෙක් බිහි වෙලා ඉන්නව කියන එක. එතකොට පංචස්කන්ධයක් හැදෙන්න නම් ඒ පිට වෙච්ච ශක්තිය ආපහු දෙන්න ඕන. එහෙම දුන්නම තමයි පෝෂණය වෙලා සෞඛ්‍ය සම්පන්න ශරීරයක් ඇති වෙන්නෙ.

ඊළඟට මේ වගේ හොඳ ගති ගුණවලට අදාල ශක්තිය වගේම නරක ගති ගුණවලට අදාල ශක්තියත් පිට වෙලා ගිහින් ශාකවල තැන්පත් වුණා. නියඟලා කියන්නෙ ඒ වගේ නරක ශක්තියකින් ඇති වෙච්ච ශාකයක්. මේ ගැන මීට කලින්

ලිපියකින් විශේෂ විග්‍රහයක් කරල තියෙන නිසා, මේ අවස්ථාවට අවශ්‍ය වෙන ප්‍රමාණයට පමණයි මේ ලිපියෙන් විග්‍රහ වෙන්නෙ. මුල් කාලෙ නිය අඟලක් වවාගෙන ලස්සනට පාට කරගෙන, වැඩක් පලක් නොකර හිටපු අය නිසා තමයි මේ නියඟලා ඇති වුණේ. මුල් කාලෙ හිටපු ස්ත්‍රීන් අද වගේ වැඩ පල කෙරුවෙ නෑ. නිකං ලස්සනට විතරයි හිටියෙ. පිරිමි විතරයි ඒ කාලෙ වැඩ කළේ. එතකොට ලස්සනට හැඩ වෙලා හිටියට, එහෙම ඉන්න හොඳ නැනෙ කියල හැම වෙලේම ඇතුලෙන් තැවෙන්න ගත්තා. ඒක එළියට පිට කළේ නෑ. ඒ නිසා ඒ ගතිය හිත ඇතුලෙන් වසං කරගෙන තමයි හිටියෙ. කාලයක් යද්දි අඟ හිඟකම් ඇති වෙන කොට සමාජයේ පිරිස් ඒකට ප්‍රිය කරන්නෙ නැතිව ඊරිසියා කරන්න පටන් ගත්තා, ඒ අයගෙන් වැඩ ගන්න පටන් ගත්තා. හැබැයි වැඩ කළේ කැමැත්තෙන් නෙවෙයි, හිත ඇතුලෙ තරහෙන්. එතකොට ඒ ගතිය පිට වෙලා ගිහින් ඇති වෙච්ච නියඟලා විස ගතියකින් පිහිටියා. මොකද ඒ ගතිය ඇති වෙන කොට ඒක පුද්ගලය වසන් කරගෙන තමයි හිටියෙ. ඒ නිසා තමයි නියඟලා වස වුනේ. නියඟලා මලේ කලා රසය තියෙනවා. ඒ තමයි අර ලස්සනට හිටපු ගතිය. ඒ වගේම අලේ විස ගතිය තියෙනවා. ඒ තමයි කෲර වෙලා වසන් කරපු ගතිය. හැබැයි විස වුනත් ඒකත් බේත්වලට ගන්නවා.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, විසක් කොහොමද බේතක් වෙන්නෙ කියල. ඒක සිද්ධ වෙන්නෙ විසෙන් විස නසන න්‍යායෙන්. සාමාන්‍යයෙන් සැඩ පරුෂ වෙලා ඉන්න මනුස්සයෙකුට (පිරිමියෙකුට) කාන්තාවක් බැන්නොත්, ඒ සැඩ පරුෂ ගතිය බහිනවා. වෙනත් අය එක්ක වගේ රණ්ඩු සරුවල් කරන්න යන්නෙ නෑ. ඒක සමාජයේ දකින්න තියෙන සාමාන්‍ය පොදු ලක්ෂණයක්. එතන තියෙන්නෙත් විසෙන් විස නසන ක්‍රමයක්. ඒ ගති ලක්ෂණය මුලින් තිබුනෙ ලස්සන ස්ත්‍රීන්ට. ඒ අයට මනුස්සයො හරිම ආදරෙයි. ඒ නිසා මනුස්සයො මොන විදියට තරහ වෙලා වැඩක් කරගන්න ආවත්, ස්ත්‍රියක් මොනව හරි කිව්වොත් ඒකට යටත් වෙනවා. එතකොට අර හිතේ තියෙන තරහ කියන විස ගතිය බහිනවා. ඒ ගති ලක්ෂණය අදත් නියඟලාවල තියෙනවා. සර්පයෙක් දෂ්ට කරල සිහිමූර්ඡා වුනාම ඒ විස බස්සව ගන්න නියඟලා භාවිතා කරනවා. ඒක ඉස්සර තිබිච්ච බේතක්. දැන් ඒක ගන්න කියනව නෙවෙයි. නමුත් එහෙම ක්‍රමයක් අභයරත්නාලංකාර හිමියන්ට මීට කලකට පෙර සමාධියට හසු වෙලා තියෙනවා. ඒත් ඒක ප්‍රායෝගිකව අත් හදා බලන්න අවස්ථාවක් ලැබිල නෑ. නියඟලා බේතක් වෙන ක්‍රමය තමයි ඒ විදියට සමාධියට ඇවිත් තියෙන්නෙ. ඒ නිසා මේ ක්‍රමය මේ ලිපියෙන් සටහන් කරන්නෙ, දැනට බේතක් විදියට පාවිච්චි කරන්න නෙවෙයි, සර්ප විෂ වෙද මහත්තුරු වගේ අයට මේ ක්‍රමය අත් හදා බලල සමාජයේ යහපත පිණිස යොදන්න පුළුවන් වෙන්න.

මේ ක්‍රමයෙදි නියඟලා අලේ





අරගෙන සුද්ධ කරල, වේලිච්ච ගඩොල් කැටයක් කුඩු කරල ඒ කුඩුත් එක්ක අඹර ගන්නවා. ඒකට ගන්න ඕන පුච්චපු තෙත නොබාපු අලුත් ගඩොල් කැට කැල්ලක්. මොකද වතුර මිශ්‍ර වුනොත් ඒකෙ ශක්තිය අඩු වෙනවා. පෝරණුවකින් ඒ වගේ ගඩොල් ලබාගන්න පුළුවන්. ඒක අරගෙන නියඟලා අලවලින් තමයි අඹරන්නෙ. මේ වර්ග දෙකත් සමසමව ගත්තම ප්‍රමාණවත්. සර්පයෙක් දෂ්ට කරල සිහිමූර්ඡා වෙච්ච කෙනෙකුගෙ හිස් මුදුන පොඩ්ඩක් තුවාල කරල, මේ මිශ්‍රණය තලපෙ වගේ තිව්වම, මොළේට බැහැල තියෙන විස ඇදල ඇවිත් සිහිය එනවා. සාමාන්‍යයෙන් ඒ වගේ මාරාන්තික වෙලා සිහි මූර්ඡා වෙලා ඉන්න වෙලාවට, හෘදය වැඩ කරනවද කියල හොයන්නත් බෑ. එතකොට මොළේ මැරුනොත් තමයි ජීවත් වෙන්න බැරි. ඒ වෙලාවෙදි මේ විසෙන් විස නසන ක්‍රමයෙන් ඒ විස මොළයට බහින්න පෙර ඇදල අරන් පුච්චල දානවා.

කෙනෙක් සිහිමූර්ඡා වුනාම ඒක හොයා ගන්න ක්‍රමයකුත් තියෙනවා. මොකද ඒ වගේ වෙලාවට හෘදය වස්තුව වැඩ කරනවද, හුස්ම ගන්නවද කියල හොයන්නත් අමාරුයි. හරියට මැරිල වගෙයි. මැරිල නැත්නම් පුද්ගලයගෙ ශරීරයේ කර්මජ තේජෝ ධාතු ශක්තිය තියෙනවා. ඒක අතිසියුම් උෂ්ණත්වයක්. ඒ නිසා නිකං ශරීරයට අත තියල හොයන්න බෑ. අත තිව්වම හරියට කෙහෙල් කඳක් වගේ සීතලයි. ඒ වගේ වෙලාවට වෙඩරු පිඬක් අරගෙන පපුවෙ හෘදය වස්තුව තියෙන කෙලින් උඩ පැත්තෙන් තියනවා. මැරිල නැත්නම් ටික වෙලාවක් යන කොට වෙඩරු පිඬ දියවෙන්න පටන් ගන්නවා. මොකද වෙඩරු පිඬ පුංචි උෂ්ණත්වයකටත් දිය වෙනවා. මැරිල නම් ඒක දිය නොවී එහෙම්ම තියෙනවා.

විසෙන් විස නසන මේ ක්‍රමය පරීක්ෂණ කරන උදවියට බොහොම වැදගත්. එහෙම නැතුව මේක හදිසියේ ප්‍රතිකර්මයක් විදියට ගන්න යන්න සුදුසු නෑ. නමුත් ඉස්සර හිටපු වෛද්‍යවරු මේ නියඟලාවල විසෙන් බේත් හදපු ක්‍රමයක් තිබුණා. පැරණි සර්ප විස වෛද්‍යවරු ඒ ක්‍රමය දැනගෙන හිටියා. පස්සෙ කාලෙක ඒක ගුරු මුෂ්ටි තියාගෙන හංග ගත්තා. නමුත් හොඳ සමාධියක් වඩපු කෙනෙකුට ඒ ක්‍රමය නැවත ගන්න පුළුවන්. ඒ විදියට ආපු ක්‍රමයක් තමයි මේ හෝඩුවාවක් විදියට ඉදිරිපත් කළේ. කල්පනාවෙන් පරීක්ෂණ කරල මේකෙ ඇත්ත නැත්ත බලාගන්න පුළුවන්. එහෙම කරල මේක සමාජයේ යහපතට යොදා ගන්න පුළුවන්.

දැන් මේ විදියට හැම ශාකයක්ම හැදිච්ච මූල හේතුවක් තියෙනවා. ඒ ශාකයට නම කවුරු දැම්මත්, ඒ නමේ නිරුක්තියෙන් අදාල ශාකයේ අඩංගු ද්‍රව්‍ය පදාර්ථ ගුණය කියවෙනවා. මොකද කවුරු නම දැම්මත් ඒක ගෙතෙන්නෙ පටිච්ච සමුප්පන්නව. එතකොට බෙහෙත් විදියට නොගන්න කිසිම ශාකයක් ලෝකෙ නෑ. හැම ශාකයකටම ඖෂධ ශක්තියක් තියෙනවා. ඒව නිකං හැදිච්ච ඒවත් නෙවෙයි. මනුස්සයින්ගෙන් ඉවත් වෙලා විහිදිච්ච ශක්තිය. ඊට අනුකූල දේ ගත්තම ඒ ශක්තිය නැවත ශරීරයට ලැබෙනවා.

ඉතිරි කොටස ලබන කලාපයෙන්.

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# මරණය, චුතිය සහ පටිසන්ධිය

(පසුගිය කලාපයෙන්: මරණයත් උපතත් අතර සිදුවන සංකීර්ණ ක්‍රියාදාමය....)


පසුගිය කලාපයෙන් විස්තර කරපු මරණය සහ උපත අතර සිදුවන අවස්ථා 6 ක සම්පිණ්ඩනයත්, ඊට අදාල සංකීර්ණ ක්‍රියාවලියත් විග්‍රහ කරන කොට, සමහර තැන් කෙනෙකුට තේරුම් ගන්න අපහසු වෙන්න පුළුවන්. ඒ නිසා ඊළඟ කාරණය විග්‍රහ කරන්න කලින් ඒ වගේ තේරුම් ගන්න අපහසු කාරණා කිහිපයක් ගැන කෙරෙන තවත් පැහැදිලි කිරීමක් තමයි මේ.

ඉස්සෙල්ලම මේ භවයයි, අත්භවයයි කියන දෙක තෝර ගන්න ඕන. යම් කිසි භවයක් අත් වුනාම ඒක තමයි අත්බැව කියන්නෙ. උදාහරණ විදියට මිනිස් භවය, තිරිසන් භවය, දේව භවය .... ආදී වශයෙන් භවය කියන්නෙ ඒ ඒ අවස්ථාව. සත්වයෙක් විසින් මේ මොකක් හරි අවස්ථාවක් අත්පත් කර ගත්තොත් ඒක අත්බැවක්. මේ නිසා එකම භවයක අත්බැව් කිහිපයක් තියෙන්නත් පුළුවන්. උදාහරණ විදියට මනුස්ස භවයක ඉන්න කෙනෙක් එතනින් මැරිල ගිහින් චුතියකින් තොරව නැවතත් මනුස්සයෙක් වෙනව කියන්නෙ, භවය වෙනස් නොවී අත්බැව් මාරු වුනා කියන එක. ඊළඟට නැවතත් ඒ මනුස්සය මැරිල ගිහින්, චුත නොවී මනුස්සයෙක්ම වෙලා උපන්නොත් ඒත් කලින් භවයමයි. නමුත් අත් බැව් කිහිපයක්.

ඊළඟට මේ මරණයයි චුතියයි අතර තියෙන වෙනස දැනගන්න ඕන. මොකද හුඟක් අය අද වෙන කොට මරණයටම චුති කියන්නත් පුරුදු වෙලා ඉන්නවා. සමහරු මේ දෙකම එකක් විදියට හිතාගෙන ඉන්නවා. මේ මරණය කියන වචනයෙන් පෙන්වන්නෙ ලෝක සම්මතව, මේ භෞතික මස් ලේ කයක අවසන්වීම. එහෙම නැත්නම් අපි මේ දකින සාමාන්‍ය මරණය. ඒ කාරණය හැමෝටම තේරුම් ගන්න පුළුවන්. හැබැයි **මස් ලේ කය මැරුණ කියල සූක්ෂම කය (කර්මජ කය) ඉවර වෙන්නෙ නෑ. ඒක එතැනින් ඉවත් වෙලා ක්‍රියාත්මක වෙනවා.** එතකොට චිත්තක්ෂණ 17 න් චුතිය කියන අවස්ථාව තියෙන්නෙ 14 වෙනි චිත්තක්ෂණයෙදි. මේ චුතිය කියන එක, අර මස් ලේ කය මැරෙනවත් එක්කම ගන්ධබ්බ අවස්ථාවෙදි සිද්ධ වෙන්නත් පුළුවන්. ඒ කියන්නෙ මනෝමය කායිකත්වයෙන් ඉන්න සූක්ෂම කායිකත්වයට එන කොට සිද්ධ වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් මස් ලේ කයේ මරණයෙන් තවත් සෑහෙන කාලයක් ගිහින් සිද්ධ වෙන්නත් පුළුවන්.

උදාහරණයක් විදියට මනුස්සයෙක් මැරිල සතර අපාගත පෙරේත අත්භවයක් ලබනව නම්, එතනදි භවය වෙනස් වෙන නිසා ඒ මොහොතෙදිම චුතියක් සිද්ධ වෙනවා. එහෙම නැත්නම් දේව අත්භවයකට යන කොටත් ඒ මොහොතෙදිම කලින් හිටපු මිනිස් භවය වෙනස් වෙන නිසා චුතියක් සිද්ධ වෙනවා. ඒ වගේම අට මහ නිරය, ඔසුපත් නිරය වගේ තැනකට යන කොටත් භවය වෙනස්වීම නිසා චුතිය කියන එක

සූක්ෂම කයේ සූක්ෂම හදවතේ ආකෘතිය




සිද්ධ වෙනවා. එහෙමත් නැත්නම් මනුස්සයෙක් මැරිල ඊළඟ අත්භවයෙ බලු, බළල් වගේ තිරිසන් භවක් ලබනව නම් එතනදිත් චුතියක් සිද්ධ වෙනවා. ඒ වගේම දෙවියෙක් දේව අත්භවයට හිමි ආයුස ගෙවිල තිරිසන් හෝ මනුස්ස හෝ වෙනත් භවයකට යන කොටත් මේ චුතිය කියන එක සිද්ධ වෙනවා. මේ මොන ක්‍රමයකින් හරි චුතියක් වෙනව නම් කලින් ලබල හිටපු භවය වෙනස් වෙන්න ඕන. ඒ කියන්නෙ ලබල හිටියෙ මනුස්ස භවයක් නම් ඊළඟට මනුස්ස නැතිව වෙනත් භවයකට යන්න ඕන. එතකොට තමයි මේ චුතිය කියන එක සිද්ධ වෙන්නෙ.

ඒ වගේම මේ මනුස්ස උප්පත්තිය කියන එක ත්‍රිහේතුක, ද්විහේතුක, අහේතුක කියන පටිසන්ධි අවස්ථා 3 කින් සිද්ධ වෙන්න පුළුවන්. අලෝභ, අදෝස, අමෝහ සහගත සිතකින් පටිසන්ධි ලැබුවොත් ඒ උපත ත්‍රිහේතුකයි. **අලෝභය ලැබීමටත්, අදෝසය සමගියටත්, අමෝහය නුවණටත් හේතු වෙනවා.** මේ තුනම එක පාරට ආවොත් ත්‍රිහේතුක වෙනවා. ධ්‍යාන මගඵල ලැබෙන්නෙ මේ ත්‍රිහේතුක උප්පත්තියක් තියෙන අයට. ඒ වගේම අලෝභ, අදෝස, අමෝහ කියන මේ තුනෙන් දෙකක් එකතු වෙලා පටිසන්ධි ලැබුවොත් ඒක ද්විහේතුක උප්පත්තියක්. විශේෂයෙන් අලෝභ, අදෝස දෙක තමයි එකට එන්නෙ. මේ වගේ ද්විහේතුක පටිසන්ධියකින් උප්පත්තිය ලබපු අයෙකුට හොඳ සැප සම්පත්තියක් තියෙන්න පුළුවන්. ඒ වගේම සාමයෙන් සමාදානයෙන් ඉන්න පුළුවන්. නමුත් ඥානවන්ත බවින් අඩුයි. මේ අයට ඒ අත්භවේ ඉඳගෙන ධ්‍යාන මගඵල ලබන්න බෑ. නමුත් ඕන පිනක් කර ගන්න පුළුවන්.

ඊළඟට අහේතුක උපතකදි යෙදෙන්නෙ කුසල විපාක උපේක්ෂා සහගත සංතීරණ හිතක්. ඒක විපාක හිතක්. මරණාසන්න මොහොතෙදි ඒ වගේ හිතක් මතු වෙලා ආවම ඒ විපාකයට යටත් වෙන්න සිද්ධ වෙනවා. මෙතනදි කුසල විපාකයකුත් තියෙනවා. මනුස්ස වෙන්නෙ ඒ හේතුවෙන්. නමුත් අලෝභ, අදෝස, අමෝහ කියන සිත් නෑ. තිබුණත් තියෙන්නෙ බොහොම ළදරු අවස්ථාවෙ සිත්. උදාහරණ විදියට දානයක් දෙනකොට කවුරුහරි කියනව, මේකට අතගහල පලයං කියල. එතකොට කිව්ව නිසා නිකන් අතගහල යනවා. ඒකෙ ශක්තිය බොහොම අඩුයි. එතනදි කුසල විපාක උපේක්ෂාවක් තියෙන්නෙ. අනේ කොච්චර හොඳයිද කියල පැහැදිලා තීරණයක් දුන්නෙ නෑ. මොකටද අත ගැහුවෙ, මොකක්ද කියල දන්නෙ නෑ. නමුත් නිකන් හිටියෙත් නෑ. කිව්ව නිසා අතගහල ගියා. ඉතිං අර හේතු තුනම නැති නිසා අහේතුකයි. **අහේතුකයෙකුට මේ කියන දහම් තේරුම් ගන්න හැකියාවක් නෑ. සසර පුරුදු මතු වෙලා ඇවිත් පිනක් කරගත්තොත් හැරෙන්න උපක්‍රමශීලීව (ප්‍රයෝග සම්පත්තියෙන්) පිනක් කර ගැනීමේ හැකියාවක් මේ අයට නෑ. ඒ අය සමාජයේ පහසුවෙන්ම අඳුන ගන්න පුළුවන්. කෙළතොල්ලො, මන්ද බුද්ධිකයො ආදී වශයෙන් හඳුන්වන්නෙ ඒ වගේ අය. කටේ තියෙන කෙළ ටිකවත් රැකගන්න තරම් හැකියාවක් ඒ අයට** ☞

නෑ.

ඒ වගේම ජාති අන්ධ, ජාති බිහිරි කියල හඳුන්වන, උප්පත්තියෙන්ම ඇස් පේන්නෙ නැති, කන් ඇහෙන්නෙ නැති අයත් අහේතුක වෙනවා. ඒ අයත් මන්ද බුද්ධිකයි. හැබැයි උප්පත්තියෙන්ම කිව්වෙ මවු කුසට ඇතුළු වුනාට පස්සෙ සිදුවන ඇස් අන්ධ වීමක් හෝ කන් බිහිරි වීමක් නෙවෙයි. මවු කුසට ඇතුලු වෙන්නත් පෙර පටිසන්ධි අවස්ථාවෙදි සිද්ධ වෙන දෙයක්. ඒ වගේ සමහර අයගෙ විශේෂත්වයක් තමයි කන් පෙති හෝ ඇස් බෝල නැතිව නිකන් කුහර විතරක් පිහිටීම. මවු කුසකට ඇතුලු වුනාට පස්සෙ වෙනත් බාහිර හේතුවක් නිසා ප්‍රවෘත්ති විපාක එල දීමක් වශයෙන් ඇස් අන්ධ වීම හෝ කන් බිහිරි වීම ජාති අන්ධ, ජාති බිහිරි නෙවෙයි. උදාහරණ විදියට මවට සරම්ප හැදීම නිසා බිහි වුනාට පස්සෙ දරුවට ඇස් නොපෙනී යන්න පුළුවන්. ඒක ජාති අන්ධ නෙවෙයි. ඒ අය අතරත් ඥානවන්තයො ඉන්නවා. ඒ නිසා ඒ වගේ අයටත් දහම් අවබෝධය ලබන්න පුළුවන්. නමුත් අහේතුකයෙකුට එහෙම බෑ.

දැන් එතකොට මේ කියන අවස්ථා 3 න් මොකක හරි මනුස්ස අත්භවයක ඉන්න කෙනෙක් මළාට පස්සෙ ඒ ත්‍රිහේතුක, ද්විහේතුක හෝ අහේතුක කියන අවස්ථා එකකින් තවත් එකකට මාරු වුනොත් අන්න එතනදිත් චුති-පටිසන්ධියක් වෙනවා. උදාහරණ විදියට අහේතුක මනුස්සයෙක් මැරිල ත්‍රිහේතුකයෙක් වෙලා නැවතත් මනුස්ස වෙනකොටත් චුති-පටිසන්ධි කියන දෙක සිද්ධ වෙනවා. ඒ කියන්නෙ මේ අවස්ථා 3 මාරු වුනොත් එතනදි චුතියක් ඇවිල්ල පටිසන්ධිය සිද්ධ වෙනවා. නමුත් ත්‍රිහේතුකයෙක් මැරිල නැවතත් ත්‍රිහේතුකයෙක්ම වෙලා ඉපදෙනව නම් එතනදි චුති-පටිසන්ධියක් නෑ. ඒ නිසා භවය මාරු වෙන්නෙ මේ අවස්ථා 3 න් එකක ඉඳල තවත් එකකට පරිවර්තනය වෙනව නම් තමයි. ඒ වගේ අවස්ථාවකදි මනුස්ස වෙලා ඉඳල මැරිල ගිහින් නැවත මනුස්ස වුනත් චුති-පටිසන්ධියක් සිද්ධ වෙනවා.

එතකොට මිනිස්සුන්ට සහ තිරිසනුන්ට වගේ මස් ලේ කයක් දෙවියන්ට, බ්‍රහ්මයින්ට, ප්‍රේතයන්ට නෑ. ඒ නිසා **මනුස්සයින්ට සහ තිරිසන් සතුන්ට වගේ දෙවියෙක්ගෙ, බ්‍රහ්මයෙක්ගෙ, ප්‍රේතයෙක්ගෙ කයේ මරණයක් සිද්ධ වුනා කියල ඉතුරු වෙච්ච මළ කඳක් පෙන්වන්න බෑ. අන්න මැරිච්ච දෙවියා, මැරිච්ච ප්‍රේතයා .... ආදී වශයෙන් මළ කඳක් පෙන්වන්න බෑ.** එහෙම මළ කඳක් පෙන්වන්න පුළුවන් වෙන්නෙ මස් ලේ කයක් තියෙන අයට. අනිත් අයට තියෙන සූක්ෂම කය, මැරෙන කොටම අතුරුදන් වෙනවා. නමුත් ඒ අයට මැරෙනව කියල එකක් වෙනම නෑ. උදාහරණ විදියට විදුලි කොටන කොට ආලෝකය එක පාරටම ඇවිත් යනවා. හැබැයි ආලෝකය ආපු ප්‍රභවයක් පේන්න නෑ. නමුත් පත්තු වෙන බල්බයක් එක පාරටම නිව්වොත්, ආලෝකය නැති වුනාට විදුලි බුබුල ඉතිරි වෙලා තියෙනවා. මේ වගේ සූක්ෂම කය තියෙන කෙනෙක් මැරෙනවයි කියන්නෙ හරියට විදුලියක් කොටනව වගේ. මස් ලේ කය තියෙන කෙනෙක් මැරෙනවයි කියන්නෙ විදුලි බුබුලක් නිවා දමනව වගේ. ඒ නිසා මනුස්ස, තිරිසන් වගේ අයට මස් ලේ කයක් තියෙන නිසා ඒකෙන් මැරුණට පස්සෙ මළ කඳ ඉතිරි වෙනවා, සූක්ෂම කය හෙවත් මනෝමය කාය වෙනම පිට වෙනවා. ඒ අවස්ථාවට මරණය කියල කියනවා. ඒ නිසා මරණයයි, චුතියයි කියල දෙකක් වෙන් කරන්න පුළුවන්. භෞතික මස් ලේ කයක් තියෙනව නම් ඒ කය මළාට පස්සෙ උතුජ රූප පරම්පරාවක් ඉතිරි වෙනවා. ඒක තමයි දින, මාස, අවුරුදු ගණන් යනකල් ඇට කටුත් එක්ක දිර දිරා යන්නෙ. මේ විදියට එක මස් ලේ කයකින් ඉවත් වෙන කොට ඒකට මරණය කියල කියනවා.

දැන් මෙහෙම මළාට පස්සෙ සූක්ෂම කය අහකට ගිහින් මස් ලේ කය වෙනම මළ කඳ විදියට ඉතිරි වෙනවා. හැබැයි අර ගෙනාපු මනුස්ස භවය තවම වෙනත් භවයකට මාරු වුනේ නැත්නම් තවමත් චුතියක් වෙලා නෑ. ඒ නිසා තමයි සමහරෙක් හදිසි අවස්ථාවකින් මළාට පස්සෙ, උදාහරණයක් විදියට දියේ ගිලිල මැරුණු අවස්ථාවක, මං උඩට පාවෙලා ගියා, උඩ ඉඳන් බලන කොට මගේ මළ මිනිය පහලට ගහගෙන යනව දැක්කා .... ආදී වශයෙන් උඩ ඉඳන් බලන් ඉඳල, ඊළඟ අත් භවයෙදිත් මනුස්ස වෙලා අර කලින් වෙච්ච දේ කියන්නෙ. එතකොට අර සූක්ෂම කය, මස් ලේ කයින් අහක් වෙලා මරණයක් වුනත් තවම චුතියක් වෙලා නෑ. මොකද චුතියක් වුනා නම් භවය මාරු වෙන්න ඕන. එහෙම වුනොත් දිවැසකින් හැර අර විදියට කියන්න පුළුවන් කමක් නෑ. එතකොට එහෙම මස් ලේ කයේ මරණයත් එක්කම චුතියක් වෙන්නෙ කර්මක්ෂය හෝ උභයක්ෂය මරණයක් ආවොත් විතරයි. මොකද ඒ අවස්ථා දෙකේදීම අදාල භවයට හිමි කර්ම ශක්තිය ගෙවිල ගිහින් භවය වෙනස් වෙනවා. යාචුති - යම් චුතියක් ඇත්ද, ඡවනතා - චුත වන භවක් ඇත්ද කිව්වෙත් ඒකයි. මරණාසන්න මොහොතෙ චුත වුනේ නැත්නම් ගෙනාපු භවය දිගටම යනවා.

ඒ නිසා මරණය වෙන මොහොතෙ චුත වෙන්නත් පුළුවන්. හැබැයි ගෙනාපු භවය වෙනස් වුනේ නැත්නම් ඒ භවයෙන්ම උප්පත්තිය ලැබීමක් හෝ උප්පත්තියක් ලබන කල් සූක්ෂම කායිකව ඉන්නව මිසක් චුති-පටිසන්ධි අවස්ථාවක් එන්නෙ නෑ. එතකොට යමෙක් චුත වුනොත්, රහතන් වහන්සේ කෙනෙක් නෙවෙයි නම් ඒකාන්තයෙන්ම ඊළඟට පටිසන්ධියක් එනවා. ඒ කියන්නෙ ඊළඟ භවයට සන්ධි වෙනවා. ඇසිපිය ගහන මොහොතක සිද්ධ වෙන මේ චුති-පටිසන්ධි අතර පරතරයක් නෑ. ඒක මැරෙන මොහොතෙම නෙවෙයි වෙනත් කොතැනකදි හරි සිද්ධ වෙන්නත් පුළුවන්. ඒකට මස් ලේ කයක සම්බන්ධයක් අවශ්‍ය නෑ.

උදාහරණ විදියට යම් කිසි මනුස්සයෙකුට හදිසි අනතුරකින් සමහර විට උපච්ඡේදක මරණයක් සිද්ධ වුනාම මස් ලේ කය මළත්, ගෙනාපු මනුස්ස භවය තවම තියෙන නිසා සූක්ෂම ගන්ධබ්බ කයෙන් මනුස්ස භවයෙ තව දුරටත් ඉන්න පුළුවන්. එතකොට ඒ මනුස්ස භවයට හිමි තවත් අවුරුදු 50 ක ආයු කාලයක් ඉතිරි වෙලා තියෙනව කියල හිතුවොත්, ඒ සූක්ෂම කායිකයා තවත් අවුරුදු 50 ක් ඒ විදියටම ඉඳල දැන් ගෙනාපු මනුස්ස භවයට හිමි ආයුස ඉවර වුනාම, දේව හෝ පෙරේත හෝ තිරිසන් හෝ මොකක් හරි වෙනත් භවයකට යන්න එතනින් චුති වෙලා පටිසන්ධි වෙන්න පුළුවන්. ඊට කලින් චුති-පටිසන්ධිය කියන අවස්ථාව ලබල තිබුණෙ මැරෙන්න ඉස්සෙල්ල මවු කුසට එන්නත් කලින්. ඒ තමයි පෙර මිනිස් භව ලබපු අවස්ථාව. නැවත චුතියක් වෙලා පටිසන්ධියක් එන්න නම් කොයි වෙලේ හරි ඒ මිනිස් භවය ඉවර වෙන්න ඕන. එහෙම නැත්නම් මිනිස් භවය ඉක්මවන්න හේතු වෙන ඊට වඩා බලවත් පුණ්‍ය හෝ පාප විපාකයක් නැගිල එන්න ඕන. උදාහරණ විදියට ආනන්තර්ය පාප විපාකයක් ආවොත් නිරයටත්, ධ්‍යාන වඩපු විපාකයක් ආවොත් බඹ ලොවටත් යන්න පුළුවන්. එහෙම නොවුනොත් ඒ අතරතුර සිද්ධ වෙන්නෙ මරණ විතරයි, චුති-පටිසන්ධි නෑ.

මිනිස් භවය ඉවර වෙනවයි කියන්නෙ කයේ මරණයම නෙවෙයි. සමහර විට කයේ මරණය සිද්ධ වෙන අවස්ථාවෙදිම මිනිස් භවයට හිමි ආයුස ඉවර වෙලා තියෙන්නත් පුළුවන්. සමහර විට එහෙම නොවී තියෙන්නත් පුළුවන්. එතකොට මිනිස් භවය ඉවර වෙන්න නම් අවශ්‍ය කර්මයක් ඇදිල එන්න ඕන. එහෙම ඒ මිනිස් භවයෙ ඉඳල බලු භවයකට යනව නම් අන්න එතනදි චුතිය සිද්ධ වෙලා පටිසන්ධිය වෙනවා. දැන් මිනිස් භවයෙන් චුත වෙලා, පටිසන්ධියක් වෙලා, බලු බවට පත් වෙලා බලු ගන්ධබ්බයෙක් වෙනවා. ඒ බලු ගන්ධබ්බය තමයි බැල්ලියකගෙ


කුසට ඇතුල් වෙන්නෙ. කලින් කියපු වගේ කර්මක්ෂය හරි උභයක්ෂය හරි මේ කියන මරණ දෙකෙන් මොකක් හරි සිද්ධ වුනොත් ඒක සිද්ධ වෙනවා. දෙවියෙක් වෙන කොටත්, නිරයට යන කොටත් මේ චුති-පටිසන්ධිය කියන එක තියෙනවා. මොකද භවය වෙනස් වෙන නිසා. කර්ම භවය සහ උප්පත්ති භවය කියල මේ භවයත් කොටස් 2 ක් තියෙනවා. මේ කොයිකෙන් හරි උප්පත්ති භවය වෙනස් වෙන කොට තමයි චුතියයි, පටිසන්ධියයි දෙක සිද්ධ වෙන්නෙ.

ඒ වගේම හැම හදිසි අනතුරකින්ම සිද්ධ වෙන මරණ උපච්ඡේදක මරණම නෙවෙයි. සමහර විට හෘදයාබාධයක් එන්න පුළුවන් ආයුක්ෂය මරණයකදි. ඒ වගේම කර්මක්ෂය වෙලත් එහෙම හදිසි අනතුරකින් මැරෙන්න පුළුවන්. ඊළඟට කෙනෙකුට කර්මක්ෂය හෝ උභයක්ෂය මරණයක් වුනොත් ඒ පුද්ගලයට ඒ අවස්ථාවෙදි වේදනාවක් හිතාගන්න අමාරුයි. මොකද ඒ අවස්ථා දෙකේදිම කර්මය ක්ෂයවීම නිසා චුතියත් එක්ක පටිසන්ධියක් සිද්ධ වෙන නිසා, සූක්ෂම කයේ හදවත ඇසුරු කරගෙන තියෙන වස්තු රූපයේ ක්‍රියාකාරීත්වයත් අවසන් වෙනවා. එතකොට පටිසන්ධි වෙන කොට වෙනත් එකකට යනව වගේ දැනෙන්නෙ. ඒ නිසා පෙර මස් ලේ කයේ තිබිච්ච වේදනාව එන්නෙ නෑ. ඒ වගේ වෙලාවට පුද්ගලය දන්නෙම නෑ හිටි ගමන් මළා. නමුත් යම් විදියකින් කර්ම ශක්තිය ඉතිරි වෙලා තියෙද්දි ආයුක්ෂය මරණයක් හෝ උපච්ඡේදක මරණයක් සිද්ධ වුනොත් භවය තවමත් අවසන් වෙලා නැති නිසා, සූක්ෂම කයේ හදවත ඇසුරු කරගෙන තියෙන වස්තු රූපය තවමත් ක්‍රියාත්මක වෙනවා. එතකොට සූක්ෂම කයටත් ඒ වේදනාව දැනෙනවා. හැබැයි කර්ම විපාක වේදනාවක් ආවොත් විතරයි ඒ සූක්ෂම කයට දැනෙන්නෙත්. එහෙම නැතිව මස් ලේ කයට ආපු වේදනාවක් මළාට පස්සෙ සූක්ෂම කයට දැනෙන්නෙ නෑ. ඒ නිසා ආයුක්ෂය, උපච්ඡේදක මරණ සිදුවන අවස්ථාවකදි කර්ම විපාක වේදනාවක් ආවොත් වේදනාව වැඩියි. මොකද මස් ලේ කය නැති වුනාට සූක්ෂම කයට වේදනාව දැනෙනවා.

එතකොට රහතන් වහන්සේට චිත්ත වීථියක චිත්තක්ෂණ 17 ක තියෙන චුතියෙන් පස්සෙ (14 වන චිත්තක්ෂණයෙන් පස්සෙ) පටිසන්ධි වෙන්න තණ්හාවක්, උපාදානයක් නෑ. නමුත් ඒ චිත්තක්ෂණ 17 දිගටම යනවා. එහෙම යන අතරතුරදි චුත වෙන කොටම භවය ඉවරයි. වෙනත් භවයක් නෑ. ඒ නිසා චුතියෙන් එහාට පටිසන්ධි, භවාංග නෑ. චුතියෙන් පස්සෙ ඉතිරි චිත්තක්ෂණ ටික නිකං හිස් චලන හෙවත් කම්පන විතරයි. චිත්තක්ෂණ නැතිවම කම්පන 17 සම්පූර්ණ වෙන කල් ඉතිරි ටික යනවා. මොකද චිත්ත නියමය අනුව චිත්තක්ෂණ 17 අනිවාර්යයෙන්ම යන්න ඕන. නමුත් පටිසන්ධි, භවාංග නෑ. මොකද එතනින් එහාට කර්ම භවයකට යන්න උපාදානයක් නැති නිසා. යම් තැනක කර්ම ශක්තියක් සම්බන්ධ නොවුන නම්, එතනින් එහාට චිත්ත ශක්තිය නිකං යන්නෙ නෑ. ඉතිරි චිත්තක්ෂණ ටික හිස් චලන විදියට ගිහින් නවතිනවා. මේ කාරණය සර්වඥගෝචර වුනත්, ඒකෙන් වැටහෙන ආකාරයක් මේ විදියට පෙන්වන්න පුළුවන්.

ඊළඟට පසු ගිය කලාපයෙන් හෘද රූපය, වස්තු රූපය කියල දෙකක් විස්තර





කළා. දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන් මේව කොහෙද තියෙන්නෙ කියල. අපේ මේ ශරීරයට, ඇස්ට්‍රල් බොඩි කියන සූක්ෂම කයේ හැඩතලයක් තමයි තියෙන්නෙ. ඒ සූක්ෂම කයේ ආකෘතියක් තමයි මේ මස් ලේ කය කියන්නෙ. ඒ නිසා මේ කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, ඇට, නහර ..... ආදී වශයෙන් කියන කොටස් 32 ම මේ කියන සූක්ෂම ශරීරයෙත් තියෙනවා. එතකොට හෘදය වස්තුව, පෙනහළු කියන ඒවත් ඒ සූක්ෂම කිරණමය කයේ පිහිටල තියෙනවා.

දැන් මේ සූක්ෂම කයේ තියෙන හෘදය වස්තුව ඇතුලෙ තමයි මේ වස්තු රූපය ක්‍රියාත්මක වෙන්නෙ. එහෙම නැතිව මේ මස් ලේ හදවතේවත්, මොළේවත් නෙවෙයි. **මොළේ ඇතුලෙ තියෙන්නෙ ඇස, කන, නාසය, දිව, ශරීරය කියන ඉන්ද්‍රියන් 5 න් කායික සංඥා ගෙනිහින් පරිවර්තනය කරන මාධ්‍යය. ඒ මාධ්‍යය ඔස්සේ සංඥා ඉස්සෙල්ලම ගෙනියන්නෙ මොළයට.** මේ භෞතිකව තියෙන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන සංඥා එතනදි මුලින්ම කිරණ සංඥා බවට පත් වෙනවා. එතැන් පටන් ගෙන ඒ කිරණ සංඥා අර සූක්ෂම කයේ තියෙන කිරණ සංඥා මාධ්‍යයට යවනවා. ඒ මාධ්‍යයේ මධ්‍යස්ථානය තමයි සූක්ෂම කයේ හදවත කියන්නෙ. එතනට ගිහින් තමයි කිරණ සංඥා වදින්නෙ. මේ නිසා රූපයක් අපේ ඇහැට ගැටුනම ඒ රූපය නෙවෙයි අපේ හදවතට යන්නෙ. ඒක ඉස්සෙල්ලම සංඥා මගින් මොළයට ගිහින් මොළයෙන් හදාගත්තු එක්තරා සියුම් චිත්ත කිරණයකින් තමයි වස්තු රූපය කරා ගෙනියන්නෙ. ඒ කිරණ නිෂ්පාදනය වෙලා සූක්ෂම කයේ හදවතට ගමන් කරනවා. ඒක ගිහින් ඒ හදවත ඇසුරු කර ගෙන තියෙන වස්තු රූපය වටේට තියෙන අදාල ප්‍රසාද රූපයට වදිනවා. ඒ වස්තු රූපය වටා තියෙන්නෙ චක්ඛු ප්‍රසාදය, සෝත ප්‍රසාදය, ඝාන ප්‍රසාදය, ජිව්හා ප්‍රසාදය සහ කාය ප්‍රසාදය කියන මේ ප්‍රසාද රූප 5. නමුත් අටුවාවල මීට වඩා වෙනස් ක්‍රමයකට මේවා ඉන්ද්‍රියන් තුළ පිහිටල තියෙන හැටියට තමයි විග්‍රහ වෙන්නෙ.

මේ වස්තු රූපය කම්පනය වෙන්නෙ අර ප්‍රසාද රූප 5 න් එක් අවස්ථාවකදි මොකක් හරි එකක් වැදීම නිසා. ඒක තමයි වස්තු රූපයට දැනෙන්නෙ. ඒ වදින, එක අවස්ථාවකට තමයි අර චිත්තක්ෂණ 17 ක් යන්නෙ. ඒ 17 වතාව කම්පා වෙලා ඉවර වෙනකල් තවත් ප්‍රසාද රූපයක් වදින්නෙ නෑ. ඒ 17 ගිහින් ඉවර වෙනකල් විකර්ෂණ කාන්දම් ශක්තියකින් අනෙක්වා ඈත් කරනවා. ඒ 17 ඉවර වුනාට පස්සෙ තමයි තවත් එකක් වදින්නෙ. එතකොට මේ ප්‍රසාද රූප කියන්නෙ ලෝකාස්වාදයන් විඳින්න හැදිල තියෙන ක්‍රම 5 ක්. මොකද මහා භූතයන්ගෙ විවිධ ස්වභාවයන් නිසා එකම ඉන්ද්‍රියකින් ලෝකයේ තියෙන සියලු ස්පර්ශ ගන්න බෑ. අති සියුම් ස්පර්ශ වගේම රළු ඝණීභවන වෙච්ච ඒවත් තියෙනවා. ඒ සියල්ලම එක ක්‍රමයකින් විඳින්න බෑ. ඒ නිසා තමයි මේ ප්‍රසාද රූප 5 ක් තියෙන්නෙ. ඒ ප්‍රසාද රූප 5 ඝනීභවනය වෙච්ච ආකාරය අනුව සියුම් අවස්ථාව පුංචියට පටන් අරගෙන ක්‍රමයෙන් රළු බවට පත් වෙන කොට ලොකු වෙනවා. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය කියන කොට අනුපිළිවෙලට සියුම් අවස්ථාවේ පටන් ක්‍රමයෙන් රළු බවට පත්වෙන නිසා ඒවා ක්‍රමයෙන් ලොකු වෙන ආකාරයට දක්වා තියෙනවා. ඒ කියන්නෙ සියුම්ම එක ඇස, රළුම එක කය. මනෝද්වාරය

නැමති මකුළු දැලේ මකුළුවා එල්ලිලා ඉන්නව වගේ තමයි, වස්තු රූපය සූක්ෂම කයේ හදවත ඇසුරු කරගෙන පවතින්නෙ. ප්‍රසාද රූප හරියට මකුළු දැලට පැටලුණු ගොදුරු වගෙයි. (රූප සටහන බලන්න. මේ ලෝක ආස්වාදයන් විඳීමට සත්වයන්ට ඉන්ද්‍රියන් 5 ක් පහළ වෙන ආකාරය ඉදිරි ලිපියකින් බලාපොරොත්තු වන්න.)

මේ වස්තු රූපය කියන එක සම්පූර්ණයෙන්ම කර්මජයි. ඒකෙ ආයුස තීරණය වෙන්නෙ පටිසන්ධි මොහොතෙදිමයි. පටිසන්ධියේදි ඒක කර්ම ශක්තියෙන් ජනිත කරල දුන්නම එතැන් පටන් ගෙන ඒ වස්තු රූපය භ්‍රමණ චක්‍රවලින් තමයි පවතින්නෙ. නැවතත් චුතියක් එන කොට තමයි ඒ ශක්තියත් එක්කල වස්තු රූපය බිඳිල යන්නෙ. හැබැයි පටිසන්ධියෙන් පස්සෙ නැවතත් මරණාසන්න චිත්ත වීථියේ භවාංග උපච්ඡේදයට එනකල් (ආචාර්ය වාදයට අනුව නම් චුතියට එනකල්) එකම වස්තු රූපයක් තිබුණට ඒක මොහොතක් පාසා වෙනස් වෙනවා. මොකද වස්තු රූපයක් හැදෙන කොට ඒකෙ චලනවල (පරිවර්තන, පරිභ්‍රමණ) වෙනස්වීම් ඇති වෙනවා. ඒ නිසා ඒකට කම්පනයක් හෙවත් භ්‍රමණයක් තමයි හැම වෙලේම තියෙන්නෙ. අර ප්‍රසාද රූප 5 න් ගන්න සංඥාවලට අනුව තමයි මේ වස්තු රූපය හැම වෙලේම කම්පනය වෙන්නෙ. එතකොට වස්තු රූපය කියන එක ගොඩ නැගුනම ප්‍රසාද රූපවලින් ඇති වන කම්පන චක්‍ර නිසා ක්‍රියාත්මක වෙනවා, භ්‍රමණය වෙනවා. එතකොට ඒක මේ ජීවිත ඉන්ද්‍රියෙන් තමයි පවත්වන්නෙ. ජීවිත ඉන්ද්‍රිය කියන්නෙ අමුතු දෙයක් නෙවෙයි. ජීවිතයක් පැවැත්වීමට අවශ්‍ය කරන්නා වූ ජීව බලය හෙවත් ජීව ශක්තිය. ඒක තියෙන්නෙත් මේ වස්තු රූපය ඇසුරෙමයි.

උදාහරණයක් විදියට ඉදිච්ච ගෙඩියක් කිව්වම, ඒ ඉදිච්ච එක කොහෙද තියෙන්නෙ කියල ඇහුවොත්, ඒ ගෙඩිය ඇතුලෙම ඒක තියෙනවයි කියනව මිසක් ගෙඩියෙන් අහක තියෙන දෙයක් නෙවෙයි. ඒ දෙක ඒකාබද්ධයි. මේ වගේ තමයි ජීවිත ඉන්ද්‍රිය කියන එකත් වස්තු රූපයෙන් හට ගන්න, ඒ වස්තු රූපය පවත්වන්න තියෙන ශක්තියක්. ඒ නිසා අවුරුදු දහස් ගණනක් හෝ සිය ගණනක් හෝ 60 - 70 ක් හෝ යන කල් ඒ භවය පවතින කාලයට අනුකූලව ඒක ඉවර වෙන කල්ම මේ වස්තු රූපය කියන එක පවතිනවා. ඒ කියන්නෙ ඒ භවය පටන් ගන්න කොට මුලින්ම පටිසන්ධි වෙලා භවාංග වෙලා මස් ලේ කය මැරුණත් අවසාන චිත්ත වීථියේ භවාංග උපච්ඡේදයට යන කල්ම පවතිනවා. එතකොට පටිසන්ධියේදි වස්තු රූපයක් පහල වෙලා එතනදි පටන් ගන්න ශක්තියෙන් භ්‍රමණය කර කර පවතින කොට ඒ ඔක්කොම එකක් විදියට තමයි පේන්නෙ. හරියට විදුලි පංකාවක් වැඩ කරන කොට ඒකෙ පෙති වෙන වෙනම පේන්නෙ නැතිව ඔක්කොම එකට පේනව වගේ. ඊළඟ මරණාසන්න චිත්ත වීථියේ භවාංග උපච්ඡේදයට යනකල්ම එකම වස්තු රූපය භ්‍රමණය වෙවී පවතිනවා. හැබැයි එකම වස්තු රූපය කියල කිව්වට ඒකත් කාලයත් එක්ක පරණ වීමේ ස්වභාවයක් තියෙනවා. උදාහරණ විදියට එකම පුටුව, එකම මේසය, එකම කළුගල ආදී වශයෙන් අපිට යම් යම් ද්‍රව්‍ය වස්තු පෙනුනට, එහෙම හැඳින්නුවට ඒවත් කාලයත් එක්ක පරිණාමය වෙනවා. මේ නිසා ඒකාකාරීව පවතින වස්තු රූපයක් කියල දෘෂ්ටිගත නොවිය යුතුයි. මෙන්න මේ වස්තු රූපයේ භ්‍රමණ චක්‍රය නිසා තමයි හෘද රූපය කියන එක හැදෙන්නෙ. එතකොට චිත්තක්ෂණ 17 ක් හෙවත් එක චිත්ත වීථියකට එක හෘද රූපයක් හැදෙනවා. නැවතත් ඊළඟ චිත්ත වීථියේදි තවත් හෘද රූපයක් හැදෙනවා. එතකොට එකම වස්තු රූපය භ්‍රමණය වෙන කොට තමයි වෙනස් වෙනස් හෘද රූප හැදෙන්නෙ.

ඊළඟට මේ හිත කියන එක කොහෙද තියෙන්නෙ ? ඒක හට ගන්න අවශ්‍ය මූල ධාතුව තියෙන්නෙ නාම ලෝකයේ. දැන් මේ රූප ලෝකය කියන්නෙ නාම ලෝකයට අරමුණු වද්ද ගන්න ආකෘතියක් විතරයි. ඒ ආකෘතිය විතරයි මේ මස් ලේ ශරීරය කියන්නෙ. උදාහරණ විදියට අපි හීන දකිනවා. එතකොට ඇහුවොත් ඒ හීන ලෝකෙ කොතනද තියෙන්නෙ කියල, ඒක අහවල් තැන තිබුණයි කියල කියන්න බෑ. නමුත් හීන ලෝකයත්, මේ තියෙන ලෝකයට සමානව අපිට පේනවා. ඒක අනන්ත ප්‍රදේශයක්. ඒක තමයි නාම ලෝකය කියන්නෙ. අනන්ත වූ විඤ්ඤාණයෙන් දර්ශනය වෙන්නෙත් ඒක. ඒ කියන්නෙ විඤ්ඤාණයට අරමුණු වෙනවා. ඒ විඤ්ඤාණය අනන්තව විහිදුවන්නත් පුළුවන්. ඒ වගේම නැවත අකුලන්නත් පුළුවන්. ඒ විදියට ආකිඤ්ඤංචායතනයට යන කල්ම ඒ අතරතුර ඒක ප්‍රසාරණය කරවන්න, විහිදුවන්න, කුඩා කරන්න පුළුවන්. එතකොට මේ හිත හෙවත් විඤ්ඤාණය කියන එක මේ භෞතික ලෝකයත් එක්ක තියෙන නාම ලෝකය ඇසුරින් හේතුඵලයක් වශයෙන් තමයි ක්‍රියාත්මක වෙන්නෙ. මේ රූප ලෝක අනන්තව විහිදෙනව වගේම නාම ලෝකත් අනන්තව විහිදෙනවා. එතකොට **හිත කියන එක මනුස්සයින්ගෙ මේ මස් ලේ කයේ අහවල් තැන තියෙන එකක් කියල එහෙම කියන්න පුළුවන්කමක් නෑ.**

උදාහරණ විදියට යම්කිසි කම්බියකට විදුලියක් දුන්නම, දැන් ඒ කම්බියේ කොතනද විදුලිය තියෙන්නෙ කියල ඇහුවොත්, ඒක මෙතනයි කියල නිශ්චිතව පෙන්වන්න පුළුවන් තැනක් නෑ. මුළු කම්බිය පුරාම විදුලිය තියෙනවා. හැබැයි විදුලියට කම්බිය බාධකයක් නෙවෙයි. කම්බිය ඇසුරු කරගෙන තමයි විදුලිය තියෙන්නෙ. නාම ලෝකය විදුලිය නම් රූප ලෝකය තමයි මේ භෞතික කම්බිය. ඒ වගේ හිතක් ගොඩ නැගුනම ඒක කයක් ඇසුරු කරගෙන පවතිනව මිසක් අහවල් තැන හිත තියෙනව කියල පෙන්වන්න පුළුවන්කමක් නෑ. නාම ලෝකය කියන්නෙ නාම ගෝත්‍රය හෙවත් මතක සටහන් නම් රූප ලෝකය කියන්නෙ මේ භෞතික කය. භෞතික වස්තු ඇසුරින් නාම ලෝකයට භෞතික අරමුණු ගන්නෙ හරියට කම්බිය පාවිච්චි කරල විදුලිය ගන්නව වගේ. එතකොට ඇස, කන, නාසය, දිව, ශරීරය කියන ඉන්ද්‍රියන් 5 න් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන මේ බාහිර අරමුණු ඇදල අරගෙන ලබන ස්පර්ශයෙන් භුක්තිය විඳින්න හදාගත්තු එක තමයි මනස කියන්නෙ. ඒ ඉන්ද්‍රියන්ගෙන් අරගන්න අරමුණුවලින් ඒකට අනුකූල නාමයක් නිපදවෙනවා. ඒව පිහිටන්නෙ නාම ගෝත්‍රයේ හෙවත් මතක සටහන්වල. ඒ නාම ලෝකයේ තියෙන නාම ගෝත්‍රයට හෙවත් මතක සටහන්වලට තමයි මේ සත්ව කියන සංඥාවෙන් රැවටිලා ''මම'' කියල හඳුන්වන්නෙ. එතකොට රූපය කියන එක අතරමගදි කෑලි එකතු කරගෙන යන එකක්. නමුත් ''මම'' කියන සංඥාවක් සත්වයින්ට දිගටම එනවා. ඒක නාම ගෝත්‍රය පිළිබඳ සිහි කිරීමේදී වැටහෙන ආකාරයක් විතරයි. ඒකට තමයි නාම ලෝකය කිව්වෙ.

ඊළඟට විඤ්ඤාණය කියන එකත් කොටස් 2 කින් තියෙනවා. ඒක තමයි කර්ම විඤ්ඤාණය සහ විපාක විඤ්ඤාණය. ස්පර්ශයක් එන මොහොතෙදි ඇති වෙන්නෙ විපාක විඤ්ඤාණය. උදාහරණ විදියට ඇසට රූපයක් ස්පර්ශ වෙන කොට චක්ඛු විඤ්ඤාණයක් හට ගන්නවා. එතකොට අරමුණු වෙන කොට හෙවත් ස්පර්ශ වෙන කොට තමයි විඤ්ඤාණ පහල වෙන්නෙ. අපිට තදටම නින්ද ගිහින් ඉන්න වෙලාවක විඤ්ඤාණය කොහෙද තිබුනෙ කියල ඇහුවොත්, එතකොට මොන විඤ්ඤාණයද කියල අහන්න පුළුවන්. දැන් මෙතනදි විඤ්ඤාණය කියල කියන්නෙ දැනෙන නිසා. දැනෙන්නෙ ස්පර්ශ වෙන කොට. ස්පර්ශ වෙන්න හේතුකාරක වෙච්ච නාම ගෝත්‍රයක් (මතක සටහනක්) තමයි මේ නාම ලෝකයේ තියෙන්නෙ. නාම ලෝකය කියල කියන්නෙ හීන නෙවෙයි. නාම ලෝකයේ තියෙන නාම ගෝත්‍ර හෙවත් මතක

සටහන් ඇසුරින් යමක් ස්පර්ශ වෙන කොට තමයි විඤ්ඤාණයක් / හිතක් පහළ වෙන්නෙ.

උදාහරණ විදියට සණ්ඨාරයේ හඬ කියන්නෙ මොකක්ද කියල ඇහුවොත් සණ්ඨාරය ඇතුලෙ හඬක් නෑ. ඒකට ස්පර්ශයක් වැදුනොත් තමයි හඬක් එන්නෙ. ඒ වගේ ස්පර්ශවීම නිසා විඤ්ඤාණයක් පහළ වෙනවා. ඒක තමයි හිත කියන්නෙ. ඊළඟට ඒක ආවර්ජනය කරන කොට තමයි එහෙම එකක් තියෙන බව දැනෙන්නෙ. ආවර්ජනා නොකළොත් හිතක් තියෙන බව දැනෙන්නෙ නෑ. ආවර්ජනයත් එක්කයි හිතක් ගොඩ නැගෙන්නෙ. එක්කො මනෝද්වාර ආවර්ජනයක් එහෙම නැත්නම් පංචද්වාර (ඇස, කන, නාසය, දිව, ශරීරය) ආවර්ජනයක්. ඒක ක්‍රියා හිතක්. ඒක ඇවිත් ගෙවිල යනවා. ආස්වාදයක් ලැබෙන්නෙ සම්පටිච්චන, සංතීරණ කියන චිත්තක්ෂණවලින්. ආස්වාද බලාපොරොත්තුව නිසා ගොඩ නැගෙන්න අවශ්‍ය දේ ස්පර්ශ වුනොත්, හිතක් ගොඩනැගෙන්න අවශ්‍ය පරිසරය හැදෙනවා. උදාහරණයක් විදියට මිරිගුවක් පසු පස වතුර සොයා යාමත්, හීනෙන් යම්කිසි රසවත් ආහාරයක් භුක්ති විඳීමත් පෙන්වන්න පුළුවන්.

දැන් ඊළඟ විග්‍රහයට ගියොත්, යමෙක් මියගිය මොහොතෙම ගැබක පටිසන්ධි වෙනවයි කියන කාරණය සනාථ කරන්න, පොල්ලක් උඩ ගැහුවොත් කොතනකට හෝ වැටෙනව වගෙයි කියන කතාව පසු කාලයක හදා ගත්තු ආචාර්ය වාදයක් මිසක් මූලික සූත්‍රවල සඳහන් වූ ආකාරයේ අර්ථ දැක්වීමක් නෙවෙයි. ඒක මූලික සූත්‍රවල තියෙන අර්ථය පටලවා ගෙන ගත්තු අදහසක්. සං. නි. (2) 284 සහ සං.නි. (5-2) 296 පිටුවල එන <u>දණ්ඩ සූත්‍රය</u> අනුව පෙන්වා තියෙන්නෙ **උඩ ගැසූ දණ්ඩක් වරෙක මුලින්ද, වරෙක මැදින්ද, වරෙක අගින්ද බිම වැටෙන්නා සේ වරෙක මෙලොවින් පරලොවට යති, වරෙක පරලොවින් මෙලොවට එති කියල.** පරලොවට වැටීම කියන්නෙ ගන්ධබ්බ තත්ත්වය කියන කාරණය බවත් තේරුම් ගන්න ඕන.

එතකොට අලුත් භවයක් පටන් ගන්න කොටම මවු කුසක් ලැබුනොත් ඒක තමයි දණ්ඩ මුලින් වැටෙනව වගෙයි කිව්වෙ. ඒ කියන්නෙ චුති-පටිසන්ධියක් ලබපු ආසන්න කාලෙම ගැබක උප්පත්තියට යන අවස්ථාව. ඊළඟට චුති-පටිසන්ධියෙන් භවය පටන් අරගෙන ගන්ධබ්බ අවස්ථාවෙන් මැදක් වෙන කල් ගෙවුනට පස්සෙ මවු ගැබක උප්පත්තියට යන අවස්ථාව තමයි දණ්ඩ මැදින් වැටෙනව වගෙයි කිව්වෙ. ඊළඟට චුති-පටිසන්ධියෙන් පස්සෙ ලබපු භවය අවසන් වෙන්න ආසන්න මොහොතෙ මවු ගැබක් ලැබිල ඒකෙ උප්පත්තියට ගියොත්, ඒක තමයි දණ්ඩ අගින් බිම වැටෙන අවස්ථාව වගෙයි කිව්වෙ. ඒ කියන්නෙ ගැබට ඇවිත් භවයට හිමි ආයු කාලය අවසන් වෙනවත් එක්කම ගබ්සා වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් මවු කුසින් බිහි වුන හැටියෙම කෙටි කාලයකින්ම ඒ භවය ඉවර වෙලා මැරිල නැවත චුති-පටිසන්ධි වෙන්නත් පුළුවන්. වෙනත් විදියකින් කියනව නම් මෙතෙක් ලබපු භවය අවසන් වෙන්න ඔන්න මෙන්න කියල තියෙද්දි මස් ලේ කයක් සහිතව උපදිනවා. ඒ නිසා ගැබ තුලදිම හෝ බිහි වෙලා ටික කලකට පස්සෙ හෝ භවය අවසන්වීම නිසා මියයනවා. ඒක කර්මක්ෂය මරණයක්. එතකොට ඉහත පෙන්වා තියෙන මෙළොවින් පරලොවට යෑමත්, පරලොවින් මෙළොවට ඒමත් කියන අවස්ථා 2 මේ පසුව පෙන්වපු අවස්ථා 3 න් මොකකින් හරි සිද්ධ වෙන්න පුළුවන්.

කර්ම විෂය, සත්ව විෂය කියන මේවා ඉතා සංකීර්ණ විෂයන්. හේතුඵල ධර්මතාව අනුව ඵලය යම් සේ වේද හේතුව ඊට අනුකූල විය යුතුයි. හේතු යම් පමණින් සමාන නම් ඵල ධර්මත් ඊට සමාන විය යුතුයි. දුශ්චරිත කරල, පවු කරල තිරිසන් අත්බැව් ලබනවයි කියන එක සවිස්තර විග්‍රහයක් නෙවෙයි. මොකද එකිනෙකා කරන දුශ්චරිත පාපවල ගති ලක්ෂණ විවිධාකාරයි. නැගුණු දුශ්චරිතය කපුටු ගති ලක්ෂණ සහිත නම් එයින් කපුටෙක් මිසක් බල්ලෙක්, බළලෙක් පහල වෙන්නෙ නෑ. ඒ වගේම නැගුනෙ බලු ගති ලක්ෂණ නම් එයින් හරකෙක් හෝ වෙනත් සතෙක් පහල වෙන්නෙ නෑ, බල්ලෙක්මයි පහල වෙන්නෙ. මජ්ජිම නි. (2) 85 පිටුව, කුක්කුරවතිය සූත්‍රය.

එතකොට ගති යම් සේ ද උපත ඊට සමානයි. මේක ධර්මතාවක්. ඊළඟට බලු, බළල්, කපුටු ... ආදී සතුන්ගෙ සංවාස මිනිස්සුන්ගෙ වගේ වසර පුරාම සිදුවෙන්නෙ නෑ. ඒක වසරකට වරක්, මාසයක් තරම් කාලයක හැම තැනම සිද්ධ වෙන දෙයක්. ඒ කියන්නෙ ඒ සතුන්ගෙ සංවාසවලට වෙනම ඍතු තියෙනවා. විමසුම් ඇසින් සතුන් දෙස බලන කොට මේ කාරණය හොඳින් පැහැදිලි වෙනවා. මේ කරුණ මේ විදියට සිද්ධ වෙන කොට **චුතියට අනතුරුව පටිසන්ධිය ගැබ තුළ සිද්ධ වෙනවයි කියනව නම්, බල්ලෙක් වෙන්න හේතු තියෙන කෙනෙක් මරණයට පත් වෙන්න ඕන බලු සංවාස යෙදෙන කාලයකම විය යුතුයි. ඒ වගේම කපුටෙක් වෙන්න හේතු වෙන පාපයකින් මියයන කෙනෙක් මියයා යුත්තේ කපුටු සංවාස පවතින කාලයකම විය යුතුයි. නමුත් ඒ විදියට කල් යල් බලා මියයාමක් ලෝකෙ කොහෙවත් සිද්ධ වෙන්නෙ නෑ. තමන් කැමති විදියට, ඕන ඕන දවස්වලට මියයන්න බෑ.** මවු කුසකින් උපදින සත්වයෙක් නම් ඒ ඒ සත්ව ගතියෙන් කවර කලක, කෙබඳු ලෙසක මියගියත් අනුකූල සත්ව කොටසට අයත් ගන්ධබ්බ තත්වෙ ඉඳල සුදුසු පරිසරය හැදුනම කර්මානුරූපව ඒ අදාල සත්ව කුසට ඇදී යාම තමයි සිද්ධ වෙන්නෙ.

එතකොට මේ පටිසන්ධිය කියන එක බඩේ සිද්ධ වෙනවයි කියන උදවිය මේ කාරණයෙදි හිර වෙන නිසා තමන්ගෙ මතය ජය ගන්න, ඒ මැරිච්ච කෙනා අනන්ත සක්වලක හෝ ගිහින් උපදිනවයි කියනවා. චුත වෙන කොටම මේ ලෝකෙදි පටිසන්ධි වෙන්න හැම තිස්සෙම සත්ව සංවාස නැතුවට, අනන්ත සක්වල ඕන තරම් උපදින්න සත්ව සංවාස තියෙනව කියල මතයක් ප්‍රකාශ කරනවා. නමුත් ඒක හරියට, අර කිතුල් ගහට නැග්ග මිනිහටත් කියන්න දෙයක් තිබුණයි කියනව වගේ කතාවක්. මොකද මේ හැම සත්වයෙක්ම හැම විටම උපදින්නෙ තම තමන් ඇසුරු කරගෙන, අල්ල ගෙන ඉන්න සක්වලක මිසක් අනන්ත පිට සක්වලක නෙවෙයි. මේ එක සක්වලක තිස් එක් තලයෙමයි මේ සත්වයො රවුම් ගහන්නෙ. එහෙම ලේසියෙන් වෙනත් සක්වලක ගිහින් උපදින්නෙ නෑ. නමුත් යම් කෙනෙක්, මම නම් මේ සක්වලවත් ඉන්නෙ නෑ, මට මේ සක්වලවත් එපා කියල එහෙම සංඛාරයක් වැඩුවොත්, එතකොට ගිහින් ඔය කියන පිටසක්වලක උපදින්න පුළුවන්. එතකොට ඒ සත්වයාට බුදු බණ පදයක්වත් අහන්න ලැබෙන්නෙ නෑ. එහෙම අවස්ථා තියෙනවා. ඒක වෙනම කතාවක්. නමුත් මෙතනදි කියන්නෙ එහෙම කතාවක් නෙවෙයි. මෙහේ පටිසන්ධි වෙන්න මවු කුසක් නැත්නම් අනන්ත සක්වල ඕන තරම් මවුකුසවල් තියෙන නිසා එහේ ගිහින් උපදිනවයි කියන මතයක්. නමුත් ඒ මතය කාටවත් කිසිම සාධකයක් ඇතිව ඔප්පු කරල පෙන්වන්න පුළුවන් දෙයක් නෙවෙයි. මේ සක්වලේ මනුස්සයෙක් වෙලා ඉඳල, පිටසක්වලක ගිහින් බල්ලෙක් වෙලා ඉපදුනා කියල, එහෙම කොහේ හරි ගිහින් උපදින්න පුළුවන් කියල ඒ විදියට දැන ගන්න කිසිම චුති-පටිසන්ධි කතාවක් කොතනකවත් නෑ. ඒක තමන්ගෙ මතය ජයගන්න කියන කතාවක් විතරයි.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

15 වන කොටස

මේ දහම් ලිපි පෙළ පටන් ගත්තු මුල් කාලයේ ජම්බුද්වීපය, උතුරුකුරු දිවයින, පූර්ව විදේහය සහ අපර ගෝයානය කියන මනුස්ස ලෝක 4 ගැන කෙටි පැහැදිලි කිරීමක් කළා. (13 වන කලාපය බලන්න) නමුත් බොහෝ දෙනෙකුට ප්‍රශ්නයක්, කුතුහලයක් මතු වෙන්න පුළුවන්, අපි මේ ජීවත් වෙන ජම්බුද්වීපයේ ඉන්න මනුස්සයන්ගෙන් මේ අනිත් ලෝක තුනේ ඉන්න මනුස්සයො වෙනස් වෙන්නෙ කොහොමද කියල. ඒ පිළිබඳව එදා නොකියවෙච්ච කාරණා ටිකක් තමයි මේ හෙළිදරව් කරන්නෙ.

මෙතනදි මුලින්ම කෙනෙකුට හිතෙන්න පුළුවන් මේ සත්වයො ඉපදෙන 31 තලය කිව්වම, එක සක්වලක තියෙන 31 තලවලට දිව්‍ය ලෝක 6 කුත්, බ්‍රහ්ම ලෝක 20 කුත් ලෙස ඒ දිව්‍ය බ්‍රහ්ම ලෝක වෙන වෙනම තලවලට දමල විග්‍රහ කරද්දි, ඇයි මේ මනුස්ස ලෝක 4 විතරක් එක තලයක් විදියට විග්‍රහ කරන්නෙ කියල. මේ මනුස්ස ලෝක හතරෙම තියෙන ප්‍රධාන ගතිය ගත්තොත්, ඒ තමයි මිනිස් ගතිය. මිනිස් ගතිවල විවිධාකාර වෙනස්කම් තිබුණත් මේ ලෝක 4 ටම පොදු ප්‍රධාන මිනිස් ගතියක් තියෙනවා. ඒ ප්‍රධාන මිනිස් ගති ඉක්ම වූ ගතියක් මේ ලෝක හතරෙම නෑ. උදාහරණ විදියට හිතා හිතං මීනාති ජානාති ... ආදී වශයෙන්, හිතල මතල මේ මේ දේවල් කියල දැනගන්න පුළුවන් නුවණත්, හොඳ නරක දෙක වෙන් කරගන්න පුළුවන් හැකියාවත් ප්‍රධාන මිනිස් ගතියක්. නමුත් තිරිසන් ආදී සතර අපාගත සත්වයින්ට එහෙම හැකියාවක් නෑ. එතකොට 31 තලය කියන්නෙ ප්‍රධාන ගති 31 ක්. නමුත් දිව්‍ය, බ්‍රහ්ම ලෝක ගත්තම ඒවායේ ප්‍රධාන ගති එකිනෙකට වෙනස්. එක දේව ලෝකයකින් අනෙක් දේව ලෝකයට යන කොට ප්‍රධාන ගතිය ඉක්මවෙනවා.

උදාහරණ විදියට චාතුර්මහා රාජිකයෙ සම්පූර්ණයෙන්ම වගේ ඉන්නෙ සේවක දේව කොටස්. නමුත් තාවතිංසයේ ඉන්නෙ මහේශාක්‍ය දේව කොටස්. මේ දෙගොල්ලන්ගෙ ප්‍රබල වෙනස්කම් තියෙනවා. එතකොට ඒ දිව්‍ය ලෝක හයේ තියෙන්නෙ දේව ගතිය වුනත් ප්‍රධාන ගති 6 ක්. බ්‍රහ්ම ලෝක 20 ගත්තමත් එහෙමයි. ප්‍රධාන ගති 20 ක්. ඒ නිසා ඒ ලෝක වෙනම තල විදියට විග්‍රහ වෙනවා. නමුත් අපේ මේ මනුස්ස ලෝකෙ ගත්තොත්, උදාහරණ විදියට සිංහල දෙමළ කිව්වම බාහිර ගතිවල පොඩි වෙනසක් තියෙනවා. ඒ නිසා ලෝක සම්මත ජාති 2 ක්. හැබැයි මනුස්ස ගතියෙන් දෙගොල්ලන්ම එකයි. ඒ නිසා ඒ බාහිර ගතිවල වෙනස්කම් කියන්නෙ මූලික මනුස්ස ගතියෙ වෙනසක් නෙවෙයි. ඒ වගේ මේ මනුස්සයො ලෝක 4 ක් යටතේ හිටියට මනුස්ස ගතිය එකක්. මේ මිනිස් ලෝක 4 ටම අයිති සංඛාර, එහෙමත් නැත්නම් ගතිය ගත්තම ඒවායේ විවිධ ප්‍රභේද තිබුණත් මිනිස් කියන මූලික සංඛාරය, මූලික ගතිය එකක්. ඒ නිසා එහේ



අයයි, මෙහේ අයයි එකතු වුනාම ජාති බෝ කරන්නත් පුළුවන්. එහෙම වෙච්ච අවස්ථාත් සඳහන් වෙනවා. එතකොට එහෙම වෙන්නෙ ඒ මූලික මිනිස් ගතිය සමාන නිසා. ඒ නිසා මේ ලෝක 4 ම එක මනුස්ස තලයක් විදියට විග්‍රහ වෙනවා.

ඊළඟට මේ ඉතිරි මනුස්ස ලෝක 3 ගත්තමත් අපිට වැඩියෙන්ම ළඟ සම්බන්ධයක් තියෙන්නෙ උතුරුකුරු දිවයිනේ වැසියන්. ඒ නිසා මේ විග්‍රහයෙදි උතුරුකුරු දිවයින මුල්කරගෙන පොදුවේ තමයි මේ වෙනස්කම් විග්‍රහ වෙන්නෙ. අනිත් දිවයින් දෙකෙත් බොහොමයක් පොදු ලක්ෂණ තියෙන නිසා ඒවා වෙන වෙනම විග්‍රහ කරන්න අවශ්‍ය නෑ.

දැන් මේ අනිත් ලෝකවල ඉන්නෙත් කවද හරි මෙහේ ඉඳල ගියපු උදවියම තමයි. ඒ නිසා අමුතු කොටසක් නෙවෙයි. අපේම කොටසක්. එහෙම සම්බන්ධකම් තියෙන බවට භෞතික සාධකත් තියෙනවා. උදාහරණ විදියට ඒ කාලෙ හිටපු මහා මන්ධාතු කියන සක්විති රජු, තමන්ගෙ පුණ්‍ය සෘද්ධියෙන් උතුරුකුරු දිවයිනට ගියාම, එහේ හිටපු පිරිසක් ඒ රජතුමත් එක්ක නැවතත් මේ මනුස්ස ලෝකෙට ඇවිත් තියෙනවා. මොකද සක්විති රජෙකුට මේ මනුස්ස ලෝක 4 ම පාලනය භාර නිසා එහෙම යන්න එන්න පුළුවන්. ඉතින් ඒ අය මෙහේ ඇවිත් කුරු රට කියන ප්‍රදේශයට තමයි ගොඩ බැස්සයි කියන්නෙ. ඊට පස්සෙ සක්‍ර දෙවියො ඇවිත් ඒ සක්විති රජු තව්තිසාවට එක්ක ගෙන ගිහින් රජකමින් බාගයක් භාර දුන්නලු. දැන් අර කලින් ආව පිරිසට යන්න විදියක් නෑ. මොකද මෙතනදි පුණ්‍ය සෘද්ධිය මුල් වෙලා තිබුණෙ සක්විති රජතුමාට. ඒ කියන්නෙ සක්විති රජෙකුට පුණ්‍ය සෘද්ධියෙන් පහළ වෙච්ච චක්‍රරත්නය කියල රථයක් තියෙනවා. ඒක හරියට පියාඹන පීරිසියක් වගේ. නමුත් ඊට වඩා විශාල ප්‍රදේශයක පැතිරිච්ච එකක්. විශ්වයෙන් නිර්මාණය වෙලා ඒක රජතුමා ළඟට එනවා. ඇවිත් ආකාසෙ පහළ වෙලා, හිතන හිතන විදියට පහත් වෙලා පිහිටනවා. රජතුමා ඒකට පැන් කෙණ්ඩියක් අරගෙන පැන් වඩල, තමන් අහවල් දිහාවට යන්න ඕන කියල හිතුවම ඒක ඒ අහවල් දිහාවට යනවා. ඒ විදියට තමයි අර පිරිසත් එක්ක ආවෙ. ඉතින් නැවත යන්න ක්‍රමයක් නැති නිසා ඒ අය ඒ කුරු ප්‍රදේශයේම පදිංචි වෙලා ජීවිත ගත කරන්න පටන් ගත්තා. ඒ අයගෙන් ආපු පරම්පරාව තමයි ඔය කුරු කියන ප්‍රදේශයේ කුරු මිනිස්සු වශයෙන් ඉන්නව කියල කියන්නෙ. කම්මාස්ස ධම්මං නාම කුරූනං නිගමෝ (නියම් ගම) ... ආදී වශයෙන් මහා සති පට්ඨාන සූත්‍ර වර්ණනාවෙත් මේ කුරු මිනිස්සු ඒ ආකාරයට ආව කියල සඳහන් වෙනවා. එතකොට ඒ අයටත් අපට වගේ මස් ලේ කයක් තමයි තියෙන්නෙ. ඒ අයත් මනුස්සයො. කාලයක් යනකොට මේ ලෝකෙට ගැලපෙන විදියට පරිවර්තනය වෙනවා.

☞

ඊළඟට මේ ජම්බුද්වීපය කියන අපි ඉන්න මනුස්සස ලෝකය ගත්තොත්, මිනිස්සු ජාති වශයෙන් බෙදිල, රට රටවල් විදියට වෙන් කරගෙන විවිධ භාෂාවන් කතා කරනවා. කුලමල භේදත් ඒ අතර තියෙනවා. තවත් නොයෙක් වෙනස්කම් තියෙනවා. ප්‍රධාන ගතිය මිනිස් වුනාට, ඉපදුනාට පස්සෙ මිනිස්සු විවිධාකාර සංඛාර වඩනවා. ඒ නිසා ජම්බුද්වීපය සංඛාර මූලිකයි. ඒ සංඛාර වෙනස් වෙන කොට තමයි මම, අපි කියල සීමා වෙන් කර ගෙන විවිධාකාරයේ වෙනස්කම් ඇති වෙන්නෙ. නමුත් උතුරුකුරු දිවයින වගේ මනුස්සස ලෝකයක් ගත්තොත්, ඒක විපාක මුල් වෙලා තමයි ගොඩ නැගෙන්නෙ. ඒ කියන්නෙ පහල වෙන කොටම ලැබිච්ච විදියට ඉන්නවා. අලුත් සංඛාර වැඩීමක් විශේෂයෙන් නෑ. ඒ නිසා ඒ අයට තමන්ගෙ කියල වෙන වෙනම අල්ලා ගැනීමක් නෑ. මගෙ භාර්යාව, මගෙ දරුවො ආදී වශයෙන් එහෙම මමත්ත්වයෙන් ගන්න යන්නෙත් නෑ. තමන්ට දාව බිහි වෙච්ච දරුවො වගේම අනෙක් අයගෙ දරුවොත් තමන්ගෙ විදියට තමයි දකින්නෙ. ඒ නිසා මෙහේ වගේ වෙනස් කරල සැලකීමක් නෑ. අම්ම, තාත්ත, දරුවො කියල හිටියට අපේ වගේ අල්ල ගෙන එකතු කරගෙන බැඳිල නෑ. ඒ නිසා දරුවො හිටියයි කියල වෙනම මහන්සියක් නෑ. ඒ අයගෙ භාෂාව ගත්තත් වචනවලට වඩා හැඟීම් භාෂාව ප්‍රධානයි.

ඊළඟට **අපේ මනුස්සස ලෝකෙ වගේ ගහමරා ගැනීම්, හොරකම් ආදී කටයුතු එහේ නෑ. කොටින්ම කියනව නම් පංච දුෂ්චරිත ඇත්තෙම නෑ.** ඒක ස්වභාවිකවම හැටි. මොකද ඒ ලෝකවල ගිහින් ඉපදෙන්න වඩන වෙනම සංඛාර කොටසක් තියෙනවා. ඒ කියන්නෙ මේ ලෝකෙ ඉන්න කොට විවිධ දුෂ්චරිත, වැරදි වැඩ කරන අය දැක්කම, ''අනේ මේ වගේ එවුන් එක්ක මටත් ඉන්න වුනානෙ ! මොකටද මෙහෙම ඉඳල !, මැරුවත් මම නම් දුෂ්චරිත කරන්නෙ නෑ, මේ වගේ එවුන් ඉන්න ලෝකයකවත් මම නම් උපදින්න එපා, මේ දුෂ්චරිතවලට කොහොමටවත් මම කැමති නෑ, දුෂ්චරිත නැතිව මේ මං වගේ ජීවත් වෙන අය ඉන්නව නම් අනේ කොච්චර හොඳද ? මං වගේ අයට ඉන්න වෙනම ලෝකයක් තියෙනව නම් කොච්චර හොඳද ?'' මේ ආදී වශයෙන් මෙහෙම හිතත, කියන අය ඉන්නවා. නමුත් එහෙම හිතුවට, කිව්වට මේ මනුස්සස ලෝකෙ දුෂ්චරිත නොකරන තැනක් හොයාගන්න නෑ. හැම රටකම හැම ප්‍රදේශයකම අඩු වැඩි වශයෙන් තියෙනවා. එතකොට ඒ අයගෙ ප්‍රාර්ථනාවත් අවංක නම් ඒක හොඳ දෙයක්. ඒ නිසා ඒ අයට වෙනම විපාක ලෝකයක් හැදෙන්න ඕන. එහෙම නැතිව වෙන ක්‍රමයක් නෑ. එතකොට මෙහෙම හිතන අය **මනුස්සස ගතියත් ඉක්මවල නැත්නම්, පංච දුෂ්චරිතවලට කැමතිත් නැත්නම්, මනුස්සයො අතරම ඉන්න නම් කැමති, නැවත මෙහේ උපදින්නෙ නෑ. දෙවු ලොව උපදින්නෙත් නෑ.**

මේ නිසා පංච දුෂ්චරිත නැති ප්‍රදේශයක් ඒ වගේ අයට විපාක වශයෙන් පහළ වෙනවා. එහෙම සංඛාර වඩල ඒක උපාදාන කළොත් ඒකෙන් ඊළඟ භවය උතුරුකුරු දිවයින වගේ මනුස්සස ලෝකයක උපදින්න හේතු වෙනවා. ඒ නිසා තමයි මේ උතුරුකුරු දිවයින වගේ මනුස්සස ලෝක හට ගන්නෙ. පංච දුෂ්චරිතවලින් වෙන් වුනාම ඒකෙ අගය ඒ අය දකිනවා. නැවත ඒව කරන්නෙ නෑ. හැබැයි උතුරුකුරු දිවයිනේ වැසියෙක් වුනත් ඒ අයට නියමිත ආයුකාලය අවසානයේ, මෙහෙම ඉඳල බෑ අපිටත් මේව වෙන වෙනම අල්ල ගන්න ඕන කියන අදහසක් නැවත ආවොත්, අපේ ලෝකෙ මනුස්සස සංඛාර වැඩෙනවා. ඒක උපාදාන කරගත්තොත් නැවතත් මේ මනුස්සස ලෝකෙ ඉපදෙන්න හේතු වෙනවා. මේ විදියට මෙහෙන් එහාටයි, එහෙන් මෙහාටයි යන එන ක්‍රමයක් තියෙනවා.

දැන් මේ පංච දුෂ්චරිතවලින් වෙන්වීමේ ස්වභාවය නිසා ඒ උතුරුකුරු දිවයින් වැසියන් පින් දහම්වලට බොහොම කැමතියි. පිනේ ඵල විපාක ඒ අය දන්නවා. ත්‍රිහේතුක පටිසන්ධියක් සහිත උපතක් නිසා නිවන් දකින්න හේතු තිබුණත්, ඒ අයගෙ ප්‍රධාන බලාපොරොත්තුව ධ්‍යාන මග ඵල නෙවෙයි. වැඩිහරියක්ම කැමති පින් දහම් කටයුතු කරගෙන ඉන්න. ඒ නිසා ඒ අයට ප්‍රධාන වශයෙන් පිහිටල තියෙන්නෙ අපේ මනුස්සස ලෝකෙ වගේ ත්‍රිලක්ෂණය අවබෝධයට අවශ්‍ය නුවණ නෙවෙයි, තව තවත් පිං කරගන්න ඕන කියන ලෞකික අදහස. ඒ නිසා තමයි බුදුන් වහන්සේ ඇතුළු සමහර අභිඥාලාභී මහරහතන් වහන්සේලා එහේ පිණ්ඩපාතෙ වැඩල, ඒ අයට චිත්ත ප්‍රසාදය ඇති කරල පින් දහම් කරගන්න අවස්ථාව ලබා දුන්න කියල ධර්මයේ සඳහන් වෙන්නෙ. ඒ කියන්නෙ තෙරුවන් කෙරෙහි පැහැදීමත්, දන් දෙන්න ප්‍රසාදයත් ඒ අයට තියෙනවා. හුඟක් අය බුදුන් වහන්සේට ගෞරව කරන්න විවිධ ගරු වචන පවා පාවිච්චි කරනවා. ඒ අය බුදු දහමට බොහොම කැමතියි. නමුත් ඒ අයට එහේ වෙහෙර විහාර පන්සල් ආදිය නෑ. භික්ෂූන් වහන්සේලා නෑ. ඒ නිසා තමයි ඔය පියාඹන පීරිසි කියන ඒ අයගෙ යානාවලින් මෙහේ ඇවිත් බලල වන්දනාමාන කරල යන්නෙ. ඒ වගේම බුදු දහම නැති කාලෙක සෘෂි දහමට ගරු කරනවා. ඒ නිසා තමයි සෘෂිවරු ඒ අයගෙ සෘද්ධි අභිඥා බලයෙන් සමහර කාලවලට ඒ ලෝකෙට යන්නෙ. බුදුන් වහන්සේ පහළ වෙන්න පෙර අසිත තාපසතුමාත් චාතුර් මහා රාජිකය, උතුරුකුරු දිවයින වගේ තැන්වලට ගිහින් කාලයක් ඉඳල තියෙනවා.

ඒ වගේම ඒ ලෝකෙ මෙහේ වගේ ගල් යුගය, වැදි යුගය, ගොවි යුගය, නවීන යුගය ආදී වශයෙන් යුග වෙනස් වෙන්නෙ නෑ. හැම කාලෙම එකම විදියයි. මොකද අර කලින් කිව්ව වගේ විපාක ලෝකයක් තමයි ඒ අයට තියෙන්නෙ. මෙහේ වගේ සංඛාර මූලික ලෝකයක් ඒ අයට නෑ. සංඛාර මූලික වෙච්ච මේ මනුස්සස ලෝකයේ පරිවර්තන වැඩියි. මිනිස්සු විවිධාකාර දේවල් පසුපස හඹා යනවා. ඒ නිසා ජාති භේදත් මෙහේ වැඩියි. නමුත් එහේ තියෙන්නෙ පහල වෙච්ච විපාකය භුක්ති විඳගෙන ඉන්න ක්‍රමයක්. ඒ විපාකය භුක්ති විඳින්න ඒ අයටත් මෙහේ වගේ ගංගා, ඇල දොල, ගස් ගල්, උයන් වතු ආදිය තිබුණට ඒව ඔක්කොම ඒ අයගෙ පුණ්‍ය සෘද්ධියට තමයි නිර්මාණය වෙන්නෙ. ඒ කියන්නෙ අපේ තියෙන භෞතික ක්‍රම නෙවෙයි. ඒ නිසා ඒ ලෝකවල තියෙන ගස් කොළංවල අපේ ගස් කොළංවල වගේ ඉදිච්ච කොළ නෑ, දිරච්ච අතු නෑ. දළු, මල්, කොළ ඒ විදියටම පවතිනවා. ඒවායේ ගෙඩි, පළතුරු වුනත් ඒ අයගෙ පුණ්‍ය සෘද්ධියට අනුකූලව නිපදවෙලා තියෙන්නෙ. කොළ හැලෙනව කියල එහෙම එකක් දැන ගන්නත් නෑ. අපේ ලෝකවල වගේ කොළ හැලිච්ච අතු ගාන්න ඕන කියල, එහෙම සුද්ධ පවිත්‍ර කරන්න දෙයක් නෑ. එහෙම කොළ වැටීමක් නෑ.

ඒ වගේම මේ අපිට වගේ මස් ලේ කයක් ඒ අයටත් තියෙනවා. ඒ අයත් හැදෙනව, වැඩෙනව, ලොකු වෙනවා. හැබැයි අපිට වගේ වෙහෙස මහන්සි වෙලා වැඩපල කරන්න, හරි හම්බ කරන්න එහෙම ප්‍රශ්න නෑ. ආහාර පාන වුනත් පුණ්‍ය සෘද්ධියෙන්ම ලැබෙනවා. අපේ ලෝකෙ වගේ සාගත, වසංගත නෑ. ඕන කාලයක පුණ්‍ය විපාකයෙන් ආහාර පාන ලැබෙනවා. වැසිකිලි යන්න ඕන වුනත් පුණ්‍ය සෘද්ධියෙන්ම වැසිකිලි වලක් නිර්මාණය වෙනවා. සේදීම් පවිත්‍ර කිරීම් ආදියටත් පුණ්‍ය සෘද්ධියෙන්ම ජලය ලැබෙනවා. අපට වගේ වෙනම ජල කරාම හදල නාන තටාක හදල මහන්සි වෙන්න දෙයක් ඒ අයට නෑ. අවශ්‍ය වෙලාවට ජල ධාරාවක් නිර්මාණය වෙලා එනවා. එතනින් සුද්ධ පවිත්‍ර වෙලා හේදිලා යනවා. ශරීර අපවිත්‍ර වීමක් නෑ. ඒ කියන්නෙ

ශරීරයේ දාඩිය අපද්‍රව්‍ය හැදුනත්, ඒ හැදෙන කොටම පුණ්‍ය ඍද්ධියට ස්වභාවික හුළඟක් ඇවිත් අපද්‍රව්‍ය ගහගෙන යනවා. එහෙම නැත්නම් ස්වභාවික ජල ධාරාවක් ඇවිත් ඒත් එක්කම හෝදගෙන යනවා. ඒ නිසා අපවිත්‍ර වෙලා තියෙන්නෙ නෑ. ඒ තමයි විපාක ලෝකවල හැටි.

ඒ වගේම ඒ අයගෙ ආයු කාලය ගත්තොත්, උතුරුකුරු දිවයින් වැසියන්ගෙ ආයුස අවුරුදු 500 ක් බව සඳහන් වෙනවා. එතකොට ඒ අවුරුදු 500 සම්පූර්ණයෙන් ගෙවෙනව මිසක් මේ ලෝකෙ වගේ අඩු වයසින් මැරෙන්නෙ නෑ. නියම වයසම යනවා. ඒ වගේම අපේ ලෝකෙ වගේ කාලෙන් කාලෙට පරමායුෂ අඩු වැඩිවීම් වෙන්නෙත් නෑ. කොයි කාලෙටත් ආයුස එකමයි. මොකද ඒ අය පුණ්‍ය විපාකයක් ගෙවන්නෙ. අපි ඥානයෙන් අග්‍ර වුනාට ඒ අය පුණ්‍ය ඍද්ධියෙන්, සැප සම්පත්වලින් අග්‍රයි. ඉතින් අපේ මනුස්සයින්ට එහේ යන්න හිතුනට මුල් කාලවල අපේ මිනිස්සුන්ට තිබ්බ්ච පුණ්‍ය ඍද්ධි අඩු වෙලා පිරිහිච්ච කාලෙට එහේ යන්න බෑ. හේතුව දැන් මේ මිනිස්සු ගහ මරාගන්නව වගේ එහේ ගිහින් රණ්ඩු වෙන්න ගත්තොත් ඒක ධර්මයට ගලපන්න බෑ. මොකද මෙහේ අය ගියොත් ඒ ලෝක අල්ල ගන්න, දැන් මේ ගහ මරාගෙන යුද්ධ කරනව වගේ එහෙදිත් මැරකම් කරන්න පුළුවන්. ඒ නිසා ඒ වගේ දෙයක් ධර්මානුකූලව වළකිනවා.

ඒ වගේම අපේ මේ ලෝකෙ මීට වඩා බොහොම සශ්‍රීක වෙන කාලයක් එනවා. ඒ කියන්නෙ මේ අපේ තියෙන පරමායුෂ කාලයක් යද්දි අවුරුදු 500 ට වඩා වැඩිවෙලා දැනට වඩා සශ්‍රීක වෙන කාලයක් එනවා. ඒ කාලෙට අපේ මනුස්සයින්ට පුණ්‍ය ඍද්ධි වැඩියි. සැප සම්පත් වැඩියි. ඒ අතර අභිඥා ලබපු අයත් ඉන්නවා. එතකොට ඒ අභිඥාලාභී බලවලින් ඒ වගේ කාලෙකට එහේ යන්න හැකියාව තිබුණත් එහෙම ගිහින් ඉන්නෙ නෑ. මොකද ඊට වඩා මෙහේ හොඳයි. අනිත් කාරණය තමයි ඒ වගේ අය එහෙ ගියත් ඒ ලෝකෙ ලෝභකමින් අල්ල ගන්න, යුද්ද කරන්න වගේ දේකට නෙවෙයි යන්නෙ. තමන්ගෙ විවේක සුවයටත්, එහේ ඉන්න අයටත් යම්කිසි පින් දහම් කටයුතුවලට උදව් කරන්න වගේ දේකට තමයි යන්නෙ. මොකද ධ්‍යාන අභිඥාලාභීන්ට එහෙම අනුන්ගෙ දේවල් බලෙන් අල්ල ගන්න මානසිකත්වක් නෑ. ඒ නිසා මේ යෑම් ඒම් ධර්මතාවයෙන්ම පාලනය වෙනවා.

ඊළඟට අපේ මේ මනුස්ස ලෝකෙ අපිත් එක්ක විවිධ අපාගත සත්තු ඉන්නවා. නමුත් ඒ ලෝකවල එහෙම සතර අපාගත සත්තු නෑ. හුඟක් දුරට ඉන්නෙ ඒ අයගෙ කැමැත්තට, පුණ්‍ය ඍද්ධියට නිපදවා ගත්ත නිර්මිත සත්තු. සමහර ඒ ඉන්න මිනිස්සුන්ටම ඒ අයගෙ පුණ්‍ය ඍද්ධිවලින් විවිධ සතුන්ගෙ වෙස් මවා ගන්නත් පුළුවන්. එහෙම නැතිව මෙහේ වගේ තිරිසන් සංඛාර වඩල ඉපදිච්ච සත්තු එහේ නෑ. මොකද ඒ ලෝක විපාක ලෝක නිසා එහේ ඉන්නෙ ඒ අයට ගැලපෙන මිනිස්සු විතරයි. හරියට තමන්ගෙ ගෙදර වගේ. ඒක පුණ්‍ය ඍද්ධියෙන් හට ගත්තු එකක්. ඒ නිසා ඒ ලෝකය ඒ අයටම අයිතියි. වෙනම තිරිසන් සත්තු එහෙ උපදින්නෙ නෑ. ඒ වගේම මේ මනුස්ස ලෝකෙදි සතුන්ගෙ පිටේ ගිහින් පුරුදු වෙච්ච එහෙම පුරුද්දක් තිබුණ නම්, සමහර අයට අශ්වයො, අලියො වගේ ඊට අනුකූල විවිධ සත්තු පුණ්‍ය ඍද්ධියෙන් නිර්මාණය කර ගන්නත් පුළුවන්. එතකොට ඒ නිර්මිත සත්තු මෙහෙ ඉන්නව වගේ තිරිසන් සත්තු නෙවෙයි,



තිරිසන් අත්බැව් නෙවෙයි. හරියට අද කාලෙ පරිගණකවලින් විවිධ සත්තු, ඇත්ත සත්තු විදියට නිර්මාණය කරල තියෙනව වගේ. ඒ වගේ සතුන්, වාහන විදියට පාවිච්චි කරල අතුරුදන් කරන්නත් පුළුවන්. හරියට සක්විති රජෙකුට ඇතා මැවෙනව වගේ. එතකොට ඒ ඇතා තිරිසනෙක් නෙවෙයි. ඒ වගේම ආකාසෙන් යන්න පුළුවන් අශ්වයො මැවෙනවා. නමුත් තිරිසන් අශ්වයො අතර ආකාසෙන් යන්න පුළුවන් එවුන් ඉන්නෙ කොහෙද ? ඒ කියන්නෙ ඒ පුණ්‍ය ඍද්ධියෙන් හට ගත්තු නිර්මිත සත්වයින්. මේ කාරණය තවත් පැහැදිලි කළොත්,

දැන් මේ වෙස් මවා ගන්නවයි කියන කාරණය විශ්වාස කරන්න බැරි මහ අත්භූත දෙයක් නෙවෙයි. දබ්බමල්ල පුත්ත කියන්නෙ ඒ කාලෙ හිටපු අභිඥාලාභී පොඩි සාමණේර හාමුදුරු නමක්. උන් වහන්සේට විවිධාකාර අභිඥා බල තිබුණා. උන් වහන්සේ තමයි එදා හිටපු භික්ෂූන් වහන්සේලාට ආසන පනවන්න ඒ කටයුතු බුදුන් වහන්සේගෙන් ඉල්ලගෙන තනතුරක් වශයෙන් භාර ගත්තෙ. ඉතින් භික්ෂූන් වහන්සේලාත් විවිධ ආසන පනවල දෙන්න කියල ඉල්ලා හිටිනවා. උන් වහන්සේට තිබ්බ්ච ප්‍රාතිහාර්ය ශක්තිය දන්න නිසාම සමහර භික්ෂූන් වහන්සේලා, අපට ගිජ්ජකූට පර්වතය පනවන්න, අපට පූර්වාරාමය පනවන්න ආදී විවිධාකාර ක්‍රමවලින් ආසන ඉල්ලා සිටිනවා. ඉතින් ඇසිපිය ගහන මොහොතකින් ගිහින් අවශ්‍ය ආසන ඒ විදියටම ඍද්ධි බලයෙන් පනවල, ආපහු ඇවිත් ඒ ඒ භික්ෂූන් පිරිස් එකතු කරගෙන උන් වහන්සේ ඍද්ධි බලෙන්ම ඒ ඒ තැන්වලට ගෙනියනවා. උන් වහන්සේට කිසි වෙහෙස මහන්සියක් නෑ. යවන්න ඕන අය මොහොතකින් ඒ නියමිත තැන්වලට යවනවා. සමහර වෙලාවට අඳුර දිහාවට ඇඟිලි දික් කළාම ඒ ඇඟිලි තුඩුවලින් ගිනි ආලෝකයක් පිට වෙනවා. ඒ ආලෝකයෙන් හැම තැනම එළිය වෙනවා. ඒ වගේ ආලෝකය දීල ඒ පස්සෙන් එන්න කිව්වම, උන් වහන්සේගෙ ඍද්ධි බලයට අනිත් අයත් පිටිපස්සෙන් ඇදිල යනවා. එහෙම බලයක් උන් වහන්සේට තිබුණා. එතකොට මේ අපේ මනුස්ස ලෝකෙ මස් ලේ කයක් තිබ්බ්ච අයටත් එහෙම ඍද්ධි බල තිබුණ නම්, පුණ්‍ය ඍද්ධි පහළ වෙච්ච විපාක ලෝකවල ඉන්න මනුස්සයින්ට ඒ වගේ ඍද්ධි බලවලින් වැඩ කටයුතු කරගන්න එක සාමාන්‍ය දෙයක්. මොකද ඒ විපාක ලෝකවල ස්වභාවයත් එහෙමයි.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, ඔච්චර පුණ්‍ය ඍද්ධි, සැප සම්පත් තියෙන ඒ ලෝකෙ මිනිස්සුන්ගෙ මුහුණු, දැක්කම බය හිතෙන විරූපි ස්වභාවයන්ගෙන් පිහිටල තියෙන්නෙ ඇයි කියල. නමුත් ඒ අපට පේන හැටි. මොකද අපිට පේන්නෙ නියම කායික ස්වරූපයෙන් නෙවෙයි. එහේ ඉඳන් මේ ලෝකෙට එන අතරතුර සමහර තැන්වල වායුව නැති තැන් තියෙනවා. එතකොට ඒ වගේ තැන්වලින් එනකොට ශරීරයට අවශ්‍ය වායුව අවශෝෂණය කර ගන්න ක්‍රමවේදයක් තියෙන්න ඕන, හුස්ම ගන්න ක්‍රමයක් තියෙන්න ඕන. ඒ නිසා ඒ සඳහා ඒ අයට පුණ්‍ය ඍද්ධියෙන්ම අවශ්‍ය ඇඳුම් ආයිත්තම් නිර්මාණය වෙලා එනවා. ඒ වගේම කයත් ඊට අනුව පරිවර්තනය කරගන්න පුළුවන්. එතකොට ඒ පිටින් දාගෙන ඉන්න ආරක්ෂිත ඇඳුම තමයි අපිට පේන්නෙ. උදාහරණ විදියට අපේ මිනිස්සු අභ්‍යවකාශ තරණයන්ට යන කොට ඔළුවත් ලොකුවට වහගෙන, රොබෝ

කෙනෙක් වගේ ඒකට සුදුසු ඇඳුමක් ඇඳගෙන තමයි යන්නෙ. එතකොට පිටින් බැලුවම අපේ මිනිස්සුන් අඳුන ගන්න බෑ. අන්න ඒ වගේ තමයි ඒ අයත් බාහිර උපද්‍රවයන්ගෙන් වැළකිලා ඉන්න ආරක්ෂිත ඇඳුම් කට්ටලයකින් තමයි එන්නෙ. එතකොට ශරීරයත් ඒ විදියට හැඩ ගැහෙනවා.

නමුත් ඔය පිටින් තියෙන ඇඳුම නැතිව බැලුවොත්, **ඒ අය අපේ ලෝකෙ ඉන්න ලස්සන පුංචි ළමයි වගේ. අඩි 4 කට වැඩිය උස නෑ. බොහොම පැහැපත් මෘදු ශරීර තියෙන්නෙ. හරියට දිව්‍යමය ස්වභාවයක්.** ඒත් අර පිටින් තියෙන ඇඳුම නිසා තමයි අපට විකෘතියට පේන්නෙ. ඒ ඇඳුමත් කයටම ඇඳිලා තියෙන විදියට අච්චුවක් වගේ තමයි පුණ්‍ය සෘද්ධියෙන්ම පිහිටන්නෙ. මෙහේ එනකොට ඇති වෙන පරිවර්තනවලට බාධක නොවෙන්න තමයි ඒ වගේ ඇඳුමක් තියෙන්නෙ. ඒ ඇස් පවා විශාල කුහර වගේ පිටට පෙනුනට ඇත්තටම ඇස් නෙවෙයි. පිට ඇඳුමෙ ස්වභාවය. හරියට අපේ මිනිස්සු දිය යට කිමිදීම් ආදී කටයුතුවලට යන කොට විවිධ හැඩතල තියෙන කණ්ණාඩි දාගෙන ඉන්නව වගේ.

දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන් ඔය කියන විදියෙ පුණ්‍ය සෘද්ධි තියෙන මනුස්ස ලෝකයක් නම්, ඒකෙ තියෙන දුක මොකක්ද කියල. මෙතනදි ලෝක ස්වභාවයෙන් යමෙක් උපන්න නම් ඉපදිලා පවතින කාලයක් එනවා. ඊළඟට ඒ කාලය අවසන් වෙන මොහොතක් එනවා. ඒ අතර තුර විපරිණාමය හෙවත් කැමැත්තට අනුව පරිණාමය නොවීම නිසා ඇති වන දුක ඒ ලෝකවලටත් පොදුයි. ඒ වගේම මස් ලේ කයක් නිසා කයට දැනෙන බඩගිනි, පිපාසය, වෙනත් ශාරීරික අවශ්‍යතාවයන්, වේදනා කැක්කුම් ආදියත් ඒ ඒ මට්ටම්වලින් පොදුවේ තියෙනවා. ඔය අතරෙදි කර්ම විපාකයක් ආවොත් ලෙඩ රෝග හැදෙන්නත් පුළුවන්. හැබැයි ඒ බොහොම කලාතුරකින්. මොකද ඒ සඳහා බාහිර පරිසරයක් නැති නිසා, සමනන්තරයක් නැති නිසා අනන්තරයක් ඇදිල එන්න විදියක් නෑ. ඒ නිසා ලෙඩ රෝග බොහොම අඩුයි. මොකද සමනන්තරය හැදිල තියෙන්නෙ පුණ්‍ය සෘද්ධියෙන්මයි. ඒ නිසා වයසට යාමත්, මරණයත් තමයි ප්‍රධාන. හැබැයි වයසට යනවයි කියල අපේ මිනිස්සු වගේ කෙසේ පැහිල, දත් වැටිල, ඇඟ රැළි වැටිල වැහැරිලා යන්නෙ නෑ. වයසට යාම දැනෙන්නෙ අවසන් කාල සීමාවෙදි. ඊට පස්සෙ හිටි ගමන් මැරිල යන එක තමයි වෙන්නෙ. ඒ නිසා ආයුස ඉවර වෙනකල් නිරෝගීව ප්‍රබෝධමත්ව ඉන්නවා. ශරීරය පිටින් බලල වැඩිහිටි වයස් ගත වෙච්ච අය හොයාගන්න බෑ. ඔක්කොගෙම ශරීර එක වගේ. වයසක් හොයන්නත් බෑ. හරියට දේව ලෝකවල වගේම පුණ්‍ය සෘද්ධියක් තියෙන්නෙ. අන්තිමට ආයු කාලය ඉවර වෙන කොට මොන පුණ්‍ය සෘද්ධිය තිබුණත් වැඩක් නෑ, මහා භය හෙවත් මරණ භය එනවා. එදාට දාල යන්න වෙනවා. නැවත කොහේ ගිහින් උපදියිද කියන්න දන්නෙත් නෑ. සමහර විට අපායට යන්නත් පුළුවන්. ඒ නිසා **මේ පුණ්‍ය සෘද්ධි තියෙන විපාක ලෝක කියන්නෙ, දුක් සංඥාව අහක් වෙච්ච තැනක් නෙවෙයි.**

ඒ වගේම ඒ ලෝකෙ මැරිච්ච මිනිස්සු ගිහින් දාන සොහොනක් තියෙනවා. ඒකට දැම්මම විශාල වායු සුළියක් ඇවිත් ඒ මළ මිනී ඒ සීමාවෙන් ගසාගෙන ගිහින් උතුරුකුරු දිවයින වටා තියෙන ස්වර්ණ මුහුද කියන සාගරයට වැටෙනවා. එතනින් ඒව හිමාලය වගේ ස්ථානවලට විසි කරනවා. හිමාල කියන්නෙ දැන් කියන හිමාල කන්දම නෙවෙයි. හිම ඇලිල කඳු වශයෙන් සකස් වෙච්ච තවත් ස්ථානත් ඒකට අහු වෙනවා. ඊළඟට එහේ ඉන්න ගිජු ලිහිණියන්ට අහු වුනාම ඒව කනවා. එහෙම නැත්නම් ඒ මළ මිනී අපේ මේ සාගරයටත් පාවෙලා එන්න පුළුවන්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණු දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 26 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** ♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ රාජ් නිල්මිණි විජේවික්‍රම මහතා - ගොඩගම ♦ චිත්‍ර ශිල්පී එස්. එම්. ජයසේකර මහතා - මාලබේ ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායකවූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** ♦සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා - මහනුවර- රු. 6,000/- ♦ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු.5,000/- ♦ තරින්යා ලංකේශ්වර දියණිය ඇතුළු පවුලේ සැම - නෙළුව- රු. 5,000/- ♦ චරිත් ඉන්දික මහතා - ඉතාලිය - රු. 5,000/- ♦ පුෂ්පික ගයාන් ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා - ගල්කිස්ස - රු. 5,000/- ♦ ඔස්ටින් ප්‍රනාන්දු මහතා සහ සිසිර සිරිවර්ධන මහතා - පොල්ගහවෙල - රු. 5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනෙවිය - මහරගම - රු. 5,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ නන්ද සුදුසිංහ මහතා ඇතුළු පවුලේ සැම - පානදුර - රු. 2,500/- ♦නලින් සේකර මහතා සහ ඩබ්. ප්‍රේමවතී මහත්මිය - වළල්ලාවිට - රු. 2,500/- ♦ මානෙල් කටුගම්පොළ මහත්මිය - මහරගම - රු. 2,000/- ♦ කෝෂලා සිරිවර්ධන මෙනෙවිය - ගාල්ල - රු. 2,000/- ♦ සනත් පියසේන මහතා - මීගමුව - 2,000/- ♦ කේ. රත්නා චාන්දනී මහත්මිය ඇතුළු පවුලේ සැම - ඉතාලිය - රු. 2,000/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය - රු. 1,500/- ♦ මධුභානි කළුවැව මහත්මිය - මාලබේ - රු. 1,500/-♦ දමයන්ති ලියනගේ මහත්මිය - දෙල්කඳ - රු. 1,350/- ♦ අස්විනි දසනායක දියණිය ඇතුළු පවුලේ සැම - පිළියන්දල - රු. 1300/- ♦ ලතා වාහලතන්ත්‍රී මහත්මිය - පිටිපන - රු. 1,000/- ♦ කේ.ඒ.උපාලි ජිනදාස මහතා - ගැටහැත්ත - රු. 1,000/- ♦ ඉන්ද්‍රානි විශාකා ජයසිංහ මහත්මිය- බොරලැස්ගමුව - රු. 1,000/- ♦ දිළීශා වික්‍රමසිංහ මෙනවිය ඇතුළු පවුලේ සැම - නාවල - රු. 1,000/- ♦එච්.පී. විජේරත්න මහතා - කිරුළපන - රු. 1,000/- ♦ කේ.ඩී. ගීතා ගුණවතී මහත්මිය - පාදුක්ක - රු.1,000/- ♦ ජී.ඩී.එස්. රණසිංහ මහතා - ඕමාන් - රු. 1,000/- ♦ එස්. ඩී. පුණ්‍යවතී මහත්මිය - පිළියන්දල - රු. 1,000/- ♦ බී.කේ. විශාඛා රංජනී මහත්මිය ඇතුළු පවුලේ සැම - මහරගම - රු.1,000/- ♦ නදුල අබේසිංහ මහතා - තිහගොඩ - රු.1,000/- ♦ රසික ජයලත් මහතා ඇතුළු පවුලේ සැම - පොල්ගස්ඕවිට - රු.1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා-කුරුණෑගල - රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1,000/- ♦ නදීශා හර්ෂනී ලියනගේ මෙනෙවිය - කළුබෝවිල - රු. 1,000/-

♦ කේ. අමරතිලක මහත්මිය - මහරගම - රු. 1,000/- ♦ චොෂිත හෙට්ටිආරච්චි මහතා - දෙහිවල - රු. 1,000/- ♦ ශමීන් බණ්ඩාර මහතා - උඩුබැද්දෑව - රු. 1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ අචිර ලංකේෂ්වර පුතා ඇතුළු පවුලේ සැම - පානදුර - රු.1,000/- ♦ අනුරුද්ධ පෙරේරා මහතා - කිරුළපන - රු.1,000/- ♦ වීණා අතුකෝරාල මහත්මිය, ජනිඳු බිම්සර පුතා ඇතුළු පවුලේ සැම - නෙළුව - රු.1,000/- ♦ රොෂිකා ප්‍රේමරත්න මහත්මිය සහ පැතුම් ලොකුවිතාන මහතා - කඩවත - රු.1,000/- ♦ ප්‍රේමා ගීකියනගේ මහත්මිය සහ නිශාන්ත තිලකරත්න පුතා - හොරණ - රු.1,000/- ♦ දිස්නා රණසිංහ මහත්මිය- වල්පොල - රු.1,000/- ♦ විනීතා කැකුළාවල මහත්මිය - මීරිගම - රු.1,000/- ♦ එම්.සේනානායක මහත්මිය - ජාඇල - රු. 1,000/- ♦ චන්ද්‍රා රත්නායක මහත්මිය - රාජගිරිය - රු.1,000/- ♦ නුවන් යාපා අමරසේකර මහතා -රදාවාන - රු.1,000/- ♦ එච්. ලීලාවතී මහත්මිය - දෙහිඅත්තකණ්ඩිය - රු.1,000/- ♦ ඩබ්. විලියම් මහතා - දෙහිඅත්තකණ්ඩිය - රු. 1,000/- ♦ එච්.ඒ. ගුණවතී මහත්මිය ඇතුළු පවුලේ සැම - පිටිපන - රු. 1,000/- ♦ නිරෝෂ් සපරමාදු මහතා - කොච්චිකඩේ - රු. 1,000/- ♦ සුජාන් කරස්නාගොඩ මහතා - ගම්පහ - රු. 1,000/- ♦ එස්. ප්‍රසන්න සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ නදුන් ලංකේශ්වර පුතා - රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල - රු. 1,000/- ♦ රදාවාන පිංවත් පිරිස - රු.1,000/- ♦ රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය, සුභාෂිනී දිසානායක මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, චතුර මල්වාන මහතා - කෑගල්ල, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැළණිය, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, ඩී.එම්. එල්. පුෂ්පකුමාර මහතා - වාරියපොල, නන්දනී එදුස්සූරිය මහත්මිය - අත්තිඩිය, අනුරුද්ධ ඉද්දවෙල මහතා - කඩවත, සරත් නිශාන්ත මහතා - නෙළුව, සිරිතුංග දෙළුම්දෙණිය මහතා - බෙන්තොට, කාවින්දි උපේක්ෂා ද සිල්වා මෙනවිය - නාවල - රු. 9,200/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 124,350/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦ අනෙකුත් වියදම් - 11,710/- ♦ සම්පූර්ණ වියදම - රු. 244,210/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**

**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org

විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අං:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථාන:

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල.
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ටිටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
6. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
7. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
8. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
9. සමනල පොත්හල - නෙළුව.
10. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
11. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
12. කේ. පී. ස්ටෝර්ස් - ගන්තුන, කෑගල්ල.
13. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (077 7577592)
14. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (077 2292677 / 071 4406928)

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***



# නැත කිසි බේදා කඳුලක් ආ දා.....



නෙක දුක් කරදරද බාධක දැනෙන          අත
එක ලෙස පිට කරයි වෙනසක ලකුණු          නැත
නිකමට කියා නොබලයි ලොකු පොඩ්ඩ          සත
දැක ගත හැකිය කඳුලක් හැම සතගෙ          නෙත

අපා දෙපා සිවුපා බහුපා          බේදේ
නොපා සිටින කඳුළැලි සැමගේ          සෑදේ
කපා නොදැමුවොත් සසරෙහි          ආබාදේ
එපා නොවී කඳුළැලි සැම දා          පීදේ

ලොකුකම් කළත් නෙක නෙක තැන්වලට          වෙලා
නැති නම් දුකක් හඬ දෙනවද කඳුළු          සලා
කළ කම් ඇවිත් එල දෙන විට තැන          නොබලා
ගැලවුම් නැතිව යයි කඳුළින් සැවොම          තලා

නෙත් තියෙන කල් සසරෙහි එන කඳුළු          කැට
සත් වග සැමට වැගිරෙයි තුන් දොසට          බට
සිත්වල බැඳී කෙළෙස් මළ පිට කරන          කොට
අත් වෙන කඳුළු බිඳු දුක මිස නොමැත          තුට

කලා රසක් ලෙස ගෙන කඳුළැලි          බින්දු
පෙළා දුකින් සමහරු කියනව          සින්දු
බලා ඉන්න උදවිය ගොනුනට          ඇන්දු
මුලා කළ එවුන් වෙයි සසරට          බන්දු

මේ හැම ලෝ සතුන් සසරෙහි විඳපු          දුක
වාවනු ගත නොහී වගුරපු කඳුළු          නෙක
සාගර ජලය සසඳනු බැහැ බොහොම          ටික
ඒ ලෙස බලා උපමා ගනු දහම          දැක

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



# පිට ඔපයට රැවටීම

පිට ඔපයෙන් වට කොට ඇති නොයෙකී
රට රටවල ඇති සතුටැති සෙයකී
හෙට ගැන නොසිතා පිනවන දෙයකී
පොට වැරදී යයි එම සත වියැකී

සා ගිනි නිවනට ඇති අහරය මිස
පෑ පිට ඔපයෙන් පිරවෙනවද කුස
කාසිය විසි කරලා ගිය තැන ඇස
දාහය මිස ලැබුවේ කවුරුද තොස

ඔපයෙන් වැඩි දේ පසු පස පන්නා
මිලයෙන් වැඩි කාසිය විසි වන්නා
මොළයෙන් අඩු ඒ ලෝ සත යන්නා
භවයෙන් භවයට අවිදුව එන්නා

එකම දෙයක් නෙක නෙක ලෙස පොරවා
පෙනුම රවට්ටන ලෙස ඇස පුරවා
පුදුම හිතෙන විදියට නිම කරවා
ලොවම ගනියි එක තැනකට හරවා

හොඳ සිහියෙන් බැලුවොත් පිට ඔපයා
මඳකුත් කිම පිට ඔපයට උපයා
ලද හොත් ඉතිරිය දනකට සපයා
නිදහස් සුවයක් දෙන විට සැපයා

දිනකට නිකරුණේ වැනසෙන ධනය
දනකට යෙදුවොත් ඇතිවන පිනය
සිතකට ඇවිදින් පැහැදෙන ගුණය
සැණෙකට නොව මතු සැනසෙන තැනය

අන්දන තරමක් තිබුණද ලෝකේ
බන්දන තරමට ඇයි ද අනේකේ
නන් දන රැවටී බැඳුනද කෝකේ
ඉන් දෙන දාහෙන් නොගනිනු සෝකේ

දහසක් වැඩ කළ හැකි මිල මුදලා
මොහොතක් සැනසෙන වැඩකට යොදලා
පහසක් නොම ගෙන මෙත සිත හදලා
සග මොක් සැප ගනු සසුනට පුදලා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.